# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2020

**පරිසර අමාත්‍යාංශය**

# පරිසර අමාත්‍යාංශය

ගරු මහින්ද අමරවීර මැතිතුමා

පරිසර අමාත්‍ය

# අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන්

වෛද්‍ය අනිල් ජාසිංහ මහතා
ලේකම්

ආර් ඒ ආර් ආර් රූපසිංහ මහතා
අතිරේක ලේකම් - පාලන

ඩබ් ජී ඩබ් එම් ඩබ් ටී බී දිසානායක මහතා
අතිරේක ලේකම් - පරිසර ප්‍රතිපත්ති

ඩබ් ඩී එස් සී වැලිවත්ත මහතා
අතිරේක ලේකම් - ස්වභාවික සම්පත්

පී මුදලිගේ මහතා
අධ්‍යක්ෂ ජනරාල් - ක්‍රමසම්පාදන

ඒ එච් එල් ඩී ගාමිණී විජේසිංහ මහතා
අතිරේක ලේකම් - පරිසර ව්‍යාපෘති අධ්‍යාපන පුහුණු

කේ ඒ අයි ඩී සිල්වා මහතා
අතිරේක ලේකම් - පරිසර සංවර්ධන

# අමාත්‍යාංශයට අයත් රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන

| | |
|---|---|
| මධ්‍යම පරිසර අධිකාරිය | - එස් අමරසිංහ මහතා, සභාපති<br>- පී බී හේමන්ත ජයසිංහ මහතා, අධ්‍යක්ෂ ජනරාල් |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | - අනුර වල්පොල මහතා, සභාපති<br>- ඉංජි සජ්ජන ද සිල්වා මහතා, අධ්‍යක්ෂ ජනරාල් |
| සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම | - ආර් එම් එස් ප්‍රියන්ත කුමාර රත්නායක මහතා ප්‍රධාන විධායක නිලධාරි |
| ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට් ) ලිමිටඩ් | - ජී ඒ එම් සී ආරියතිලක මහතා ප්‍රධාන විධායක නිලධාරි |

| | පටුන | පිටු අංක |
|---|---|---|
| 1. | පළමු කොටස | |
| 1.1 | හැඳින්වීම | 01 |
| 1.2 | අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 02 |
| 1.3 | ප්‍රධාන කාර්යයන් | 03 |
| 1.4 | සංවිධාන සටහන | 04 |
| 1.5 | අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන | 05 |
| 1.6 | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු/ ආයතනය යටතේ පවතින අරමුදල් | 05 |
| 1.7 | විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු | 05 |
| 2. | දෙවන කොටස - ප්‍රගතිය | 07 |
| 2.1 | පරිසර අමාත්‍යාංශයේ එක් එක් අංශ මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වල ප්‍රගතිය | 07 |
| 2.1.1 | ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව සංරක්ෂණය | 07 |
| 2.1.2 | දේශගුණික විපර්යාස අභියෝග ජයගැනීම | 09 |
| 2.1.3 | වායු සම්පත් කළමනාකරණය | 10 |
| 2.1.4 | පරිසර සැලසුම් හා ආර්ථික | 11 |
| 2.1.5 | පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණය | 13 |
| 2.1.6 | භූමි සම්පත් සංරක්ෂණය | 14 |
| 2.1.7 | පරිසර අධ්‍යාපන හා දැණුවත්කිරීම් | 14 |
| 2.1.8 | අන්තර්ජාතික පාරිසරික සබඳතා | 18 |
| 2.1.9 | පාරිසරික දින සැමරීම | 20 |
| 2.1.10 | ආයතනික කටයුතු | 22 |
| 2.1.11 | අභ්‍යන්තර විගණන | 22 |
| 2.1.12 | විමර්ශන | 22 |
| 2.2 | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය | 23 |
| 2.2.1 | මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය | 23 |
| 2.2.2 | පාරිසරික සංවේදී භූමි ප්‍රදේශ වල ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ (ESA) ව්‍යාපෘතිය | 25 |
| 2.2.3 | පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කලමනාකරණය හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය | 27 |
| 2.2.4 | මිනමාටා සම්මුතිය යටතේ "රසදිය මූලික තක්සේරු වාර්තාව" පිළිබඳ ව්‍යාපෘතිය | 28 |
| 2.2.5 | මධ්‍යම කඳුකරයේ හායනයට පත් වූ කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 29 |
| 2.2.6 | ශ්‍රී ලංකා තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම | 30 |
| 2.2.7 | ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීමේ ව්‍යාපෘතිය (SLTNC) | 31 |
| 2.2.8 | දේශගුණික විපර්යාස අවම කිරීමේ හවුල්කාරිත්ව ව්‍යාපෘතිය | 32 |
| 2.2.9 | ගෝලීය පාරිසරික පහසුකම යටතේ පවතින එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැළැක්වීමේ සම්මුතියට අදාල ජාතික වාර්තාකරණ ක්‍රියාවලිය | 33 |
| 2.2.10 | ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ කාර්ටජිනා සන්ධානයට අනුගතව ජාතික ජෛව සුරක්ෂිතතා රාමුව ක්‍රියාත්මක කිරීම | 34 |

පිටු අංක


| | | | |
|---|---|---|---|
| | 2.3 | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනවල ප්‍රගතිය | 35 |
| | 2.3.1 | මධ්‍යම පරිසර අධිකාරිය | 35 |
| | 2.3.2 | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 40 |
| | 2.3.3 | ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම | 45 |
| | 2.3.4 | ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ් | 49 |
| **3.** | | **තුන්වන පරිච්ඡේදය -** වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 51 |
| | 3.1 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 51 |
| | 3.3 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 53 |
| | 3.4 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 54 |
| | 3.5 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 55 |
| | 3.6 | ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 55 |
| | 3.7 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | 56 |
| | 3.8 | මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 56 |
| | 3.9 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 56 |
| | 3.10 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 57 |
| **4.** | | **හතරවන පරිච්ඡේදය -** කාර්ය සාධන දර්ශක | 68 |
| | 4.1 | ආයතනයේ කාර්ය සාධන දර්ශක | 68 |
| **5.** | | **පස්වන පරිච්ඡේදය -** තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 68 |
| | 5.1 | හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු | 68 |
| | 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 69 |
| **6.** | | **හයවන පරිච්ඡේදය -** මානව සම්පත් පැතිකඩ | 69 |
| | 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 69 |
| | 6.2 | ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි | 69 |
| | 6.3 | මානව සම්පත් සංවර්ධනය | 70 |
| **7.** | | **හත්වන පරිච්ඡේදය** – අනුකූලතා වාර්තාව | 71 |

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද අංක 2187/27 දරණ 2020.08.09 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය හා අංක 2196/27 දරණ 2020.10.06 දිනැති අති විශේෂ සංශෝධිත ගැසට් නිවේදනය අනුව **"පරිසර අමාත්‍යාංශය"** පිහිටුවන ලදි. **මෙම අමාත්‍යාංශයට තිරසර සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය හා ස්වභාවික සෞන්දර්ය රැක ගනිමින් ස්වභාවික සම්පත් පරිහරණය කිරීම මෙන්ම වන, වෘක්ෂලතා, වෙරළ, වගුරු බිම්, ඇළ, දොළ, ගංගා හා වන ජීවීන් ආරක්ෂා කිරීම, කැළිකසළ වළක්වා ගැනීම හා ඉවත් කිරීම, පිරිසිදු නේවාසික පරිසරයක් හා තිරසර ආර්ථික සංවර්ධනයකට ගැලපෙන පරිදි පරිසර ප්‍රතිපත්ති හා ආයතනවලට අදාළ කටයුතු සිදු කිරීමේ කාර්යයන් පවරා ඇත. වර්තමානය වන විට පරිසර අමාත්‍යධුරය ගරු මහින්ද අමරවීර මැතිතුමා විසින් හොබවනු ඇත.**

"සෞභාග්‍යයේ දැක්ම" නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අනෙකුත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "තිරසර පරිසරයක් " නිර්මාණය කිරීම සඳහා නීති සහ අණපනත්වලට අනුකූලව පරිසර විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන ප්‍රමුඛ කාර්යයන් සඳහා **පරිසර අමාත්‍යාංශය** නායකත්වය සැපයීම සිදු කරණු ලබයි.

තවද

1. තිරසර පරිසර සංකල්පය, පාසැල් අධ්‍යාපනයේ සිට ප්‍රජාව තුළ ආකල්පමය වශයෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
2. පරිසර ආශ්‍රිත බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සමාලෝචනයට ලක් කොට පරිසර හිතකාමී මෙන්ම ජනතා හිතකාමී ලෙස එම ක්‍රියාවලිය මෙහෙයවීම සරල කිරීම.
3. පරිසර හිතකාමී නිෂ්පාදන, බෙදාහැරීම, ප්‍රවාහන සේවා, යටිතල පහසුකම්, නාගරික සංවර්ධන සහ ආයෝජන හා ආර්ථික කලාප කටයුතු මෙහෙයවීමේ දී ව්‍යාපාරික හා සංවර්ධන අවශ්‍යතා තිරසර සංවර්ධන ඉලක්ක සමඟ තුලනය කිරීම.
4. පරිසර සංරක්ෂණය සඳහා නවීන දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීම.

යන සුවිශේෂී ප්‍රමුඛතාවයන් ඔස්සේ පරිසර හිතකාමී මහජන සේවයක් ලබාදීම ප්‍රමුඛ කාර්යය වේ.



ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම හා ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතන සමග පරිසර අමාත්‍යාංශය රටෙහි ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වේගවත්වීමත්, ජනතාවගේ ජීවන ක්‍රමය වෙනස්වීමත්, හේතුවෙන් පරිසරයට ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයේම ආයතනික, නෛතික හා තාක්ෂණික රාමුව ශක්තිමත් කරමින් ජනතාවගේ ජීවන තත්ත්වය තිරසරව හා සකසුරුවම්ව ගොඩනැංවීම සඳහා සුවිශේෂී කාර්යයක් ඉටුකරයි.

මෙම වාර්තාව මගින් පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන, අමාත්‍යාංශයේ සියළු අංශ හා ව්‍යාපෘති මගින් 2020 වර්ෂයේදී සිදු කරණ ලද සංවර්ධන හා සංරක්ෂණ කාර්යය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

## 1.2 ආයතනයේ දැක්ම හා මෙහෙවර

**අමාත්‍යාංශයේ දැක්ම**

**"තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්"**

**අමාත්‍යාංශයේ මෙහෙවර**

තිරසර ස්වාභාවික සම්පත් කළමනාකරණය තුළින් පරිසර ආරක්ෂණය තහවුරු කරමින් තිරසර පරිසර කළමනාකරණය සඳහා නායකත්වය ලබාදීම.

## 1.3 පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්:

⇒ තිරසර සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා උපයෝගී කර ගැනීම පිණිස පාර්ශවකරුවන්ගේ සහාගිත්වයෙන් පරිසර හා ස්වාභාවික සම්පත් ක්ෂේත්‍ර තුළ ඇති ගැටලු හඳුනා ගැනීම හා විශ්ලේෂණය කිරීම.

⇒ පරිසර හා ස්වාභාවික සම්පත් සංරක්ෂණයට සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අදාළ පාර්ශ්වකරුවන්ට දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.

⇒ පරිසර හා ස්වාභාවික සම්පත්වලට අනුකූල වූ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි උපායමාර්ග හා ක්‍රියාකාරී සැළසුම් පිළියෙළ කිරීම හා නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

⇒ පරිසර හා ස්වාභාවික සම්පත් වලට අදාල ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සහ තිරසර පරිසර සංකල්පය මෙන්ම වෙනත් ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමෙන් ජනතාව දැනුවත් කිරීම.

⇒ ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශ්වික පාරිසරික සම්මුතීන්ට අනුකූලව ශ්‍රී ලංකාව විසින් ඉටුකළ යුතු ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම.

⇒ පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාළ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම හා පසු විපරමෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායයන් යෙදීම.

⇒ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, එම තොරතුරු විශ්ලේෂණය කිරීම සහ එම තොරතුරු මහජනතාව ඇතුළු අදාළ අංශ වලට යොමු කිරීම.

⇒ යහපත් වූ පරිසර කළමනාකරණයක් සඳහා රාජ්‍ය රාජ්‍ය නොවන අංශවල හා මහජනතාවගේ කැපවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

## 1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන - පරිසර අමාත්‍යාංශය



1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන :

- මධ්‍යම පරිසර අධිකාරිය
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
- සීමාසහිත GSMB තාක්ෂණික සේවා
- ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට් ) ලිමිටඩ්

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු/ ආයතනය යටතේ පවතින අරමුදල් - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම | **1. මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරුකරවීමේ ව්‍යාපෘතිය** |
| ආ) දායක නියෝජිතායතනය | **අනුහුරු කිරීමේ අරමුදල** |
| ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු.මි **1164.67 (exchange rate 130.9)** |
| ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව | 2014-2020 |

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම | **2. පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය** |
| ආ) දායක නියෝජිතායතනය | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන UNDP |
| ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු. මි.387.30 |
| ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව | 2015-2020 |

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම | 3. **පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කලමනාකරණය හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය** |
| ආ) දායක නියෝජිතායතනය | එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය UNIDO |
| ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු. මි.685.10 |
| ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව | 2016-2020 |

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම | **4.මිනමාටා සම්මුතිය යටතේ " රසදිය මූලික තක්සේරු වාර්තාව පිලිබඳ ව්‍යාපෘතිය** |
| ආ) දායක නියෝජිතායතනය | එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය UNIDO |
| ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු. මි.12 |
| ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව | 2016 –2021 |

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම | **5. පරිහානියට පත් කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය** |
| ආ) දායක නියෝජිතායතනය | ආහාර කෘෂිකර්ම සංවිධානය FAO |
| ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු. මි. 227 |
| ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව | 2016-2021 |

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම | **6. ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම** |
| ආ) දායක නියෝජිතායතනය | බහුපාර්ශවික අරමුදල MLF |
| ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු. මි. 30 |
| ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව | වාර්ෂික වැඩසටහනකි |

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම | **7. ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාස පිළිබද තෙවන ජාතික සංනිවේදන වාර්තාව සකස්කිරිමේ ව්‍යාපෘතිය** |
| ආ) දායක නියෝජිතායතනය | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහව UNDP |
| ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු. මි.75 |
| ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව | 2016-2020 |

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම | **8. දේශගුණ විපර්යාස අවම කිරීමේ හවුල්කාරිත්ව ව්‍යාපෘතිය** |
| ආ) දායක නියෝජිතායතනය | ලෝක බැංකුව WB |
| ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | ඇ.ඩො.මි 1.8 |
| ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව | 2020—2021 |

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම | **9. එක්සත් ජාතින්ගේ කාන්තාරීකරනය පිටුදැකීමේ සම්මුතියේ වාර්තාකරණ ව්‍යාපෘතිය** |
| ආ) දායක නියෝජිතායතනය | එක්සත් ජාතින්ගේ කාන්තාරීකරනය පිටුදැකීමේ සම්මුතියේ ලේකම් කාර්යාලය |
| ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු. මි.11.5 |
| ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව | 2019-2021 |

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම | **10. ජෛව සුරක්ෂිතතාවය පිළිබද කාටජිනා සංධානයට අනුකූලව ජාතික ජෛව සුරක්ෂිතතාවය පිළිබද කාර්ය රාම්ව ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය** |
| ආ) දායක නියෝජිතායතනය | ආහාර කෘෂිකර්ම සංවිධානය FAO |
| ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | ඇ.ඩො. 2,365,964 |
| ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව | 2016—2020 |

# 02 පරිච්ඡේදය – ප්‍රගතිය

## 2.1 පරිසර අමාත්‍යාංශයේ එක් එක් අංශ මගින් සිදු කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය

### 2.1.1 ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව සංරක්ෂණය

**යාවත්කාලීන කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික රතු දත්ත ලේඛණයේ ශාක කොටස - 2020**
**ශාක පිළිබඳ සංරක්ෂණ තත්ත්වය**

ජෛවවිවිධත්ව අංශය, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ජාතික ශාකාගාරය හා එක්ව ශාක පිළිබඳ සංරක්ෂණ තත්ත්වය විශ්ලේෂණය කර, ජාතික රතු දත්ත ලේඛණයේ ශාඛ ලේඛණය යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කරන ලදී.

**ජාතික රතු දත්ත ලේඛණය යාවත්කාලීන කිරීම සඳහා මිරිදිය මසුන්ගේ හා පක්ෂීන්ගේ තර්ජිත තත්ත්වය ඇගයීම**

ජෛවවිවිධත්ව අංශය ලෝක සංරක්ෂණ සංගමයේ (IUCN) ශ්‍රී ලංකා කාර්යාලයේ මිරිදිය ජෛවවිවිධත්ව ඒකකය, ගෝලීය IUCN විශේෂ සංරක්ෂණ වැඩසටහන මෙන්ම පරිසර අමාත්‍යාංශය මගින් පත්කරන ලද ජාතික මිරිදිය මත්ස්‍යය විද්වත් මණ්ඩලයේ තාක්ෂණික සහාය ඇතිව ජාතික රතු දත්ත ලේඛණයේ ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන්ගේ තර්ජිත තත්ත්වය ඇගයීම සිදු කර ප්‍රකාශයට පත් කරන ලදී. මෙමගින් IUCN ගෝලීය මිරිදිය මසුන්ගේ රතු දත්ත ලැයිස්තුවද යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. මෙම ඇගැයීමේදී, ලෝක සංරක්ෂණ සංගමයේ කාණ්ඩ හා නිර්ණායක භාවිතයෙන් මිරිදිය මත්ස්‍ය විශේෂ 97 ක් ඇගැයීමට ලක් වූ අතර එම එක් එක් විශේෂවලට මේ වනවිට පවතින තර්ජිත තත්ත්වය ප්‍රකාශයට පත් කරන ලදී.




ජාතික රතු දත්ත ලැයිස්තුවේ පක්ෂි ඇගැයීමේ ක්‍රියාවලියේ කටයුතු ද ජෛවවිවිධත්ව අංශය මගින් සිදු කරමින් පවතී.

**ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ පිළිබඳ විශේෂඥ කමිටු රැස්වීම**

ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ (Invasive Alien Species) දිවයිනේ ස්වාභාවික (භෞමික, ජලජ හා සමුද්‍ර) හා කෘෂි-පාරිසරික පද්ධති කෙරෙහි තර්ජනයක් වෙමින් ජෛවවිවිධත්වයට හා ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපෑම් ඇති කරන බව හඳුනා ගෙන ඇත.

ජාතික ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ පිළිබඳ විශේෂඥ කමිටු රැස්වීම 2020.03.11 වන දින පරිසර අමාත්‍යාංශයේදී පවත්වන ලද අතර එහිදී ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ මගින් ඇතිව තිබෙන ගැටළු හා එම ගැටළු නිරාකරණය සඳහා විද්වත් සහාය ලබාගන්නා ලදී.

**ජෛවවිවිධත්වය හා බැඳුණු පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ග සැකසීම**

වර්තමානයේදී පවා දිවයිනේ විවිධ පළාත් වල ජනතාව විසින් දේශියත්වය සහ ඒ හා බැඳුනු පාරම්පරික දැනුම හා ව්‍යවහාර මහත් ලැදිකමින් ආරක්ෂා කරගනිමින් භාවිතා කරයි. මෙම පාරම්පරික දැනුම කෘෂිකර්මාන්තය, වාරිමාර්ග, ගෘහනිර්මාණ ශිල්පය, වෙදකම, ආහාර තාක්ෂණය, ඉදිකිරීම්, අධ්‍යාපනය හා ධීවර සහ ස්වභාවික සම්පත් කළමනාකරණය යන අංශ වල බෙහෙවින්ම යොදාගනු ලැබේ.

ජෛවවිවිධත්ව සම්මුතියේ 8(j) වගන්තියට අනුව පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව අංශය මගින් ජෛවවිවිධත්වය හා බැඳුනු පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය කෙටුම්පත් කරන ලදී. ඒ සඳහා 2020.10.27 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.





**ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කිරීම**

“ඍජු හා වක්‍ර සේවාවන් අඛණ්ඩව සපයන ජෛවවිවිධත්වයෙන් අනූන සුවදායක කඩොලාන පරිසර පද්ධතියක්” යන දැක්මෙන් යුක්තව කෙටුම්පත් කරන ලද ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්තිය සඳහා 2020 ජනවාරි 20 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි. මෙම ජාතික ප්‍රතිපත්තිය ගරු පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා හා ගරු වනජීවී සම්පත් හා වන සංරක්ෂණ අමාත්‍ය සී.බී. රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2020 සැප්තැම්බර් මස 08 දින පරිසර අමාත්‍යාංශයේ දී ප්‍රකාශයට පත් කරන ලදි.

**කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ වූ විද්වත් කමිටුව**

කඩොලාන පරිසර පද්ධති සම්බන්ධයෙන් උපදෙස් හා මාර්ගෝපදේශයන් සැපයීම සඳහා ස්ථාපිත කරන ලද කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ වූ විද්වත් කමිටුවේ තාක්ෂණික සහාය ඇතිව ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති පුනරුත්ථාපනය සඳහා වූ ජාතික මාර්ගෝපදේශ කෙටුම්පත් කරන ලදී.

**කඩොලාන පුනරුත්ථාපනය සම්බන්ධයෙන් ස්ථාපිත කරන ලද කාර්ය බලකාය**

පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් අතර ශ්‍රී ලංකාව කඩොලාන පුනරුත්ථාපනයේ ප්‍රමුඛයා ලෙස ක්‍රියා කිරීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති කඩොලාන පුනරුත්ථාපනය සම්බන්ධ කාර්ය බලකායේ මඟපෙන්වීමෙන්, කඩොලාන ප්‍රදේශ සඳහා නීතිමය රැකවරණයක් ලබාදීමට කටයුතු කරන ලදී. ඒ අනුව 2020 වර්ෂයේදී ආසන්න ලෙස කඩොලාන වනාන්තර හෙක්ටයාර් 883.594ක් සංරක්ෂිත වනාන්තර හා රක්ෂිත වනාන්තර ලෙස වන සංරක්ෂණ ආඥා පනත යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

**ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්තිය සැකසීම**

ශ්‍රී ලංකාව සිය ජෛවවිවිධත්වය සංරක්ෂණය කිරීමට හා ජෛව සොරකම හා ජෛව මංකොල්ලය වැළැක්වීමට ක්‍රියාමාර්ග යොදා ඇති නමුදු එබඳු අපහරණයන් අඛණ්ඩව සිදුවේ. වර්ගීකරණමය හඳුනාගැනීම සඳහා රටෙන් පිටතට යවනු ලබන නිදර්ශක ඉන් අනතුරුව ශ්‍රී ලංකාවේ අවසරයකින් තොරව නව නිෂ්පාදන සිදු කිරීම සඳහා දියුණු රටවල් විසින් භාවිත කිරීමේ ඉඩකඩක්ද තිබිය හැකිය. මෙසේ වුවහොත් දේශීය ජාන සම්පත් සඳහා අප රටට ලැබිය යුතු ප්‍රතිලාභ නොලැබීයාමද සිදුවේ.

මෙම තත්ත්වයට පිළියමක් වශයෙන් සියළු පාර්ශවකාර ආයතනයන් එක්ව ශ්‍රී ලංකාව සතු ජෛව සම්පත් සංරක්ෂණය හා තිරසර භාවිතය සඳහා “ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය“ හා රාජ්‍ය ආයතන අතර එය ක්‍රියාත්මක වියයුතු යාන්ත්‍රණය කෙටුම්පත් කරන ලදී. 2020.12.14 දින මෙම ජාතික ප්‍රතිපත්තිය සඳහා කැබිනට් අනුමැතිය හිමි ව ඇත.

**“Flower Visiting Fauna of Sri Lanka – An Inventory of Pollinators” ප්‍රකාශනය සැකසීම**

ජෛවවිවිධත්ව අංශය විසින් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහාය ඇතිව පරාගවාහකයන් හා ඔවුන් ආකර්ශනය වන ශාක පිළිබඳ පර්යේෂණාත්මක ලේඛනයක් සකස් කර මුද්‍රණය කරන ලදී.

## 2.1.2 දේශගුණික විපර්යාස අභියෝග ජයගැනීම

**ජාතිකව නිර්ණය කරන ලද දායකත්වය නැවත විමසීම හා යථාවත්කිරීම**

2016 වසරේ පැරිස් නුවර පැවති 21 වන පාර්ශවකරුවන්ගේ සමුළුවේ දී ගනු ලැබූ අංක1/cp.21 දරණ තීරණයට අනුව පැරිස් ගිවිසුමෙහි පාර්ශවකරුවන්ට ඔවුන්ගේ ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව විමසා 2020 වසරේ දී වඩාත් ඉලක්කගත ලෙස නැවත වාර්තා කිරීමට අවස්ථාව ලබා දී ඇත. පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි එක් එක් ක්ෂේත්‍රයන්ට අදාලව විශේෂඥ කමිටු අදාල අමාත්‍යාශ මගින් පත් කරන ලදී. මෙහිදී හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම සඳහා වන ක්ෂේත්‍ර 5 ක්, අනුහුරුවීමේ ක්ෂේත්‍ර 10 ක් හා පාඩු හා හානි යන ක්ෂේත්‍ර සැලකිල්ලට ලක් කරන ලදී. සමාරම්භක වැඩ සටහන 2020.02.17 දින බැංකු අධ්‍යන කේන්ද්‍රයේ දී පවත්වන ලදී.

- ක්ෂේත්‍ර සාකච්ඡා 80 ක් පවත්වා ඇත.
- අභ්‍යන්තර සාකච්ඡා 30ක් පවත්වා ඇත.
- ප්‍රගති සමාලෝචන 5 ක් පවත්වා ඇත.
- ප්‍රවාහන, කර්මාන්ත, අපද්‍රව්‍ය, ජෛව විවිධත්වය, සංචාරක හා විනෝද කටයුතු, කෘෂිකර්ම, සත්ත්ව පාලන, සෞඛ්‍ය , ජල කළමනාකරණ, නාගරික, නගර සැලසුම් හා මානව ජනාවාස යන ක්ෂේත්‍ර 12 සඳහා පුළුල් පාර්ශවකරුවන්ගේ උපදේශන වැඩසටහන් පවත්වන ලදී.

**දේශගුණික විපර්යාස අවම කිරීම පිළිබඳ ජාතික විශේෂඥ කමිටුව**

නව සාමාජිකයන් පත්කිරීම හා ඊලග අවුරුදු තුන සඳහා නව සභාපති ලෙස සේන පිරිස් මහතා පත්කිරීම.

ජාතික වශයෙන් යෝග්‍ය දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්‍රියාමාර්ග (NAMA) ව්‍යාපෘතියේ පුහුණු වැඩසටහන මගින් කඩොලාන, ජීවවායු, අභ්‍යන්තර මිරිදිය ප්‍රවාහනය, හා ශීතාගාර සඳහා නිර්මාණය වූ ව්‍යාපෘති යෝජනා 4ක් ඉදිරිපත් කිරීම.

NAMA ව්‍යාපෘතියේ අවසාන ප්‍රතිපල ඉදිරිපත් කිරීම.

**දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමේ ජාතික විශේෂඥ කමිටුව**

දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමේ ජාතික විශේෂඥයන්ගේ 15 වන කමිටු රැස්වීම 2020 පෙබරවාරි මස 07 වන දින පැවැත්විණි. මෙම රැස්වීමේදී කමිටුව විසින් පහත සඳහන් විෂයයන් සම්බන්ධව මාර්ගෝපදේශ ලබාදීම සිදු විය.

•දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන අවදානම ඇගයීම සහ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමේ ක්‍රියාකාරකම් අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ තාක්ෂණික ව්‍යාපෘතියෙහි ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයේ දේශගුණික විපර්යාස පිළිබඳ අවදානම් තක්සේරු වාර්තාවෙහි අවසන් ඇගයීම් ප්‍රතිඵල පිළිබඳව නිර්දේශ ලබාදීම.

•දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට ඉදිරිපත් කල යුතු වූ ශ්‍රී ලංකාවේ තෙවන ජාතික සන්නිවේදන වාර්තාවේ අවදානම් තත්වය ඇගයීමේ හා අනුහුරුවීමේ ක්‍රමෝපාය පිළිබඳ පරිච්ඡේදයට අදාල ඇගයීම් ප්‍රතිඵල පිළිබඳව නිර්දේශ කිරීම.

•හරිත දේශගුණ අරමුදල (GCF), ජාතික බලයලත් අධිකාරිය (NDA) හා අනෙකුත් පාර්ශ්වකරුවන් අතර දේශගුණ මූල්‍ය කටයුතු වෙත ප්‍රවේශවීම සඳහා ඵලදායී සම්බන්ධීකරණයක් සහ දැනුවත්භාවය වඩා ශක්තිමත් කිරීම සඳහා වූ කෙටුම්පත් කරන ලද ජාතික නිළලත් අධිකාරිය සඳහා වූ පාර්ශ්වකරුවන් හා සම්බන්ධවීමේ උපායමාර්ග සහ මෙහෙයුම් අත්පොත පිළිබඳව නිර්දේශ ලබාදීම.

**දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන අවදානම ඇගයීම සහ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දේශගුණ විපර්යාස සඳහා අනුගත වීමේ ක්‍රියාකාරකම් අන්තර්ග්‍රහණය කිරීම**

“ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳ අවදානම; ක්ෂේත්‍ර අවදානම් පැතිකඩ” සමාලෝචනය කරන ලදී.

**දේශගුණ සුහුරු නගර පිහිටුවීම (Climate Smart City),**

**කුරුණෑගල හරිතාගාර වායු අවම කිරීමේ සැලැස්ම**

මෙහි දෙවැනි පියවර සඳහා තාක්ෂණික ආධාර Econetwork කොරියානු ආයතනය හා දේශගුණ තාක්ෂණ මධ්‍යස්ථාන ජාලය CTCN මගින් ලැබී ඇත. දේශුණ සුහුරු නගර ආරම්භක උළෙල 2020 වර්ෂයේ අගෝස්තු මස පැවැත්විණ.

**දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික අනුහුරු සැලැස්ම ක්‍රියාත්මක කිරීම [NAP]**

ආයතනික මට්ටමින් අදාළ එක් එක් පාර්ශවයන් සඳහා NAP හි ඇතුලත් ක්‍රියාකාරකම් එක් පත්‍රයකට සම්පාදනය කිරීමෙන් ආයතනික මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ වාර්තාකරණ ආකෘතිය සකස් කරන ලද අතර ක්‍රියාත්මක කිරීමේ මට්ටම ඇගයීම සඳහා සියලු වගකිවයුතු ආයතන වෙත යවන ලදී.

**හරිත දේශගුණ අරමුදල (GCF)**

දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය විසින් ඍජු මූල්‍ය ප්‍රවේශ ආයතනයක් ලෙස පත්වීම සඳහා ඉල්ලුම් කිරීමට දිරිගැන්වීම උදෙසා රටේ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන දැනුවත් කිරීම සඳහා වැඩසටහන් මෙහෙයවා ඇත. දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවකින් සහ කණ්ඩායම් සාකච්ඡාවලින් පසුව, තවත් බැංකු 5 ක්, එනම් DFCC බැංකුව, ජාතික සංවර්ධන බැංකුව (NDB), හැටන් නැෂනල් බැංකුව (HNB), නිවාස සංවර්ධන මූල්‍ය සහයෝගිතා බැංකුව (HDFC) සහ කොමෂල් බැංකුව ඍජු මූල්‍ය ප්‍රවේශන ආයතන වීමට කැමැත්ත ප්‍රකාශ කරන ඍජු මූල්‍ය ප්‍රවේශ ආයතනයක් ලෙස පත්වීම සඳහා ඉල්ලුම් කර ඇත.

**ජාතිකව බලයලත් අධිකාරියේ (NDA) පළමු හා දෙවන සූදානම් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.**

ජාතිකව බලයලත් අධිකාරියේ (NDA) පළමු සූදානම් ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ කඳුකර ජලපෝෂක ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානයක්ද යොමු කරමින් පරිසර අමාත්‍යාංශය මෙන්ම රාජ්‍ය, පෞද්ගලික, සිවිල් සමාජය, ශාස්ත්‍රීය සහ අනෙකුත පාර්ශ්වකරුවන්ට උපාය මාර්ග සංවර්ධනය කිරීමට සහ දේශගුණික මූල්‍යාධාර ලබාගැනීම සඳහා ධාරිතාව ගොඩනැංවීමට සහය වනු ඇත.

- පාර්ශවකරුවන්හා සම්බන්ධවීමේ උපාය මාර්ග නිමකිරීම.
- ජාතිකව බලයලත් අධිකාරියේ පළමු සූදානම් ව්‍යාපෘතිය සඳහා මෙහෙයුම් අත්පොත සකස්කිරීම
- පාර්ශවකරුවන් සඳහා උපදේශන වැඩමුළු කිහිපයක් පැවැත්වීම
- ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව පැවැත්වීම
- හරිත දේශගුණ අරමුදලේ මූල්‍යාධාර ලබාගැනීම සඳහා දේශීය ප්‍රමුඛතාව (Country Programme) සහ හරිත සංවර්ධන උපායමාර්ගය (Green Growth Strategy) ආරම්භ කරන ලදී

ගෝලීය ජල හවුල්කාරිත්වය (GWP) සමඟ ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද දෙවන සූදානම් ව්‍යාපෘතිය පිළිබඳ යෝජනාව හරිත දේශගුණ අරමුදල (GCF) වෙත ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාවේ පහළ ජලාධාර සහ වෙරළබඩ කලාප කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් දේශගුණික මූල්‍ය බලමුලු ගැන්වීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම හා ධාරිතාවය ගොඩනැගීම සඳහා දෙවන සූදානම් ව්‍යාපෘතිය පරිසර අමාත්‍යාංශයට සහ රජය, සිවිල් සමාජය, ශාස්ත්‍රීය හා පෞද්ගලික අංශයේ අනෙකුත් පාර්ශවකරුවන්ට සහාය වනු ඇත.

## 2.1.3 වායු සම්පත් කළමනාකරණය

**වායු තත්ත්ව කළමනාකරණය සඳහා උපායමාර්ගික කළමනාකරණය හා සම්බන්ධීකරණය සඳහා ආයතනික ව්‍යුහය ස්ථාපනය කිරීම**

වායු සම්පත් කළමනාකරණය සඳහා පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමත මෙහෙයුම් / නියාමන කමිටුවක් සහ තාක්ෂණික කමිටුවක් පිහිටුවා ඇත. 2020 පෙබරවාරි 20 වන දින මෙම කමිටු රැස්වූ අතර එහිදී තව දුරටත් වායු විමොචන වැඩසටහන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමටත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ හා ත්‍රිවිධ හමුදාවට අයත් වාහන සඳහා වායු විමෝචන පරික්ෂාවන් සඳහා යොමු කිරීමටත්, දේශසීමාන්තර වායු දූෂණය අධීක්ෂණය හා තත්කාර්යය වායු විමෝචන අධීක්ෂණය වැඩි දියුණු කර ශක්තිමත් කිරීමටත් ශ්‍රී ලංකාව තුල විද්‍යුත් වාහන සංචලතාව ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රතිපත්තිමය තීරණ රැසකට එළැඹිණි.

### ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය

**ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකණය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීම**

2020 වසරේදී තාක්ෂණික කමිටු වාර 3 ක් 2020 අප්‍රේල් මස 16වන දින, හා 2020 අගෝස්තු මස 18 දින සහ 2020 ඔක්තෝම්බර් මස 08 යන දිනවල කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මාර්ගගත රැස්වීම් ආකාරයට පවත්වන ලදී . මේ යටතේ නිවාසයන්හි ගෘහස්ථ වායු දූෂණය පාලනය කිරීම සඳහා වන දෙවන කෙටුම්පත සකස් කර ඇත.

### සුපිරිසිදු තාක්ෂණය, පිරිසිදු ඉන්ධන ආශ්‍රිත ක්‍රියා

ඉන්ධන තත්ත්ව මාර්ග සිතියම අවසන් කිරීම/ ක්‍රියාත්මක කිරීමට අදාලව 2020 පෙබරවාරි 22 වන දින හා දෙසැම්බර් මස 30 වන දිනයන් හීදී නිලධාරීන්ගේ කමිටු රැස්වීමක් පවත්වන ලද අතර එහිදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා මාර්ග සිතියම යාවත්කාලීන කරන ලදි.

**වාහන ආනයන ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම (වායු විමෝචනය, ඉන්ධන සහ ප්‍රමිතීන්)**

2018 දී ශ්‍රී ලකාවට මෝටර් වාහන ආනයනය සඳහා යුරෝ 4 වායු විමෝචන ප්‍රමිතීන් ක්‍රියාත්මක කරන ලද අතර එම ගැසට් නිවේදනය සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා වාර කිහිපයක් පවත්වන ලදි.

ගැසට් නිවේදන දෙකක් සම්බන්ධ කිරීමට අදාළ දළ සංශෝධනය සහ ගැසට් නිවේදනය සම්බන්ධ ගැටළු සකස් කොට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත විමර්ශනය සඳහා යොමු කරන ලදී.

### ශබ්ද දූෂණය පාලනය කිරීමට අදාළ ක්‍රියාකාරකම්

මේ අනුව 2016 සිට අදාළ ආයතන සමඟ ශබ්ද දූෂණ තත්වයන් පාලනය සම්බන්ධව රැස්වීම් මාලාවේ එක් රැස්වීමක් 2020 ජූලි මස 23 වන දින පරිසර අමාත්‍යාංශයේදී පැවති අතර, මේ සඳහා මෝටර් රථ දෙපාර්තමේන්තුව මගින් තාක්ෂණික කමිටුවක් පත්කර එමඟින් දැනට පවතින නීති හා රෙගුලාසි අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට හා අවශ්‍යතාවය අනුව නව රෙගුලාසි හඳුන්වා දීමට තීරණය කරන ලදි. තවද, මෙහිදී බහුවිධි වාහන නලා මෙරටට ගෙන්වීම තහනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටද එකඟ විය.

### ශ්‍රී ලංකාවේ තිරසාර හා කාර්යක්ෂම විදුලි සංචලතා පද්ධතිය ප්‍රවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය

2019 වසරේදී ඇති කර ගන්නා ලද විද්‍යුත් සංචලතාව පිළිබඳ කාර්ය සාධක බලකාය මගින් ශ්‍රී ලංකාව තුල විද්‍යුත් වාහන සංචලතාව ප්‍රවර්ධනය සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් හඳුනා ගන්නා ලදි. එම නිර්දේශයන්ට අනුව, ගෝලීය පරිසර පහසුකම් (GEF) සැලසීමේ ආයතනයේ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරන ලදි. එමගින් විද්‍යුත් වාහන ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපනය සඳහා අවශ්‍ය තාක්ෂණික පුහුණුව, බස්රථ යොදා ගැනීමේ ආකෘති ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ඇතුලත් වේ.

### ප්‍රවාහන ක්ෂේත්‍රයෙන් මුදා හරින වායු එලදායී කළමනාකරණය

රථවාහන වායු විමෝචන තත්ව පරීක්ෂණ වැඩසටහනේ ක්‍රියාපිළිවෙල විධිමත් කිරීමට අවශ්‍ය කෙටි කාලීන සහ දිගු කාලීන ක්‍රමවේදයන් පරිසර අමාත්‍යාංශය විසින් යෝජනා කල අතර මෙරට රථවාහන යෝග්‍යතා පරීක්ෂණ ක්‍රමවේදයේ බිඳ වැටීම් පිළිබඳ අධ්‍යනයක් සිදු කරන ලදී.

## 2.1.4 පරිසර සැලසුම් හා ආර්ථික

### හරිත ප්‍රසම්පාදන වැඩසටහන

හරිත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ නායකත්ව සැපයුම්කරුවන්, තාක්ෂණික සේවා සපයන්නන්, නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් ඇතුළු පාර්ශවකරුවන්ගේ දායකත්වයෙන් යුතුව සහ මුදල් අමාත්‍යාංශයේ සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සහයෝගයෙන් කෙටුම්පත් කර ඇත. හරිත ප්‍රසම්පාදනය 2019 දී සංශෝධිත රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොත් කෙටුම්පත් වල 15 වන පරිච්ඡේදයට ඇතුළත් කර ඇත. 2020 වසරේ දී මෙම ප්‍රතිපත්ති කෙටුම්පත ප්‍රතිආකෘතිකරණය කර ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ කෙටුම්පත් කරන ලදී. 2020. 09.10 දින ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡාවක් පවත්වන ලද අතර ඔවුන්ගේ අදහස් ප්‍රතිආකෘතිගත කළ කෙටුම්පතට ඇතුළත් කරන ලදී. දැනට මහජන අදහස් ලබා ගැනීම සඳහා ප්‍රතිපත්තිය සකස් වෙමින් පවතී.

### පරිසර ලේබල වැඩසටහන

ශ්‍රී ලංකාවේ පරිසර ලේබල් සඳහා රාමුවක් / වේදිකාවක් හඳුන්වා දීමේ මූලික කටයුතු 2020 දී සිදු කරන ලදී.

2020 ජූලි 23: ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනය ඇතුළු පාර්ශවකරුවන් සමග පළමු රැස්වීම පවත්වනු ලැබිණි. අනෙකුත් පාර්ශවකරුවන් ද හඳුනා ගන්නා ලදී.

2020 අගෝස්තු 24: ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලයෙහි සභාපති විසින් පරිසර ලේබල පිළිබඳ මූලික තොරතුරු සහ ප්‍රතිතනය පිළිබඳ පළමු වන දැනුවත් කිරීමේ වැඩසටහන සිදු කරන ලදී.

2020 අගෝස්තු 28: දෙවන රැස්වීමේදී කෙටුම්පත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයන් සහ ආයතනික රාමු විස්තරාත්මකව සාකච්ඡා කරන ලදී.

2020 අගෝස්තු 31: ISO පාරිසරික ප්‍රමිතීන් පිළිබඳව අමාත්‍යාංශ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා 2 වන දැනුවත් කිරීමේ වැඩසටහන ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනයෙහි සම්පත් දායකත්වයෙන් සිදු කරන ලදී.

**ජාතික හරිත වර්තාකරණ ක්‍රමවේදය**

කර්මාන්ත 100 පමණ මෙම ජාතික හරිත වාර්තාකරණය හා සම්බන්ධ තොරතුරු හා මෙම ක්‍රමවේදයට ලියාපදිංචි වීමට ඇරයුම් කරන ලදී. කර්මාන්ත කරුවන් 4 ක් ලියාපදිංචි වෙන ලදී.

**ජාතික තිරසාර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

සියලු ප්‍රධාන පෙළේ අමාත්‍යාංශ සහ අදාළ පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින් අන්තර් ක්‍රියාකාරී ක්‍රියාදාමයක් හරහා තිරසර පරිභෝජන නිෂ්පාදන ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කොට ඇත. තවද ජාතික තිරසාර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ග මෙන්ම ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට අවශ්‍ය සැලැස්මක් සකස් ඇති අතර අදාල පාර්ශ්ව කරුවන් හඳුනාගෙන ඇත.

**හරිත නිෂ්පාදන දිරි ගැන්වීම හා හරිත රැකියා ප්‍රවර්ධන වැඩසටහන**

නීල හරිත ගම්මාන වැඩසටහන යටතේ, දිවයිනේ ගම්මාන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් ක්‍රියාත්මක වේ.

- දැත්ත (Green Ramie) බහු උපයෝගී බෝගය ප්‍රචලිත කිරීමේ වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
- මාලබේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ සිසුන්ගේ "තුරුළියට පණ පොවමු " සහභාගිත්ව සමාජ වගකීම් (Cooperate Social Responsibility) ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම.
- ගන්නෝරුව පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පළතුරු පැල තවානේ තවාන් කළමනාකරණ පිළිබඳ පුහුණු වීම.
- මීරිගම, හොරකැලේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැල තවානේ පුහුණුවක් ලබා ගැනීම හා හොර කැලේ වන රක්ෂිතයේ ඇකේසියා නිසා හායනයවූ වන බිමක් ප්‍රතිස්ථාපනය සඳහා බුළු පැල රෝපණය කිරීම.

**හරිත ගිණුම්කරණය වැඩසටහන**

හරිත ගිණුම්කරණය යටතේ 2020 වසරේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

විද්වත් කමිටු රැස්වීම ජුලි 23 වන දින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් අන්තර්ජාලය ඔස්සේ (zoom) තාක්ෂණය ඔස්සේ පවත්වන ලදි.

අමාත්‍යාංශ කාර්යසාධක බලමුළුව පුහුණු කිරීම හා නව නිලධාරීන් හඳුනා ගැනීම අගෝස්තු 25 වන දින සිදු කරන ලදි.

ජල ක්ෂේත්‍රයේ අමාත්‍යාංශ කාර්ය සාධක බලමුළුව සමඟ සාකච්ඡාවක් අගෝස්තු 25 වන දින සිදු කරන ලදි.





## 2.1.5 පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණය

බාසල්, ස්ටොක්හෝම්, මිනමාටා යන අන්තර් ජාතික සම්මුතීන්වල ජාතික කේන්ද්‍රීය ලක්ෂ්‍යය ලෙස ක්‍රියා කරන අතර, මේ යටතේ ජාතික මෙහෙයුම් කමිටු පවත්වා උපද්‍රවකාරී අපද්‍රව්‍ය, කල්පවතින කාබනික දූෂක ද්‍රව්‍ය හා රසදිය පිළිබඳවත් 'රෝටර්ඩම් සම්මුතිය' යටතේ කාර්මික රසායන ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳවත් අනෙකුත් පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර තීරණ ගැනීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකරයි. මේ යටතේ රසදිය අඩංගු අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීම ක්‍රමවේද සඳහා අනුමතීන් ලබාදීම මෙන්ම බාසල් සම්මුතියට අදාල කර්මාන්ත සඳහා ආනයනය කරන අමුද්‍රව්‍ය නියාමනයට යටත් කිරීම සිදු කරනු ලබයි. බාසල් සම්මුතියේ ජාතික කේන්ද්‍රීය ලක්ෂ්‍යය (Focal Point) ලෙස එංගලන්තය මගින්, මෙරටට එවන ලද අපද්‍රව්‍ය කන්ටේනර් 263, නැවත එම රටට යැවීමට අදාල ආයතන සමග කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.




**කසල කඳු ආරක්ෂිත ලෙස වසා දැමීම හා පුනරුත්ථාපනය සඳහා මාර්ගෝපදේශයක් සැකසීම**




දැනට දිවයින පුරා කසල කඳු 300 පමණ ඇති අතර මෙමගින් විශාල ලෙස පරිසරය දූෂණය වන අතර මහජනතාවට සෞඛ්‍ය තර්ජන වලක්වාලීම සඳහා මෙම කසල කඳු පරිසර හිතකාමී ලෙස වසා දැමීමට සහ පුනරුත්තාපනය කිරීම සඳහා මර්ගොපදේශ සකස් කරමින් පවතී.

**ජාතික ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සැකසීම**

විවිධ ආයතන ගනු ලබන ක්‍රියා මාර්ග අතිච්ඡාදනය අවම කර සම්බන්ධීකරණයක් ඇතිකර ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස යොදා ගැනීම සඳහා සියලුම අදාළ ආයතන සම එක්වී ජාතික ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකසමින් පවතී. මෙම සැලැස්මට අදාල පාර්ශව කරුවන් සමග එක්වී සකසා ඇති අතර එහි අවසාන වැඩ මුළුව ඔපියුලන්ට් රිවර් ෆේස් හෝටලයේ පවත්වන ලදී.

මෙයට අමතරව පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමග එක්ව පානීය ජල බෝතල්වල අඩංගු ක්ෂුද්‍ර ප්ලාස්ටික් පිළිබඳව පරීක්ෂණයක් ආරම්භ කර ඇත.

- Covid-19 හේතුවෙන් ස්වයං නිරෝධායනයකට ලක්ව සිටින්නන් විසින් ජනනය කරනු ලබන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සකස් කරන ලද අතර ඒ සම්බන්ධව පළාත් පාලන ආයතන සහ පාර්ශවකරුවන් සඳහා උපදෙස් සකස් කරන ලදී. මෙම මාර්ගෝපදේශය මධ්‍යම පරිසර අධිකාරියේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිවල පළ කරන ලදී.
- විශ්වවිද්‍යාල මගින් සිදු කරනු ලබන පර්යේෂණ රටෙහි අවශ්‍යතාවයට ගැලපෙන ලෙස යොදාගැනීම සඳහා ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සමග පරිසර දූෂණය පාලන පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය
- දැනට ගල් අගුරු අළු, ගොඩනැගිලි සෑදීම සඳහා ආනයනය කරන අතර නොරෝච්චෝලයි ගල් අඟුරු බලාගාරයේ නිපදවන අළු මේ සඳහා යොදා ගැනීමට අදාලව අළු බැහැර කිරීම හා ගබඩා කිරීමේ වර්තමාන තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාර ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කෙරිණ.

## 2.1.6 භූමි සම්පත් සංරක්ෂණය

**ශ්‍රී ලංකාවේ නියඟය සඳහා වූ ජාතික සැළැස්ම**




ශ්‍රී ලංකාවේ නියඟය සඳහා වූ ජාතික සැළැස්ම පාර්ශවකාර ආයතනයන්හි දායකත්වය ඇතිව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය නිමල් ගුණවර්ධන මහතා විසින් සකස් කරන ලදි. 2020 ජුනි මස 17 වන දින පැවැති එක්සත් ජාතීන්ගේ කාන්තාරීකරණය හා නියඟය වැළැක්වීමේ දිනයට සමගාමීව පැවති වැඩසටහනේදී ප්‍රථම වරට මෙම ජාතික සැළැස්මට අදාළ වාර්තාව පාර්ශවකරුවන් හට හඳුන්වාදෙන ලදි.

නියඟය පිළිබඳ වර්තමාන තත්ත්වය, දායකවූ ආයතන හා අනාගතයේදී නියඟය කළමනාකරණය කිරීමට අදාළ නිර්දේශ මෙම සැලසුමෙහි අන්තර්ගතව ඇත. නියඟය කළමනාකරණය කිරීම සඳහා පාර්ශ්ව ආයතනයන් සම්බන්ධීකරණයෙහි ඇති වැදගත්කම ද මෙම වර්තාවෙහි අවධාරණය කර ඇත.

භායනයට ලක්වූ භූමි පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ ජා-ඇල දියගල ළමා නගරයෙහි භූමි භායනය අවම කිරීම සඳහා ඉදිකර ඇති වගා ආදර්ශ භූමිහි අතිරේක ජල නල පද්ධතියක් ස්ථාපනය කිරීම.

වැලි, පස් හා මැටි කැණීම් බලපත්‍ර ක්‍රමවේදය සරල හා විධිමත්කිරීම සම්බන්ධ කමිටු වාර්තාව සකස් කිරීම සඳහා සහාය වීම.

## 2.1.7 පරිසර අධ්‍යාපන හා දැණුවත්කිරීම්

පරිසර සංවේදීතාවෙන් යුත් ප්‍රජාවක් බිහි කිරීම මඟින් පරිසර සංරක්ෂණය හා පරිසර ගැටළු අවම කිරීම මූලික අරමුණ වේ. 2020 වර්ෂය තුළ පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළුව 630 දෙනෙකු වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පවත්වන ලදි.

**පරිසර අධ්‍යාපනය පිළිබඳ නව පාසල් විෂය නිර්දේශයට අනුකූලව ගුරුභවතුන් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය**

විද්‍යා ගුරුභවතුන් පරිසර විෂයය සම්බන්ධයෙන් දැනුවත් කිරීම තුලින් සිසු දරුවන්ගේ පරිසර සංවේදීතාව ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම වර්ෂයට තුළදී වැඩමුළු 03 ක් පවත්වා ගුරුවරුන් 387 දෙනෙකු සාර්ථකව පුහුණු කිරීමට හැකි විය. ගුරු භවතුන්හට පරිශීලනය කිරීම සඳහා ගුරු උපදේශන අත්පොතෙහි ඉංග්‍රීසි පිටපත මුද්‍රණය ද සිදු කරන ලදි.




**සොබා පරිසර සඟරාව ප්‍රකාශයට පත් කිරීම**

වර්තමාන ගෝලීය පාරිසරික අර්බුද හමුවේ පාරිසරික දැනුම ලබාදීම හා ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් පාරිසරික වශයෙන් සංවේදී ප්‍රජාවක් බිහි කිරීමේ අරමුණ ඇතිව සෑම වසරකම පරිසර අමාත්‍යාංශය මඟින් සොබා සඟරාව එළි දක්වයි. ඒ අනුව මෙම වසරේදීද සොබා සඟරාවේ එක් කලාපයක් එළි දක්වන ලදී. එහි පිටපත් දීප ව්‍යාප්ත මට්ටමින් පාසල් සිසුන්, ගුරුවරුන්, රාජ්‍ය නිලධාරීන්, පුස්තකාල හා සාමාන්‍ය ජනතාව වෙත බෙදා දීමට නියමිත වේ.

## දේශගුණ විපර්යාස පිළිබඳව දැනුවත් කිරීම

### "නීලහරිත" දේශගුණ විපර්යාස සඟරාව

දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත්කිරීම හා එහි ප්‍රතිවිපාක වලට මුහුණදීම සඳහා කල යුතු දෑ සහ දේශගුණ විපර්යාස වලට කෘෂිකාර්මික වශයෙන් අනුහුරු වීම, ආර්ථික වශයෙන් බලපාන ආකාරය, සමහර වෙරලාසන්න ප්‍රදේශ වැනි තර්ජිත පරිසර පද්ධති පිළිබඳ තොරතුරු හා දේශගුණ සුහුරු නගර පිළිබඳ කෙරෙන වැඩසටහන් සහ වෙනත් ලිපි මෙහි අඩංගු වේ.

### දේශගුණික විපර්යාස පිළිබඳ පර්යේෂණ සංසදය

2020 මාර්තු 10 වන දින පවත්වන ලද කෘෂිකර්මාන්තය පිළිබඳ දේශගුණික විපර්යාස පිළිබඳ පර්යේෂණ සංසදයේදී කෘෂිකර්මාන්තය පිළිබඳ දේශගුණික විපර්යාස වලට සම්බන්ධ පර්යේෂණ අවශ්‍යතා පිළිබඳව දැනුවත් කිරීම සහ තවදුරටත් පර්යේෂණ කලයුතු අංශයන් හඳුනා ගැනීම සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රවල පර්යේෂකයින් සඳහා අරමුදල් ප්‍රභවයන් ලබා ගත හැකි ආකාර හඳුන්වා දීම සිදු කෙරිණි.




### දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත් කිරීමේ මෙවලම් සකස් කිරීම

ගොනු කවර 5000 ක් හා දේශගුණ විපර්යාස සහ පරිසර පද්ධති පිළිබඳ සිංහල මාධ්‍යයෙන් පෝස්ටර් 1000 ක් මුද්‍රණය කරන ලදී.



## ජෛවවිවිධත්වය පිළිබඳව දැනුවත් කිරීම

### පරාගවාහකයින් සංරක්ෂණය කිරීම පිළිබඳව දැනුවත් කිරීම.

මහරගම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ගුරු පුහුණුව ලබන ගුරු සිසුවියන් 310ක් හා ගුරු උපදේශකවරුන් 10ක් උදෙසා පරාගවාහකයින් සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ එක්දින වැඩමුළුවක් පවත්වන ලදී.

### පාංශු ජෛව විවිධත්වය

ලෝක ආහාර සංවිධානය හා අන්තර් ජාතික පාංශු විද්‍යා සංගමය එක්ව සංවිධානය කරනු ලැබූ පාංශු දින වැඩසටහන යටතේ " පස සජීවී ලෙස තබාගන්න, පාංශු ජෛව විවිධත්වය රැකගන්න" තේමාවට අනුව පාසල් සිසු දරු දැරියන්හට පරිශීලනය කල හැකි වන පරිදි සකස් කරන ලද පොත්පිංච මුද්‍රණය කර බෙදාහැරීමට කටයුතු සංවිධානය කෙරිණි.




### නිරෝගී පසක ඇති වැදගත්කම

" නිරෝගී පසක ඇති වැදගත්කම—Why Soil Health is Important " යනුවෙන් අත් පත්‍රිකාවක් සකස් කර එය සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් මුද්‍රණය කරන ලදී. එම අත් පත්‍රිකාව ද පාසල් සිසු දරු දැරියන් හා දැනුවත් කිරීමේ වැඩමුළු සඳහා ලබාදීමේ අරමුණ ඇතිව සකස් කරන ලදී.

පාසල් දරුවන්ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම මෙන්ම පාරිසරික දැනුම ඉහළ නැංවීමේ අරමුණින් විජය පුවත්පත හා ඒකාබද්ධව පරිසර ප්‍රහේලිකා පැන විසඳුම් තරඟයක් ලෙස එම වැඩසටහන පවත්වන ලදී. මෙහිදී තෝරාගනු ලැබූ නිවැරදි පැන විසඳුම් ලබාදුන් දරුවන් 20 දෙනෙකු සඳහා පොත් මිලදී ගැනීමට වවුචර්පත් පිරිනැමීම සිදුවිය.

**පරිසර නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු**

පරිසර නීතීන් පිළිබඳ දැනුවත් කිරීමක් අම්පාර දිස්ත්‍රික්කයේ පොලිස් නිලධාරීන් 60 දෙනෙකු සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සිදු කරන ලදී.

**හරිත ආයතන වැඩසටහන**

මෙමගින් "හරිත රෝහල්", "හරිත සරසවි" සහ "හරිත ආයතන" යන සංකල්ප පිළිබඳව රෝහල්, ආයතන සහ විශ්ව විද්‍යාල දැනුවත් කෙරේ. මෙහි අරමුණ එම ආයතනවල සම්පත් කාර්යක්ෂමව යොදා ගැනීමත්, පරිසර දූෂණය අවම කිරීමත් හා චක්‍රීය ආර්ථික ප්‍රවර්ධනයත්ය.

**"හරිත රෝහල්"** වැඩසටහන් කාසල් වීදියේ කාන්තා රෝහල, ශ්‍රී ලංකා අක්ෂි රෝහල, සහ තලංගම ප්‍රාදේශීය රෝහලේ පවත්වන අතර හරිත ආයතන වැඩසටහනක් කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ලදී.

**බුද්ධිමත්ව ප්ලාස්ටික් පරිහරණ කිරීමේ වැදගත්කම සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණයෙන් පරිසර දූෂණය අවම කිරීම පිළිබඳව දැනුවත් කිරීම් සිදු කිරීම**




**ඕසෝන් ප්‍රහීනකාරී හා ඉහළ ගෝලීය උණුසුමක් සහිත ශීතකාරක භාවිතය පාලනය හා භාවිතයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම.**

♦ ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රය සඳහා හරිත තාක්ෂණය හඳුන්වාදීම යටතේ පුහුණු වැඩසටහන් 01ක් තාක්ෂණ විද්‍යාලවල ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ පුහුණුවන්නන් සඳහා පවත්වා ඇත.

♦ පාසල් සිසුන්, ගුරුවරුන්, රාජ්‍ය සේවකයින් පුහුණු කිරීම හා දැනුවත් කිරීමේ වැඩමුළු 09ක් හා "සූම් තාක්ෂණය" ඔස්සේ වැඩමුළු 02ක් පවත්වා ඇත.

ඕසෝන් ලේකම් කාර්යාලය මගින් ශ්‍රී ලංකාව වෙත ලබාදී ඇති ඉලක්ක වෙත ළඟා වීම කඩිනම් කිරීම සඳහා ජාතික ඕසෝන් ඒකකය මගින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතයට ගනිමින් ඕසෝන් වියන රැක ගැනීම හා ගෝලීය උණුසුම අවම කර ගැනීමේ වැදගත්කම පිළිබඳව පුළුල් ප්‍රචාරණයක් ලබාදීමට පියවර ගන්නා ලදී. මේ සඳහා ප්‍රදර්ශන පුවරු, ටී-ෂර්ට්ස් සහ පොත් මුද්‍රණය, පුවත්පත් දැන්වීම් පල කිරීම සිදු කරන ලද අතර වායු සමීකරණ හා ශීතකරණ ක්ෂේත්‍රයේ හොඳ සේවා පුරුදු කෙටි වීඩියෝ පටයක්ද නිෂ්පාදනය කරන ලදී.



**ජගත් ඕසෝන් දිනයට සමගාමීව පුවත්පත් අතිරේකයක් නිකුත්කිරීම**

ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහාත් ඒ සම්බන්ධයෙන් පුළුල් ප්‍රචාරයක් ලබාදීම සහතික කිරීම සඳහාත් 2020 සැප්තැම්බර් 16 වන දිනයට යෙදුනු ජගත් ඕසෝන් දින සැමරුම් උත්සවයට සමගාමීව ජාතික ඕසොන් ඒකකය විසින් පුවත්පත් අතිරේකයක් නිකුත් කරන ලදී. මෙම අතිරේකයේ ඕසෝන් විද්‍යාව, ඕසොන් හා සබැඳි දේශගුණික විපර්යාස, දේශසීමා හරහා ඕසෝන් ප්‍රහීනකාරී ද්‍රව්‍ය ප්‍රවාහනය සහ ශීතකරණ හා වායු සමීකරණ ක්ෂේත්‍රයේ අනාගත ප්‍රවණතා ඇතුළත් කරන ලදී.

**ඕසෝන් වියන සංරක්ෂණය හා එහි වැදගත්කම පිළිබඳ මාර්ගගතව (online) පවත්වන ලද චිත්‍ර, කාටූන් සහ කවි තරඟය හා ප්‍රදර්ශනය**

"කොවිඩ්" වසංගත සමයේදී නිවසට සීරවී කාලය ගත කල සිසුන් ඇතුළු අනෙකුත් ශ්‍රී ලාංකික ජනතාවගේ මානසික ආතතිය දුරලීම සඳහා ජාතික ඕසොන් ඒකකය විසින් මාර්ගගත / විවෘත චිත්‍ර, කවි සහ කාටූන් තරඟයක් සංවිධානය කරන ලදී. මේ සඳහා මුද්‍රිත හා සමාජ මාධ්‍ය හරහා පුළුල් ප්‍රචාරයක් ලබා දුන් අතර ඉතා ඉහළ ප්‍රතිචාරයක් මේ සඳහා ලැබිණි. තරඟ ජයග්‍රාහකයින් සඳහා 2020.09.16 දිනට යෙදුනු ජගත් ඕසෝන් දින සැමරුම් උත්සවයේදී ත්‍යාග හා සහතික පත් ප්‍රදානය කරන ලදී.



**ජෛව සුරක්ෂිතතාවය පිළිබඳව දැනුම සංවර්ධනය, මහජනතාව දැනුවත් කිරීම හා අධ්‍යාපනය හා සහභාගිත්වය**

- i) පරිසර අමාත්‍යාංශය (ii) මධ්‍යම පරිසර අධිකාරිය සහ (iii) කොළඹ විශ්ව විද්‍යාලයේ සහ දෘශ්‍ය කලා විශ්ව විද්‍යාලයේ තෝරාගත් පිරිසක් සඳහා ඉලක්කගත දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- ජෛව සුරක්ෂිතතාවයට අදාළ විවිධ මාතෘකා යටතේ විශේෂඥයන් සමඟ මිනිත්තු 30 බැගින් වූ සජීවී ගුවන් විදුලි සාකච්ඡා වැඩසටහන් 6 ක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, ස්වදේශීය සේවය මගින් පවත්වන ලදී.
- ජෛව සුරක්ෂිතතාව පිළිබඳ අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ මෙවලම් සකස් කිරීම.
- ජෛව සුරක්ෂිතතා පුවත්හසුනේ සිව්වන ප්‍රකාශනය නිකුත් කිරීම.

**පරිසර ගැටළු පිළිබඳ මාධ්‍ය වාර්තා සම්බන්ධීකරණය**

වර්තමානයේ පැන නැගී ඇති පාරිසරික ගැටලු අවම කිරීමේ පරමාර්ථයෙන් අමාත්‍යාංශ මට්ටමින් මැදිහත්ව විසඳුම් සෙවීම.

වාර්තාකරණ කාලසීමාව තුළ රූපවාහිනී නාලිකාවල විකාශය වූ පාරිසරික ගැටළු/අවධානයන් නිරීක්ෂණය කර හඳුනාගත් ගැටළු 43 කට මැදිහත් වන ලදී. තවද, පුවත්වල පල වූ පරිසර සංවේදී මාතෘකා 27 ක් පිළිබඳව අවධානය යොමු කරමින් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.






හතරවන ජෛව සුරක්ෂිතතා පුවත්හසුන



ජෛව සුරක්ෂිතතාවට අදාල විවිධ මාතෘකා යටතේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙහි පැවති සජීවී ගුවන් විදුලි සාකච්ඡා




## 2.1.8 අන්තර්ජාතික පාරිසරික සබඳතා

**එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේදී (UNGA) කොළඹ ප්‍රකාශනය සහ තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳව ජනාධිපතිතුමා අවධාරණය කරයි.**

තිරසර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ ගෝලීය සංවාදය පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) සහ ජාත්‍යන්තර නයිට්‍රජන් කළමනාකරණ පද්ධතිය සමඟ සහයෝගයෙන් කටයුතු කළේය. "ජීවිතයට නයිට්‍රජන්"; තිරසර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ යුනෙප් හි ගෝලීය ව්‍යාපාරය පසුගිය වසරේ එක්සත් ජාතීන්ගේ දිනයේදී දියත් කරන ලද අතර, රටවල් 14 ක් විසින් අනුමත කරන ලද තිරසර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ කොළඹ ප්‍රකාශනයත් සමඟ ශ්‍රී ලංකාව මෙම අවස්ථාවට නායකත්වය දුන්නේය.

ශ්‍රී ලංකාව විසින් ලබා දුන් රාජ්‍ය තාන්ත්‍රික නායකත්වය සනිටුහන් කරමින් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසින් තිරසර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ කොළඹ ප්‍රකාශය එක්සත් ජාතීන්ගේ මහ ලේකම්තුමන් වෙත යොමු කරන ලදී.

එම කතිකාවතෙහි දිගුවක් වශයෙන් 2020 සැප්තැම්බර් 30 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 75 වන සැසිවාරය අමතමින් මිනිසාගේ පැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා නයිට්‍රජන් ප්‍රශස්ත වශයෙන් කළමනාකරණය කිරීමට ලෝක නායකයින් ක්‍රියා කළ යුතු බව, අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

**එක්සත් ජාතීන්ගේ පරිසර සභාවේ පස්වන සැසිය ( UNEA - 5)**

එළඹෙන එක්සත් ජාතීන්ගේ සමුළුවේදී යෝජනා දෙකක් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාවට පසුබිම සැකසීම සඳහා සම අදහස් ඇති රටවල් සහ ජාත්‍යන්තර තාක්ෂණික ආයතන සමඟ තවදුරටත් සාකච්ඡා පැවැත්වේ.

**ගෝලීය පාරිසරික පහසුකමේ 7 වන චක්‍රය (GEF - 7)**

GEF – 7 චක්‍රීය අරමුදල් සඳහා ව්‍යාපෘති යෝජනා 6 ක් සකස් කර ඇති අතර එම ව්‍යාපෘති යෝජනා සඳහා අනුමත කිරීමේ ලිපි ඉදිරිපත් කර ඇත.

I. Natural Capital Values of Coastal and Marine ecosystems in SL integrated into Sustainable Development Planning: ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය - ගෝලීය පාරිසරික පහසුකම් (GEF) නියෝජිතායතනය: සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය (IUCN).

II. Partnerships and innovative finance for forest landscape restoration project in Sri Lanka- ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය - ගෝලීය පාරිසරික පහසුකම් නියෝජිතායතනය: එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP).

III. Sustainable and Efficient Electric Mobility System in Sri Lanka – වායු සම්පත් කළමනාකරණය සහ ඕසෝන් ඒකකය - ගෝලීය පාරිසරික පහසුකම් (GEF) නියෝජිතායතනය: එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන (UNEP)

IV. Seventh Operational Phase of the Global Environment Facility (GEF) Small Grants Programme in Sri Lanka - ගෝලීය පාරිසරික පහසුකම් (GEF) නියෝජිතායතනය: එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)

V. Eliminating mercury skin lightening products – සෞඛ්‍ය අමාත්‍යාංශය - ගෝලීය පාරිසරික පහසුකම් (GEF) නියෝජිතායතනය: එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන (UNEP).

VI. Strengthening trans-boundary cooperation for improved marine ecosystem management through promotion of blue economy in the Bay of Bengal – India, Bangladesh and Sri Lanka – ගෝලීය පාරිසරික පහසුකම් (GEF) නියෝජිතායතනය: එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP).

**සංක්‍රමණ සඳහා ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් අරමුදල් සපයන ශ්‍රී ලංකාවේ සංක්‍රමණය, පාරිසරික හායනය සහ දේශගුණික විපර්යාස පිළිබඳ අවබෝධය පිළිබඳ ව්‍යාපෘතිය (MECC) සඳහා අනුමැතිය දීමේ ලිපි ලබා දීම.**

ශ්‍රී ලංකාවේ ප්‍රජාවට දේශගුණික විපර්යාසවල හා ස්වභාවික විපත්වලට ඔරොත්තුදීමේ හැකියාව හා අනුහුරු වීමේ ධාරිතාවය වැඩි කිරීම.

**එක්සත් ජාතීන්ගේ 75 වන මහා මණ්ඩලයේදී සොබාදහම වෙනුවෙන් ප්‍රතිඥාව සඳහා ශ්‍රී ලංකාව ලෝක නායකයින් සමඟ එක් වීම.**

2020 සැප්තැම්බර් මාසයේ පැවති එක්සත් ජාතීන්ගේ 75 වන මහා මණ්ඩලයේ ජෛව විවිධත්ව සමුළුවේදී ශ්‍රී ලංකාව ඇතුළුව රටවල් 76 ක දේශපාලන නායකයින් වර්ෂ 2030 වන විට ජෛව විවිධත්ව හානිය ආපසු හැරවීමට කටයුතු කරන බවට ප්‍රතිඥා දෙන ලදී.

පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් දුරස්ථ ලෙස සම්බන්ධ වෙමින් සමුළුව අමතන ලදී.

**කෘෂි ආහාර පද්ධතීන් සහ නයිට්‍රජන් අභියෝගය: 2030 දී නයිට්‍රජන් අපද්‍රව්‍ය අඩක් කරමු**

"තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ කොළඹ ප්‍රකාශනය" හා 2030 වන විට නයිට්‍රජන් අපද්‍රව්‍ය අඩකින් අඩු කිරීමේ අභිලාෂය ජය ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික නායකත්වය හඳුනා ගනිමින් පරිසර අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතා 2020 දෙසැම්බර් 7 වන දින ප්‍රධාන දේශනය පවත්වන ලදී.




**ගෝලීය හරිත වර්ධන ආයතනයේ (GGGI) සභාවේ නවවන සැසිවාරය සහ සභාවේ දහතුන්වැනි සැසිය (ඒකාබද්ධ සැසිය)**

ගෝලීය හරිත වර්ධන ආයතනයේ (GGGI) නවවන සැසිවාරය සහ සභාවේ දහතුන්වැනි සැසිය මෙම අමාත්‍යාංශයේ අන්තර්ජාතික සබඳතා අංශය විසින් GGGI සම්බන්ධීකරණය කරමින් 2020 ඔක්තෝබර් 28 වන දින පරිසර අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් දුරස්ථ ලෙස සම්බන්ධ වෙමින් පැවැත්විණි. මෙයට සමගාමීව GGGI හි සභාපති බැන් කී මූන් මහතා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා ද පැවැත්විණි. 2020-2024 කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ හරිත වර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් සකස් කිරීම සඳහා දැනටමත් GGGI ආයතනය අමාත්‍යාංශයට සහාය වේ.



**බහුපාර්ශ්වික පාරිසරික ගිවිසුම්**

**♦ ශ්‍රී ලංකා රජය සහ කෘෂි වන වගා පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය (ICRAF) අතර සත්කාරක රාජ්‍ය ගිවිසුම**

**♦ පරිසර ක්ෂේත්‍රයේ සහයෝගීතාවය පිළිබඳ තුර්කිය සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුම**

**♦ ශ්‍රී ලංකා රජය සහ හරිත දේශගුණික අරමුදල (GCF) අතර සත්කාරක රට ගිවිසුමට එළඹීම.**

**ජාත්‍යන්තර පාරිසරික සම්මුතීන්, සන්ධාන, සහයෝගිතා වැඩසටහන් සහ ජාත්‍යන්තර ආයතන සඳහා වාර්ෂික දායකත්ව මුදල් හා සත්කාරකත්ව මුදල් ගෙවීම්**

ජාත්‍යන්තර පාරිසරික සම්මුතීන්, සන්ධාන, සහයෝගිතා වැඩසටහන් සහ ජාත්‍යන්තර ආයතන සඳහා 2020 වර්ෂයේදී දායකත්ව මුදල් හා සත්කාරකත්ව මුදල් ගෙවීම් (රු. 14,647,269.45) පහත පරිදි වේ.

I. කියතෝ සන්ධානය
II. උපද්‍රවකාරී අපද්‍රව්‍ය දේශසීමා හරහා ප්‍රවාහනය හා බැහැර කිරීම් පාලනය සඳහා වන බාසල් සම්මුතිය
III. ජෛව සුරක්ෂිතතාව පිළිබඳ කාර්ටිජිනා සන්ධානය
IV. දකුණු ආසියානු කලාපීය පරිසර සහයෝගිතා වැඩසටහන (SACEP) - සත්කාරක පහසුකම් (වාරික 1, 2 හා 3)
V. එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP)

2020 වර්ෂයට අදාළ ජාත්‍යාන්තර පාරිසරික සම්මුතීන්, සන්ධාන, සහයෝගිතා වැඩසටහන් සහ ජාත්‍යන්තර ආයතන සඳහා දායකත්ව මුදල් හා සත්කාරකත්ව මුදල් 2021 වර්ෂයේදී ගෙවීමට කටයුතු සූදානම් කර ඇත.

I. ස්ටොක්හෝම් සම්මුතිය
II. මිනමාටා සම්මුතිය
III. ජෛව විවිධත්වය සම්මුතිය (CBD)
IV. එක්සත් ජාතීන්ගේ කාන්තාරීකරණය පිටු දැකීම පිළිබඳ සම්මුතිය (UNCCD)
V. ලෝක සංරක්ෂණ සංගමය (IUCN)
VI. එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC)
VII. දකුණු ආසියානු කලාපීය පරිසර සහයෝගිතා වැඩසටහන (SACEP)
VIII. දකුණු ආසියානු කලාපීය පරිසර සහයෝගිතා වැඩසටහන යටතේ ක්‍රියාත්මක දකුණු ආසියානු මුහුදු වැඩසටහන (SASP)
IX. දකුණු ආසියානු කලාපීය පරිසර සහයෝගිතා වැඩසටහන - සත්කාරක පහසුකම (4 වන වාරිකය)

## 2.1.9 පාරිසරික දින සැමරීම

**ලෝක මිහිතල දින සැමරුම් වැඩසටහන. (2020 අප්‍රේල් 22)**

ජගත් මිහිතල දිනය සම්බන්ධව "විජය" ළමා පුවත්පත හා "අද" පුවත්පතේ ලිපි පළකිරීමත් අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඔස්සේ දැනුවත් කිරීම් සිදු කරන ලදී.

**ජගත් පරිසර දිනය 2020 සැමරුම් වැඩසටහන.**

**(2020 ජුනි 06)**

2020 ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන් පැවැත්වීම වෙනත් වසරවල මෙන් නොව කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශ අනුව සමාජ දුරස්ථභාවය ආරක්ෂා වන පරිදි සිදු කරන ලදී. මෙවර ජගත් පරිසර දිනය "ජෛව විවිධත්වය— සොබා දහමට ඉඩක්" තේමාව යටතේ ජෛව විවිධත්වයේ වටිනාකම ඉස්මතු කරමින් සැමරීම සිදු කරන ලදි. මෙයට සමගාමීව දිවයිනේ සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සර්ව ආගමික සිද්ධස්ථානවල හා පොදු ස්ථාන වල රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරන ලදි.

**ලෝක කාන්තාරීකරණය හා නියඟය වැළැක්වීමේ දින සැමරුම් වැඩසටහන.**

**(2020 ජුනි 17)**

පාර්ශවකාර ආයතන නිලධාරීන් හා පරිසර අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

**ජාත්‍යන්තර ප්ලාස්ටික් බෑග් වලින් තොර දිනය සැමරුම් වැඩසටහන.**

**(2020 ජූලි 03)**

ප්ලාස්ටික් අපද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. මෙයට සමගාමීව විකල්ප මලු ඇතුලත් ප්‍රදර්ශනයක් පැවැත් වූ අතර විකල්ප ප්‍රවර්ධනය සඳහා සහභාගී වූ සැමට රෙදි බෑගයක් ලබාදෙන ලදී

**අන්තර්ජාතික කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණ දින සැමරුම් වැඩසටහන.**

**(2020 ජූලි 26)**

පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව අංශය විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව, පුබුදුගම සංරක්ෂිත වනාන්තරයේ හෙක්ටයාර 02 ක පමණ භූමියක කඩොලාන පැළ 3,000 ක් සිටුවීමේ වැඩසටහනක් සිදු කරන ලදී

**නිල් අහස් තලයක් සඳහා පිරිසිදු වාතය පිළිබඳ පළමු ජාත්‍යන්තර දිනය සැමරීම**

**(2020 සැප්තැම්බර් 07)**

පරිසර අමාත්‍යාංශ පරිශ්‍රයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, මොරටුව විශ්වවිද්‍යාලය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යන ආයතනයන්ගේ සම්පත් දායකත්වය ලබා ගන්නා ලදි. තවද උනන්දුවත් දක්වන පිරිසට සහභාගී විය හැකි පරිදි මෙම වැඩසටහන මාර්ගගතව බෙදා හරින ලදි.

**ජගත් ඕසෝන් දිනය**

**(2020 සැප්තැම්බර් 16)**

මොන්ට්‍රියල් සන්ධානය බිහිවී වසර 33ක් සපුරාලීම නිමිතිකර ගනිමින් හා "ජීවය සඳහා ඕසොන් " යන තේමාව පෙරදැරි කරගනිමින් ශ්‍රී ලංකාවද 2020 වර්ෂයේ සැප්තැම්බර් 16 දින ජගත් ඕසෝන් දිනය ගරු පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපේගම පරිශ්‍රයේදී පවත්වන ලදී.



**ආහාර අපතේ යාම සහ ආහාර අපද්‍රව්‍ය අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ ජාත්‍යන්තර දිනය සැමරුම් වැඩසටහන.**

**(2020 සැප්තැම්බර් 29)**

පාර්ශවකාර ආයතන නිලධාරින් හා පරිසර අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

**ලෝක පාංශු දිනය සැමරීම**

**(2020 දෙසැම්බර් 05)**

ලෝක පාංශු දිනය සැමරීමේ වැඩසටහන යටතේ පාසල් සිසු දරු දැරියන් සඳහා පරිශීලනය කළ හැකි පොත් පිංචක් හා අත් පත්‍රිකාවක් සකස්කර බෙදාහැරීම.



**අන්තර්ජාතික කඳුකර දිනය සැමරීම**

**(2020 දෙසැම්බර් 11)**

ශ්‍රී ලංකාව කඳුකර ජෛවවිවිධත්වයේ වැදගත්කම, ඒ සඳහා වූ තර්ජන සහ මෑත කාලීනව සිදුකරන ලද පර්යේෂණ සොයාගැනීම් ජනතාවට ලබාදෙමින් කඳුකර ජෛවවිවිධත්වය සංරක්ෂණය සඳහා ඔවුන්ගේ දායකත්වය ලබාගැනීමේ අරමුණින් එම ක්ෂේත්‍රයේ ප්‍රවීනයින් තිදෙනෙකුගේ සහභාගීත්වයෙන් විද්වත් කතිකාවතක් 2020 දෙසැම්බර් මස 12 දින ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශනය කරන ලදී.

## 2.1.10 ආයතනික කටයුතු

| | |
|---|---|
| **සේවා ස්ථිර කිරීම්** | |
| දෙපාර්තමේන්තුගත විධායක | 18 |
| සංවර්ධන නිලධාරී | 07 |
| රාජ්‍ය කළමනාකරණ සේවය | 01 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 1 |
| **උසස් කිරීම්** | |
| දීපව්‍යාප්ත සේවා | 08 |
| රාජ්‍ය කළමනාකරණ සේවය | 03 |
| කාර්යාල සේවක සේවය | 01 |

| | |
|---|---|
| **විශ්‍රාම ගැන්වීම්** | |
| රාජ්‍ය කළමනාකරණ සේවය | 02 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 02 |
| කාර්යාල සේවක සේවය | 01 |
| වැඩ සටහන් සහකාර | 01 |
| **ඉල්ලා අස්වීම්** | |
| දෙපාර්තමේන්තුගත මාණ්ඩලික | 01 |
| උපාධිධාරී අභ්‍යාසලාභී | 03 |
| **ණය ලබා දීම්** | |
| ආපදා ණය | 52 |
| දේපළ ණය | 03 |
| **තැපැල් ඡන්ද සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම්** | 174 |
| **හැඳුනුම්පත් සකස් කිරීම්** | 18 |
| **පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම්** | 06 |
| **වාර්ෂික වාර්තා හා කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත්** | 01 |
| **සහනදායී පදනම මත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම්** | 28 |
| **අමාත්‍ය මණ්ඩල සංදේශ** | 26 |

## 2.1.11 අභ්‍යන්තර විගණන අංශය

**අමාත්‍යාංශය හා ඊට අයත් ආයතනවල අභ්‍යන්තර පාලනය විධිමත්ව ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා ඇත.**

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2020 වර්ෂය සඳහා සකස් කරන ලද විගණන සැලසුමට අනුව 2020 වසර තුල අභ්‍යන්තර විගණන පරීක්ෂණ13 ක් සිදු කර ඇති අතර අදාළ පාර්ශව වල සහභාගිත්වයෙන් කාර්තුමය විගණන හා කළමනාකරණ කමිටු පවත්වා ඇත.

2020.07.21 - පළමු විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

2020.12.22 - දෙවන විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

## 2.1.12 විමර්ශන අංශය

අමාත්‍යාංශය හා එය යටතේ පවතින ආයතනවලට අදාළව ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා විමර්ශන අංශයක් පිහිටුවා ඇත. මහජනයා හා විවිධ සංවිධාන හා ආයතනවලින් අමාත්‍යාංශයට ලැබෙන ගැටලුවලට අදාළ සිදුවීම් මෙන්ම විෂමාචාර හා ඒවා නැවත සිදුවීම වැළැක්වීම සඳහා නිර්දේශ ලබාදීම, විමර්ශනවලින් අනාවරණය වන කරුණු අනුව විනය ක්‍රියා සිදුවීම් සඳහා නිර්දේශ ලබාදීම, විමර්ශණ 14ක් මේ වන විට නිම කර ඇත.

# 2.2 පරිසර අමාත්‍යශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය

## 2.2.1 මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය

### සමස්ත අරමුණ

**දේශගුණික විපර්යාසයන්ගේ බලපෑමට ලක්වූ වර්ෂාපතන විචලතාවයන්ට (දැඩි වර්ෂාපතනයන් හා දිගුකාලින නියඟයන්ට) එරෙහිව ප්‍රජා ජීවනෝපායයන් හා ආහාර සුරක්ෂිතතාව සනාථ කිරීම.**




**ව්‍යාපෘතියේ අරමුණු**

ගෘහාශ්‍රිත ආහාර සුරක්ෂිතතාව වර්ධනය කිරීම හා වැසි දියෙන් වගා කරන ගොවි පවුල් සඳහා නම්‍යශීලී ජීවනෝපායයන් ගොඩනැංවීම.

දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම් සහිත වර්ෂාපතන විචලතාවය හා සම්බන්ධ අවදානම් අඩු කිරීමට හා ග්‍රාමීය සහ ප්‍රාදේශීය මට්ටමින් සේවා සැපයීමේ ආයතනික ශක්‍යතාවය ගොඩනැංවීම. අනුහුරුවීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු, පුහුණුව හා යටිතල පහසුකම් සැලසීම මෙන්ම ගොවි සංවිධාන සවිබල ගැන්වීම.

**ගෙවතු වගා සංවර්ධනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රා නි. වසම් | සුළු ගොවි සංවිධාන | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| නුවරඑළිය | වලපනේ | 103 | 113 | 5,445 |
| පොළොන්නරුව | මැදිරිගිරිය | 20 | 52 | 6,898 |
| | ලංකාපුර | 13 | 18 | 1,696 |
| එකතුව | | **136** | **183** | **14,039** |

ආරම්භයේ සිටම ව්‍යාපෘතිය විසින් ගෙවතු වගාව සඳහා කටයුතු සිදුකලේ බෝග විවිධාංගීකරණය මූලික කොටගත් කෘෂි වන වගා ක්‍රමයටය. මෙහිදී ගොවි පවුලේ ආහාර සුරක්ෂිතතාවය සහ අමතර ආදායමක් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරදීම සිදුකරයි. බහු වාර්ෂික බෝග වගාවන් ලෙස පොල්, කජු, පළතුරු හා වන වගා ලෙස කායා



පැළ ලබා දුන් අතර කාලීන බෝග ලෙස මුං කවුපි සහ රටකජු ලබා දුනි. වගාවට ජල අවශ්‍යතාවන් සපුරාගැනීම සඳහා කෘෂි ළිං ලබා දීමත් ක්‍රමවත් ජල සම්පාදනය සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ලබාදීමත් සිදුකෙරිණි.

ගොවින් කාබනික ගොවිතැන කෙරෙහි දැනුවත් කර ඒ පිළිබඳ නිසි පුහුණුවක් ලබාදීම සිදු කෙරිණි. එමගින් විශේෂ වෙළඳපලක් හා නිෂ්පාදනය වැඩි කර ගැනීමත්, පවුලේ ආහාර සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පවත්වා ගැනීමටත්, ආදායම වැඩිකර ගැනීමට හැකියාව ලැබිණ.

**නියඟයට ප්‍රතිරෝධී බෝග හා වගා ක්‍රම හඳුන්වාදීම**

නියඟයට ප්‍රතිරෝධී බෝග වගාවන් සඳහා පුහුණුව හා බීජ ලබාදීමත් පාංශු ජල සුරක්ෂිතතාව සඳහා වැටි දැමීම, ගල් වැටි දැමීම, ජල බඳුන් මගින් ජලය සැපයීම (කජු සහ පොල් සඳහා) ක්ෂුද්‍ර ජල සම්පාදනය හඳුන්වා දීමත් ආරක්ෂිත ගෘහතුළ වගාවන් සිදුකිරීම (ගොවින් 55ක් ) සඳහා පුහුණුව ලබා දී ඇත. එමගින් කාබනික වගාව ව්‍යාප්තියත් වසර පුරා ආදායම් ලබා ගැනීමේ හැකියාවක් ඇති විය.

**විකල්ප ආදායම් මාර්ග හඳුන්වාදීම**

දිගුකාලීන නියඟය හේතුවෙන් ගොවිතැනින් ජීවත්වන්නන් වෙනුවෙන් විකල්ප ජීවනෝපාය ඇතිකිරීම තුළින් ගොවිපවුල්වල ජීවන තත්ත්වයන් ස්ථාවර කිරීමට හැකිවිය. මේ යටතේ අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදනය, ඇඟලුම් කර්මාන්ත, සපත්තු, විසිතුරු භාණ්ඩ, බෑග් නිෂ්පාදනය හා සත්ත්ව පාලන කටයුතු හඳුන්වාදීම සිදු කෙරිණ. මේ සඳහා ගොවි පවුල්වල කාන්තාවන් සහභාගී කර ගන්නා ලදී.



**පසු අස්වනු තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීම**

කිරි, යෝගට්, අයිස්ක්‍රීම්, පලතුරුබීම, බෝතල්කල ආහාර, වියළි එළවළු වර්ග ආදී නිෂ්පාදන සඳහා අවශ්‍ය පුහුණුව හා යන්ත්‍රෝපකරණ නිෂ්පාදන කණ්ඩායම් සඳහා ලබාදෙන ලදී.

**ගොවි සංවිධාන ශක්තිමත් කිරීම**

පොදු අවශ්‍යතා ලබා දීමේදී ගොවි සංවිධාන මූලික කර වැඩසටහන් ක්‍රියාත්මක විය. දේශගුණික විපර්යාසයන් කෙරෙහි ඔවුන් දැනුවත් කරමින් එම වෙනස්කම් වලට මුහුණපාමින් ජීවන තත්ත්වය ගොඩනගා ගැනීමට අවශ්‍ය පුහුණුව ලබාදීම.

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් මෙහෙයවන නිලධාරීන් පුහුණු කිරීම හා අවශ්‍ය උපකරණ ආදිය එම ආයතන වෙත ලබාදීම සිදුකරන ලදී.

| | මැදිරිගිරිය / ලංකාපුර | වලපනේ | එකතුව |
|---|---|---|---|
| පුහුණු වැඩසටහන් | 183 | 53 | 236 |
| සහභාගීවූවන් ගණන | 7,199 | 2,970 | 10,169 |
| වියදම රු. මි. | 0.0428 | 0.81 | 0.8528 |

**ජල පෝෂක කලාප සංරක්ෂණය කිරීම**

ග්‍රාමීය වැව් ආශ්‍රිතව අවට කලාප හඳුනාගැනීම හා වන වගාවන් මගින් රක්ෂිත ඇතිකිරීමත් වාරි ඇලමාර්ග දෙපස කුඹුක් වැනි වන පැළ සිටුවීම.

**නායයාම් පිළිබඳව පූර්ව හඳුනාගැනීමේ උපකරණ පද්ධති සවිකිරීම.**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල මෙම උපකරණ පද්ධති ස්ථානගත කරන ලදී. එහිදී එම උපකරණවලින් ලබාදෙන දත්ත කොළඹ සිට අධ්‍යනය කල හැකිවන අතර අනතුරු ඇඟවීම සඳහා ග්‍රාමීය නිලධාරීන් සම්බන්ධකර ගැනීමට හැකිවේ.





# 2.2.2 පාරිසරික සංවේදී භූමි ප්‍රදේශ වල ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ (ESA) ව්‍යාපෘතිය

පරිසර අමාත්‍යාංශය පස් අවුරුදු සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කරන පාරිසරික සංවේදී භූමි ප්‍රදේශ වල ජෛව විවිධත්වය සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහය ලැබෙන අතර, ජගත් පාරිසරික පහසුකම (GEF) මගින් මූල්‍යාධාර සපයනු ලබයි.




ජෛව විවිධත්වයට සිදු වන තර්ජන අවම කර ගැනීම උදෙසා, ඉහළ සංරක්ෂණ වැදගත්කමක් සහිත පරිසර සංවේදී භූමි ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් සංරක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශිත ප්‍රදේශයන්ට පරිභාහිරව පවතින පරිසර පද්ධති සේවාවන් හා ජෛව විවිධත්වය අතින් අතිශයින් වැදගත්කමකින් යුතු පරිසර සංවේදී කලාප හඳුනාගෙන ජෛව විවිධත්වය සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය මූලික කරගත් ඉඩම් පරිහරණ සැලසුම් රටාවක් තුළින් පරිසර පද්ධති කළමනාකරණය සංවර්ධනය සමඟ අනුප්‍රවාහගත කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ.

පරිසර පද්ධති කළමනාකරණය සමඟ සංවර්ධනය අනුප්‍රවාහගත කිරීම මඟින් ශ්‍රී ලංකාව තුළ දිගු කාලීනව තිරසර සංවර්ධනය තහවුරු කර ගැනීමට මෙම ව්‍යාපෘතිය හරහා මූලික පදනම සැලසෙනු ඇත. එසේම මෙම ව්‍යාපෘතියේ අත්දැකීම් ශ්‍රී ලංකාවේ අනෙකුත් පාරිසරික සංවේදී කලාප සඳහා ඉදිරියේදී යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

ප්‍රතිඵලය 1: පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණය කිරීම සඳහා ආයතනික හා නීතිමය රාමුවක් ඇති කිරීම සහ මාර්ගෝපදේශ සැකසීම

ප්‍රතිඵලය 2: කලා ඔය ද්‍රෝණියේ පාරිසරික සංවේදී කලාප වල ජෛව විවිධත්ව සංරක්ෂණය

මෙම ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

පරිසර සංවේදී භූමි කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග සකස් කෙරෙමින් පවතී.

ලංකාව පුරා ඇති පරිසර සංවේදී කලාප හඳුනා ගැනීම පිළිබඳ ජාතික පරිමාණ සැලැස්ම සැකසීම. (National Scale up plan) සකස් කෙරෙමින් පවතී.

අනුරාධපුර හා පුත්තලම දිස්ත්‍රික් තුළ දිස්ත්‍රික් පහසුකම් කමිටු 02ක් සහ ප්‍රාදේශීය කළමනාකරණ කමිටු 03 දියත් කිරීම.

පුත්තලම එළුවන්කුලමෙහි ඒකාබද්ධ අධීක්ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම

දෙහි වගාව ප්‍රචලිත කිරීම වෙනුවෙන් වගා ආදර්ශන වැඩසටහන් ක්‍රියාත්මක කෙරිනි. කලාඔය ද්‍රෝණිය ආශ්‍රිතව ජීවත්වන මොවුන්ගේ වගාවන්ට නිරන්තරයෙන් වන අලි හානි සිදු වේ. එබැවින් අලි ගමන් ගන්නා මාර්ග අසල ජීවත්වන ගොවීන්ගේ වගා ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙම දෙහි පැළ රෝපණය කරන ලදි.

එළුවන්කුලම වේවැල්කැලේ යෝජිත පාරිසරික සංවේදී කලාපයේ රාජමඩුව ගම්මානයේ වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කරන ප්‍රජාව හමුවී ගැටළු හා යෝජනා සාකච්ඡා කිරීම



පාසල් ළමුන්ගේ ගෙවතු තුළ පැළ කිරීම සඳහා ඌන භාවිත පලතුරු පැළ, බිජ අඹ පැළ සහ කොස් පැළ බෙදා දීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීව වැට සඳහා දෙහි පැළ ලබා දීම

ශ්‍රී ලංකාවේ වන අලි සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. අනෙකුත් වන ජීවීන් කළමනාකරණය පිළිබඳ උපායමාර්ගික රාමුව සකසා ඇත. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුව ඇත.







ප්‍රතිලාභීන් වෙත රෝපණ ද්‍රව්‍ය / පැළ බෙදාදීම සහ දැනුවත් කිරීමේ අවස්ථාවන්

## 2.2.3 පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ විදුලි ට්‍රාන්ස්ෆෝමර් සහ වැල්ඩින් ට්‍රාන්ස්ෆෝමර් වල **PCB** අඩංගු තෙල් සහිත ට්‍රාන්ස්ෆෝමර් හඳුනාගෙන එහි ඇති ට්‍රාන්ස්ෆෝමර් තෙල් සහ භාවිතයෙන් ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර් පරිසර ආරක්ෂිත ලෙස බැහැර කිරීමයි.

මෙයට අදාලව වෙල්ඩින් අංශයේ ඉන්වෙන්ට්‍රිය සාදා නිම කර ඇති අතර ට්‍රාන්ස්ෆෝමර් තෙල් සාම්පල්, පරික්ෂාව සඳහා ඉදිරිපත්කර ඇත. **PCB** සහිත තෙල් සඳහා පිරිසිදු තෙල් ලබාදීම සිදු කිරීමට අපේක්ෂා කෙරේ. බලශක්ති අංශයේ **PCB** ට්‍රාන්ස්ෆෝමර් ඉන්වෙන්ට්‍රිය සකස් කිරීම ද නිම කර ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ බලශක්ති (Utility) සහ වෑද්දුම් (Welding) ක්ෂේත්‍ර සඳහා පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් (PCB) පිළිබඳ, තාක්ෂණික අත්පොත් හා පුහුණු අත්පොත් සකස් කර ඇති අතර මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ UNIDO **ආයතනය සහ රාජ්‍ය නොවන ආයතනයක් වන "People to People Volunteers" , වෙල්ඩින් ක්ෂේත්‍රයේ ඇති PCB අඩංගු තෙල් සහ උපකරණ බැහැර කිරීම සඳහාත් PCB අඩංගු තෙල් වෙනුවට පිරිසිදු තෙල් වෑද්දුම්කරුවන් වෙත ලබාදීම සඳහාත් ගිවිසුමක් අත්සන් කර ඇත.**

උපද්‍රවකාරී අපද්‍රව්‍ය ගෙනයාම සඳහා විශේෂිත වූ වාහනයක් සහ තාවකාලික ගබඩාවක් PPV මගින් මේ වනවිට සකස්කර ඇත.

**ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය යාවත් කාලීන කිරීම**

2007 වසරේ සාදන ලද ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය “අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය” ලෙස යාවත් කාලීන කරන ලදී. මෙහිදී ඝන අපද්‍රව්‍යවලට අමතරව ද්‍රවමය සහ වායුමය අපද්‍රව්‍ය මෙම ප්‍රතිපත්තියට ඇතුලත් කරන ලද අතර, දැනට ඇති වී තිබෙන නව අභියෝග වලට සරිලන ලෙස ක්ෂුද්‍ර ප්ලාස්ටික්, ගොඩනැගිලි අපද්‍රව්‍ය, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, සහ අනෙකුත් උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය ද මෙයට ඇතුලත් කරන ලදී. මෙම ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.

**ජාතික රසායනික ද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කිරීම**

මේ වනවිට රසායනික කළමනාකරණ ප්‍රතිපත්ති කෙටුම්පත සකස්කර ඇත. මෙම ප්‍රතිපත්තිය සෑදීම මගින් රසායනික ද්‍රව්‍ය වල ජීවන චක්‍ර කළමනාකරණයක් ඇති කිරීමට හැකිවනු ඇත. මෙම ප්‍රතිපත්තියට විෂ කෘෂිරසායන ද්‍රව්‍ය හා උපද්‍රවකාරී කාර්මික රසායන ද්‍රව්‍ය, දිගුකල් පවත්නා කාබනික දූෂක (POP) දිගුකල් පවත්නා ජෛව සංචයන ද්‍රව්‍ය (PBT ) අඩංගු වන අතර මෙම රසායනික බොහොමයක් අන්තරාසර්ග වියවුල්කාරක (Endocrine Disruptors – EDC) වේ. මෙම ප්‍රතිපත්තිය අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය, වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය ප්‍රතිපත්තිය ඇතුළුව අනෙකුත් ජාතික හා ආංශික ප්‍රතිපත්ති සහ රෙගුලාසි සමඟ සම්බන්ධීකරණය වේ. තවද මෙම ප්‍රතිපත්තිය තිරසාර රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා පදනමක් ගොඩනැගීමට ඉවහල් වේ. ප්‍රතිපත්ති කෙටුම්පත දෙමළ සහ සිංහල භාෂාවට පරිවර්තනය කර ඇත. මෙම ප්‍රතිපත්තිය පිළිබඳ මහජන අදහස් විමසීම සඳහා 2020.12.28 දින භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් පලකරන ලද අතර එය මහජනතාව සඳහා මසක කාලයක් විවෘතව පවතී.



ව්‍යාපෘති ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා දී CEB නිලධාරීන් හමුවීම

## 2.2.4 මිනමාටා සම්මුතිය යටතේ "රසදිය මූලික තක්සේරු වාර්තාව" පිළිබඳ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මගින් සෞඛ්‍ය, කාර්මික හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි රසදිය භාවිතය පිළිබඳ දීප ව්‍යාප්ත සමීක්ෂණයක් මගින් මූලික තක්සේරු වාර්තාවක් සකස් කිරීම සිදුවේ.

මේ වන විට ඉහත ක්ෂේත්‍ර සඳහා ඉන්වෙන්ට්‍රියක් සකසා ඇත. රසදිය මූලික තක්සේරු වාර්තාව පිළිබඳ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව මගින් අප රට තුල රසදිය කළමනාකරණ කටයුතුවල ප්‍රගතිය, සමාලෝචනය කරනු ලැබේ.

මෙම දැනුම රට තුල රසදිය කළමනාකරණ කටයුතු වලට යොදා ගන්නා අතර මේ වන විට අධ්‍යාපන ක්ෂේත්‍රය රසදිය භාවිතය අවම කර ඇති අතර, සෞඛ්‍ය අංශය රසදිය භාවිතයෙන් බැහැර වෙමින් පවතී.

මෙම ව්‍යාපෘතිය පාසල් දරුවන් සහ රන් භාණ්ඩ සාදන කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට රසදිය භාවිතය නිසා ඇතිවන සෞඛ්‍ය තර්ජන පිළිබඳව දැනුවත් කරන අතර පරිසර හිතකාමී ලෙස එම කටයුතු සිදු කිරීමේ ක්‍රමවේද හඳුන්වා දෙයි

**මිනමාටා මූලික ඇගයීම් ව්‍යාපෘතිය (දෙවන අදියර)**

රන් භාණ්ඩ සාදන කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් පිළිබඳ සමීක්ෂණයක් කිරීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. මේ වන විට කොළඹ, ගම්පහ, මහනුවර, බදුල්ල, ගාල්ල, මාතර හා යාපනය යන දිස්ත්‍රික්ක වල සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

මෙම සමීක්ෂණය කුඩා පරිමාණ රන්කරුවන්ගේ රසදිය භාවිතය පිළිබඳ කරුණු සොයා ගැනීමට ඉවහල් වන අතර එමගින් රසදිය වෙනුවට විකල්ප හඳුන්වාදී ඔවුන්ගේ සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කිරීමට උපකාරී වනු ඇත. කුඩා පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදන අංශයේ රසදිය භාවිතය පිළිබඳ සමීක්ෂණයේ අවසාන වාර්තාව එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන ආයතනය (UNIDO) සහ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කර ඔවුන්ගේ නිර්දේශ ලබා ගන්නා ලදී.

කුඩා පරිමාණ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සිදු කල සමීක්ෂණය මගින් සොයාගනු ලැබූ රසදිය වෙනුවට භාවිතා කළහැකි විකල්ප වල පරිසර හිතකාමී බව සහ ආර්ථික ශක්‍යතාව රසායනාගාර පරීෂණ මගින් තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

කුඩා පරිමාණ ස්වර්ණාභරණ නිපැයුම් කරුවන්ගේ හිස කෙස් සහ මුත්‍රා සාම්පල තුල රසදිය මට්ටම් පරීක්ෂා කර බැලීම සඳහා සකස් කල පර්යේෂණ යෝජනාව තව දුරටත් වැඩි දියුණු කරන ලදී. තවද රසදිය අන්තර්ගත අපද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැර කිරීම පිළිබඳ වැඩසටහනක් සකස් කරමින් පවතී.



## 2.2.5 මධ්‍යම කඳුකරයේ හායනයට පත් වූ කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ මධ්‍යම කඳුකරයේ මහනුවර, බදුල්ල සහ නුවරඑලිය යන දිස්ත්‍රික්කයන් හි කෘෂිකාර්මික ඉඩම් හායනය නැවැත්වීම සහ හායනයට පත් වූ ඉඩම් නැවත පුනරුත්ථාපනය කිරීමයි.

**තිරසාර ඉඩම් කළමනාකරණය සඳහා ජල පෝෂණ ප්‍රදේශ කළමනාකරණය**

මෙම ව්‍යාපෘතිය මගින් මෙලෙස සැකසූ සහභාගීත්ව ඉඩම් පරිහරණ සැලසුම් නවයක් ක්‍රියාවට නංවා ඇති අතර ඉතිරි සැලසුම් ඉහත සඳහන් පාර්ශවකරුවන් විසින් ඔවුන්ගේම අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

ජල හා සනීපාරක්ෂක මණ්ඩලය වැනි සමහර ආයතනවල සහාය ඇතිව දැනටමත් ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සැලසුම් 11 ක් ක්‍රියාත්මක කර ඇත. එසේම මෙම අත්දැකීම් මත පදනම්ව දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා පූර්ණ සැලැස්මක් සැකසීම මේ වන කොට සිදු කර ඇත.

**තිරසාර භූමි කළමනාකරණ ආදර්ශන පිහිටුවීම**

හෙක්ටයාර 717 ක් ආවරණය වන පරිදි ව්‍යාපෘති දිස්ත්‍රික්ක තුනෙහි තනි ගොවි ආදර්ශන ස්ථාන හැත්තෑපහක් (75) ස්ථාපිත කර ඇති අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ක්ෂුද්‍ර ජල පෝෂක එක බැගින් ආදර්ශන ලෙස වැඩි දියුණු කරමින් පවතී.

මෙම ව්‍යාපෘතිය මගින් ගොවීන් 2784 ක් සෘජුවම පුහුණු කර ඇති අතර පාර්ශවකරුවන්ගේ ආයතන විසින් හෙක්ටයාර 2650 ක් ආවරණය වන පරිදි ගොවීන් 6050 ක් පුහුණු කරන ලදී

**තිරසාර භූමි කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම**

යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහතිකකරණය (GAP) මගින් තිරසාර භූමි කළමණාකරනය ප්‍රවර්ධනය සඳහා කාගිල්ස් ආයතනය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් යනු ගොවීන්ගේ ලාභදායීතාවය ඉහළ නංවමින් ගුණාත්මක නිෂ්පාදන නිපදවීම සඳහා අත්‍යවශ්‍ය වන භාවිතයන් ය. පුද්ගලයින් 80 දෙනෙකු යෙදවුම් ලබාදීම සහ ධාරිතා සංවර්ධනය මගින් සහතික ලත් ගොවීන් බවට පත් කිරීමට ව්‍යාපෘතිය සහය වේ.

**තිරසාර භූමි කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති හා ආයතනික ව්‍යුහය සමාලෝචනය**

තිරසාර භූමි කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ගැටළු හිඩැස් හඳුනා ගැනීම සඳහා පවත්නා ඉඩම් ආශ්‍රිත ජාතික ප්‍රතිපත්ති සමාලෝචනය කළ අතර නිර්දේශ අටක් ඉදිරිපත් කරන ලදී.

**පරිසර පද්ධති ඇගයීම සහ තිරසාර භූමි කළමනාකරණය සඳහා නව්‍ය අරමුදල් ක්‍රියාත්මක කිරීම**

**කෘෂි ව්‍යාප්තිය සඳහා ගොවි ක්ෂේත්‍ර පාසැල් ක්‍රමවේදය යොදා ගැනීම**

සම්ප්‍රදායික ඉහල සිට පහලට යන ගොවි පුහුණු රටාව වෙනුවට සහභාගීත්ව පුහුණු ක්‍රමවේදයක් මෙහිදී භාවිතා කරයි. මේ යටතේ ගෙවතු වගාව, බීජ අල නිෂ්පාදනය, එළවලු GAP සහතිකකරණය යටතේ ප්‍රවර්ධනය කරනු ලබයි.





# 2.2.6 ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකාව මොන්ට්‍රියල් සන්ධානයේ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම මගින් ඕසෝන් වියන හායනය වැලැක්වීම උදෙසා ඉතා සුවිශේෂී දායකත්වයක් දැක්වූ අතරම 2016 වර්ෂයේදී කිගාලි සංශෝධනයට අනුගතවීමත් සමග වායුගෝලීය උෂ්ණත්වය ඉහලයාම වළක්වාලීම උදෙසා ද විශේෂ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම ආරම්භ කෙරිණි.

2020 වර්ෂයේදී ජාතික ඕසෝන් ඒකකය මගින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් මගින් සුවිශේෂී ප්‍රගතියක් අත් කර ගන්නා ලදී.

- ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව (PSC) 2020 මාර්තු 10 වන දින රැස්වූ අතර එහිදී මොන්ට්‍රියල් සන්ධානයෙහි ඉලක්ක සපුරා ගැනීම සඳහා අදාල වන ප්‍රතිපත්ති බලාත්මක කිරීමේ තීරණ රැසකට එළැඹීමේ හැකියාව ලැබිනි.
- HCFC ආනයන පංගු ක්‍රමය (quota distribution) යටතේ 2020 වර්ෂය සඳහා කෝටා නිකුත් කිරීම යටතේ අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතන 16 ක් සඳහා HCFC මෙට්‍රික් ටොන් 156.06 ආනයනය කිරීම සඳහා quota නිකුත් කරන ලදී.
- ඕසෝන් ප්‍රහීනකාරී ද්‍රව්‍ය පරිභෝජනය වාර්තා කිරීම 2019 වසරේ ඕසෝන් ප්‍රහීනකාරී ද්‍රව්‍ය පරිභෝජනය 2020 ජූලි මාසයේදී වාර්තා කරන ලදී.
- ශීතකාරක එකතු කිරීමේ යන්ත්‍ර සහ ශීතකාරක එකතු කිරීමේ සිලින්ඩර (Recovery Machines & Recovery Cylinders) ප්‍රදානය යටතේ ලංකා විදුලි බල මණ්ඩලයට ශීතකාරක ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍රයක් හා ඊට අදාල අමතර උපාංගද (Recycle Machine) ප්‍රදානය කරන ලදී.
- ශීතකරණ හා වායු සමීකරණ ක්ෂේත්‍රයේ නියුතු සේවා හා නඩත්තු ආයතන සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් සකස් කිරීම. මෙවන විට දිස්ත්‍රික්ක 19 ක් ආවරණය වන අයුරින් සේවා සපයන ආයතන 1800 ක ප්‍රමාණයක් ලියාපදිංචි කර ගැනීමේ හැකියාවක් ලැබුණි.
- කිගාලි සංශෝධනය යටතේ ශ්‍රී ලංකාව සඳහා හයිඩ්‍රොෆ්ලෝරෝකාබන් (HFC) තක්සේරු කිරීමේ වාර්තාව (Country Assessment Report) සම්පාදනය සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය සමඟ ගිවිසුම් ගත වීමක් සිදු කර ඇත. ඒ අනුව මෙම වාර්තාව සම්බන්ධයෙන් පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනිම සඳහා ජූලි 31 වන දින වැඩමුළුවක් (validation workshop) පවත්වා අවසන් තක්සේරු වාර්තාව ලබා ගන්නා ලදී.
- 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ HFCs ආනයන බලපත්‍ර නිකුත් කිරීම සඳහා නව ක්‍රමවේදය හඳුන්වාදීම. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සමඟ එක්ව ආනයන කරනු ලබන HFCs ප්‍රමාණය ගණනය කිරීම සඳහා උපයෝගී වන HS කේත (HS code) හඳුන්වදීම සඳහා වන රෙගුලාසි සංශෝධනය කර අංක 2182/10 හා 2020/06/30 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.
- කිගාලි සංශෝධනය යටතේ ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ මහා පරිමාණ පරිශීලකයින් ඉලක්ක කර ගනිමින් පවත්වන ලද වැඩමුළුව/ සාකච්ඡාව 2020 සැප්තැම්බර් මහ 03 වන දින මහ බැංකු විදූ පියසේදී පවත්වන ලදී. මේ සඳහා විවිධ පෞද්ගලික අංශයේ කාර්මික / වාණිජ ක්ෂේත්‍රය නියෝජනය කරමින් පනස් දෙනෙකු පමණ සහභාගී විය.
- ගිනිගන්නා සුළු සහ විෂ සහිත ශීතකාරක සඳහා ප්‍රමිති හඳුන්වා දීම සඳහා එක්සත් ජාතීන්ගේ පරිසර ව්‍යාපෘතියේ (UNEP) හි උපදෙස් පරිදි ඇමෝනියා, හයිඩ්‍රොකාබන්, කාබන් ඩයොක්සයිඩ් වැනි විකල්ප ශීතකාරක සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතීන් සැකසීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ISO ප්‍රමිතීන් මිලදී ගන්නා ලදී.
- ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීමේ XIII අදියර සඳහා වන යෝජනාව සකස් කර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි ශ්‍රී ලාංකීය කාර්යාලය සමඟ එක්වී ජාතික ඕසෝන් ඒකකය (NOU) විසින් සකස්කර 86 වන විධායක කමිටු (ExCom) රැස්වීමේදී සලකා බැලීම සඳහා ඕසෝන් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

## 2.2.7 ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීමේ ව්‍යාපෘතිය (SLTNC)

දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීම මගින් එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි (UNFCCC) පාර්ශව රාජ්‍යයන් විසින් දේශගුණ විපර්යාස පිළිබඳ වැදගත් තොරතුරු ඉදිරිපත් කල හැකි ක්‍රමවේදයකි. පාර්ශව රාජ්‍යයන්ට ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීම හා සම්බන්ධයෙන් පවතින ගැටලු, අඩු ලුහුඩු හා වාර්තාකරණයේදී අවශ්‍ය වන තාක්ෂණික මෙන්ම මූල්‍ය අවශ්‍යතා ඉදිරිපත් කළ හැකි වේ. ඒ අනුව, ශ්‍රී ලංකාව පළමු ජාතික සන්නිවේදන වාර්තාව 2000 හා දෙවන සන්නිවේදන වාර්තාව 2012 සකස් කර එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීම (TNC) සඳහා 2016 මාර්තු මස 18 වන දින එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමග පරිසර අමාත්‍යාංශය අත්සන් තබන ලදී. තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද අතර වසර තුනක කාලයක් එනම්, 2016 -2018 අතර කාලයේදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් මගින් ක්‍රියාත්මක කළ යුතු වුවද එම වාර්තාව සැකසීමට අදාල දත්ත රැස් කිරීමේදී පැවති විවිධ හේතුද ශේෂ වූ සංස්කරණ කටයුතුද දැනුවත් කිරීම්ද වලංගුතාවය තහවුරු කිරීම් සාධාරණියකරණය මත 2020 වසර අවසානය දක්වා දිගුවක් ලැබිණි.

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි (UNFCCC) එකඟතාවයන්ට අනුව හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට හා දේශගුණික විපර්යාසවලට අනුහුරුවීම සඳහා වන උපායමාර්ග ඵලදායි ලෙස සකස් කර පාර්ශවකරුවන් සතු තාක්ෂණික හා මානව සම්පත් ප්‍රයෝජනයට ගනිමින් තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීමයි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා ගෝලීය පාරිසරික පහසුකම (Global Environment Facility) යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි සහයෝගයෙන් යුතුව ඇමරිකානු ඩොලර් 500,000 ක මූල්‍යමය ප්‍රදානයක් ලැබිණි.

ප්‍රගතිය 2020 ජනවාරි සිට දෙසැම්බර් කාලසීමාව තුළ;

(අ) කෙටුම්පත් කරන ලද තෙවන ජාතික සන්නිවේදන වාර්තාවෙහි ප්‍රධාන සංරචක සඳහා අදාල පාර්ශ්වකරුවන්ගේ, විශේෂඥයින් සහ විශේෂඥ කණ්ඩායම්වල තාක්ෂණික අදහස් හා යෝජනා ලබා ගන්නා ලදී.

(ආ) තෙවන ජාතික සන්නිවේදන වාර්තාවෙහි ඇතුලත් කරුණු පිළිබඳ අවසන් වැඩමුළු තුනක් පවත්වා පාර්ශවකරුවන්ගේ පුළුල් සහභාගීත්වයෙන් එම වාර්තාව සඳහා පාර්ශ්වකරුවන්ගේ අදහස් හා යෝජනා ලබා ගන්නා ලද අතර එමගින් තවදුරටත් එම වාර්තාව වැඩි දියුණු කරන ලදී.

(ඇ) තෙවන ජාතික සන්නිවේදන වාර්තාවෙහි ඇතුලත් කරුණු පිළිබඳව වඩාත් සුපරීක්ෂාවට ලක් කරමින් එම වාර්තාව වැඩි දුරට දියුණු කරන ලදී.

(ඈ) තෙවන ජාතික සන්නිවේදන වාර්තාහෙි සියලුම සංරචක ගොනු ගත කිරීම අවසන් කර ඇත.

(ඉ) දේශගුණ විපර්යාස පිළිබඳව දැනුවත් කිරීමේ පත්‍රිකා සිංහල. දෙමල හා ඉංග්‍රීසි භෂා වලින් සකස් කරන ලදී.

එමෙන්ම, තෙවන ජාතික සන්නිවේදන වාර්තාව ඵලදායී මෙන්ම, ව්‍යාපෘතියේ උපාය මාර්ගික රාමුව තුල වඩාත් කැපී පෙනෙන දියුණුවක් ඇති කර ගැනීමට එම ව්‍යාපෘති මණ්ඩලයේ, දේශගුණ විපර්යාස අවම කිරීම හා අනුහුරුවීමේ විද්වත් කමිටුවල පූර්ණ එකඟතාවය මත සකස් කරන ලදී.



# 2.2.8 දේශගුණික විපර්යාස අවම කිරීමේ හවුල්කාරිත්ව ව්‍යාපෘතිය

පරිසර අමාත්‍යාංශය විසින් වෙළඳපල සූදානම පිළිබඳ යෝජනාව (MRP) සාර්ථකව ඉදිරිපත් කිරීමෙන් පසුව, MRP හි දක්වා ඇති පරිදි යෝජිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවට ඇමරිකානු ඩොලර් මිලියන 3 ක ප්‍රදානයක් PMR විසින් අනුමත කරන ලදී. මෙම මුළු ප්‍රදානයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 1.8 ක් ලබන්නා විසින් (ශ්‍රී ලංකාව) ක්‍රියාත්මක කරන අරමුදල (RETF) ලෙසත්, ඇමරිකානු ඩොලර් මිලියන 1.2 ක් ලෝක බැංකුව මගින් ක්‍රියාත්මක කරන අරමුදල ලෙසත් (BETF) වෙන් කර ඇත.

## අරමුණු.

කාබන් මිල නියම කිරීමේ උපකරණ හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම මගින් හරිතාගාර වායු විමෝචනය (Green House Gas Emission) අඩු කර දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා වන ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (NDCs) යටතේ අවම කිරීමේ ඉලක්ක කරා ළඟා වීම.

අධීක්ෂණ, වාර්තාකරණ සහ සත්‍යාපන (Monitoring, Reporting and Verification - MRV) පද්ධති, කාබන් හර යෝජනා ක්‍රමය සහ කාබන් ලේඛන වැනි නව යාන්ත්‍රණ ස්ථාපනය කිරීම මගින් GHG විමෝචනය ප්‍රමාණාත්මක කිරීමට සහ "ඉතිරි කළ" කාබන් විකුණුම් මගින් ආදායමක් ලබා ගැනීමට උපකාරී වීම.

පරිසර අමාත්‍යාංශයට පවරා ඇති ව්‍යාපෘති සංරචක ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ උපදේශන සේවා මගිනි.

- සමස්ත ප්‍රතිපත්ති සහයෝගීතාවය ඇගයීම සහ අධීක්ෂණ, වාර්තාකරණ සහ සත්‍යාපන (MRV) පද්ධතිය, ශ්‍රී ලංකා කාබන් ලේඛනය (SLCR) සහ ශ්‍රී ලංකා කාබන් හර යෝජනා ක්‍රමය (SLCCS) සඳහා ප්‍රශස්ත ප්‍රතිපත්ති පැකේජයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර ආරම්භක වාර්තා ඉදිරිපත් කර ඇත.
- අධීක්ෂණ, වාර්තාකරණ සහ සත්‍යාපන (MRV) පද්ධතිය සහ ශ්‍රී ලංකා කාබන් ලේඛනය (SLCR) අභිරුචිකරණය, යෙදවීම, මෙහෙයවීම සහ නඩත්තුව සඳහා වන උපදේශනය, නොවැළැක්විය හැකි තත්වයන් නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් අමාත්‍යාංශය යටතේ යෙදවීම අතහැර ලෝක බැංකුව යටතේ යෙදවීමට ලෝක බැංකුව විසින් නිර්දේශ කළේය.
- ජාතික දේශගුණික විපර්යාස දත්ත හුවමාරු ජාලයක් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර ආරම්භක වාර්තා ඉදිරිපත් කර ඇත.
- නව කාබන් මිලකරණ මෙවලම් (CPIs) සඳහා මාර්ග සිතියමක් සංවර්ධනය කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර ආරම්භක වාර්තා ඉදිරිපත් කර ඇත.
- අධීක්ෂණ, වාර්තාකරණ සහ සත්‍යාපන (MRV) පද්ධතිය සහ ශ්‍රී ලංකා කාබන් ලේඛනය (SLCR) අභිරුචිකරණය, යෙදවීම, මෙහෙයවීම සහ නඩත්තුව සඳහා වන උපදේශනය අතහැර දැමීමට තීරණය කරන ලදී.
- ශ්‍රී ලංකා කාබන් හර යෝජනා ක්‍රමය (SLCCS) සඳහා ආයතනික, නෛතික හා ක්‍රමවේද රාමුව ක්‍රියාත්මක කිරීම/ ස්ථාපිත කිරීම සඳහා වන උපදේශනය අතහැර දැමීමට තීරණය කරන ලදී.
- සන්නිවේදන උපායමාර්ගය, ශක්‍යතා වර්ධනය, සන්නිවේදන සහ ජනමාධ්‍ය ප්‍රකාශන ද්‍රව්‍ය සංවර්ධනය කිරීම සඳහා වන වැඩ සැලැස්මෙහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත.

## 2.2.9 ගෝලීය පාරිසරික පහසුකම යටතේ පවතින එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතියට අදාල ජාතික වාර්තාකරණ ක්‍රියාවලිය

### ජාතික වාර්තාකරණ ක්‍රියාවලිය

GEF Support to UNCCD 2018 National Reporting Process – Umbrella II ව්‍යාපෘතිය එක්සත් ජාතීන්ගේ කාන්තාරීකරණය පිටුදැකීමේ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ භූමි හායනය පිළිබඳව තත්ත්වය වාර්තාකරණය සඳහා පහසුකම් සැලසීමට ලද ව්‍යාපෘතියකි. එක්සත් ජාතීන්ගේ කාන්තාරීකරණය පිටුදැකීමේ සම්මුතියේ ජාතික කේන්ද්‍රස්ථානය ලෙස පරිසර අමාත්‍යාංශයේ භූමි සම්පත් අංශය මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදුකරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ භූමි හායනය පිළිබඳව තත්ත්ව වාර්තාකරණය සඳහා අවශ්‍යය දත්ත රැස්කර, දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

මෙම දත්ත රැස් කිරීමේදී ශ්‍රී ලංකාවේ භූමි හායනය සම්බන්ධයෙන් සමාජ, ආර්ථික දත්තයන් මෙන්ම භූමි ආවරණය, පාංශු කාබනික කාබන් දත්ත හා භූමියේ ඵලදායිතාව පිළිබඳව දත්ත රැස්කිරීමට යෝජිතය. මේ වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාංශු විද්‍යා අධ්‍යයනාංශය හා එක්ව ගිවිසුමකට අත්සන් කර භූමියේ පාංශු කාබනික කාබන් දත්ත සාම්පල් ලබා ගැනීම ආරම්භ කර ඇත. භූමි ඵලදායිතාව පිළිබඳව දත්ත හා සැලසුම් ලබාදීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ද, භූමි ආවරණය පිළිබඳව දත්ත හා සැලසුම් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්මේන්තුව යන ආයතන සම්බන්ධ කරගෙන ලබාගැනීමට එකඟත්වයකට පැමිණ ඇත.

2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මඟින් භූමි සම්පත් අංශයේ ධාරිතා වර්ධනය සිදුකල අතර ඒ සඳහා, ව්‍යාපෘති කටයුතු සඳහා අත්‍යවශ්‍ය ඡායාපිටපත් යන්ත්‍රයක් හා ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් මිලදී ගැනීම සිදුකරන ලදී.



## 2.2.10 ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ කාර්ටජිනා සන්ධානයට අනුගතව ජාතික ජෛව සුරක්ෂිතතා රාමුව ක්‍රියාත්මක කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ ජෛව සුරක්ෂිතතාවයට අදාල තොරතුරු නිෂ්කාශන යාන්ත්‍රණයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම, ජාන විකරණය කල ජීවීන් මගින් සිදුවිය හැකි අවදානම් තක්සේරුව හා කළමනාකරණය සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීම, තාක්ෂණික තොරතුරු සහිත දත්ත පද්ධති සකස් කිරීම, ජාන විකරණය කරන ලද ජීවීන් හඳුනා ගැනීමට අදාල ධාරිතාවන් හා හැකියාවන් වර්ධනය කිරීම, විද්‍යාගාර තාක්ෂණික යටිතල පහසුකම් වර්ධනය කිරීම හා සාමාන්‍ය ජනතාව අතර ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ දැනුම හා අවබෝධය වර්ධනය කිරීම ආදී වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

මෙම ව්‍යාපෘතිය සංරචක 4කින් යුක්ත වන අතර එක් එක් සංරචකයන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

**සංරචක 1 - ජෛව සුරක්ෂිතතාවය සඳහා වූ ප්‍රතිපත්ති, ආයතනික හා නියාමන රාමු ශක්තිමත් කිරීම**

- ජෛව සුරක්ෂිතතා පනත ක්‍රියාත්මක කිරීමේ අධිකාරී බලය පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කරන ලදී.
- ජෛව සුරක්ෂිතතාව සඳහා වූ පරිපාලන හා මෙහෙයුම් ක්‍රියා පටිපාටිය පිළිබඳ අත්පොත කෙටුම්පත් කරන ලදී.
- ජෛව සුරක්ෂිතතා ප්‍රධාන සැලැස්ම කෙටුම්පත් කරන ලදී.
- ජෛව සුරක්ෂිතතා නිෂ්කාශන යාන්ත්‍රණය (Biosafety Clearing House) සැකසීමේ කටයුතු ක්‍රියාත්මක වන අතර එය නඩත්තු කිරීම හා නව තොරතුරු අන්තර්ගත කිරීම පිළිබඳ පුහුණු සැසි දෙකක් ජාතික කේන්ද්‍රීය ආයතනය වන පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා පවත්වන ලදී.

**සංරචක 2—අවදානම් තක්සේරුව, අවදානම් කළමනාකරණය හා අවදානම් සන්නිවේදනය සඳහා වූ පද්ධතිය දියුණු කිරීම**

- ජාන වෙනස් කරන ලද ජීවීන්ගේ අවදානම් තක්සේරු කිරීම සඳහා පහත සඳහන් තාක්ෂණික මාර්ගෝපදේශ සකස් කරන ලදී.
  * විද්‍යාගාරයේ ජාන වෙනස් කරන ලද ජීවීන් ආරක්ෂිතව භාවිතා කිරීම සඳහා වූ මාර්ගෝපදේශ
  * ආයතනික ජෛව ආරක්ෂණ කමිටු සඳහා මාර්ගෝපදේශ
  * ජාන විකරණය කරන ලද ශාක සඳහා ආරක්ෂිත තත්ත්ව යටතේ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම සඳහා මාර්ගෝපදේශ
  * ජාන විකරණය කරන ලද ශාක සඳහා පාරිසරික අවදානම් තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ
  * ජාන විකරණය කරන ලද ආහාරවල ආරක්ෂාව තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ
  * ජාන විකරණය කරන ලද මදුරුවන් පරීක්ෂා කිරීම සඳහා මාර්ගෝපදේශ
- අවදානම් විශ්ලේෂණ රාමුව
- අවදානම් තක්සේරුව සඳහා වන මාර්ගෝපදේශ පිළිබඳව අදාළ පාර්ශවකරුවන් / විශේෂඥයන් පුහුණු කිරීම.

**සංරචකය 3—ජාන විකරණිත ජීවීන් පරීක්ෂා කිරීම හා හඳුනා ගැනීම සඳහා තාක්ෂණික ධාරිතාවය වර්ධනය කිරීම**

- ජාන වෙනස් කරන ලද ජීවීන් පරීක්ෂා කිරීම සඳහා ජාතික ආයතනවල විද්‍යාගාර වැඩිදියුණු කිරීම සඳහා උපකරණ මිළදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම.
- ආහාර සුරක්ෂිතතා නිලධාරීන්, විශ්ව විද්‍යාල/ පර්යේෂණ ආයතනවල විද්‍යාඥයන්, ජාතික බලධාරී ආයතනය හා ආංශික බලධාරී ආයතනවල නිලධාරීන් ජාන වෙනස් කරන ලද ජීවීන් අධීක්ෂණය හා පරීක්ෂා කිරීම පිළිබඳ පුහුණු කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.

**සංරචක 4 - දැනුම සංවර්ධනය , මහජනතාව දැනුවත් කිරීම හා අධ්‍යාපනය හා සහභාගිත්වය**

- ජෛව සුරක්ෂිතතා සන්නිවේදන උපායමාර්ග කෙටුම්පත් කරන ලදී.



ජෛව සුරක්ෂිතතාව පිළිබඳව කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළුව
**- 2020 මාර්තු 10 සහ 11**

# 2.3 අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ප්‍රගතිය

## 2 3 1 මධ්‍යම පරිසර අධිකාරිය

2020 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් මහා පරිමාණ දූෂකාරක කර්මාන්තයන් ("අ" කාණ්ඩයේ කර්මාන්ත) 698ක් සඳහා ද, මධ්‍යම පරිමාණ දූෂකාරක කර්මාන්ත ("ආ" කාණ්ඩයේ කර්මාන්ත) 544ක් සඳහා ද නව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදී ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත මඟින් සිදුවන පරිසර දූෂණය පාලනය කිරීම අරමුණු කොටගෙන ආයෝජන මණ්ඩලයේ කර්මාන්ත 345ක් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ඒකඟතාවය ලබාදෙන ලද අතර පාරිසරික ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක වන ආයෝජන මණ්ඩල කලාප 3ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදෙන ලදි. පාරිසරික ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක නොවන සීතාවක සහ හොරණ ආයෝජන මණ්ඩල කලාප සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත. මීට අමතරව, නව කර්මාන්ත පිහිටුවීම මඟින් සිදුවන විමෝචනයන් හා මුදාහැරීම් පාලනය කිරීම අරමුණු කොටගෙන මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2020 වසර තුළදී නව කර්මාන්ත 730ක් සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කරන ලදි. 2020 වර්ෂය සඳහා වාර්ෂික අනුකූලතා පසුවිපරම් සැලැස්ම මධ්‍යම පරිසර අධිකාරියේ සියළුම පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල එක්ව සකස් කරන ලද අතර, එම සැලැස්මට අනුව "අ" කාණ්ඩයේ කර්මාන්ත 1,640ක් ද, "ආ" කාණ්ඩයේ කර්මාන්ත 1,609 ක් ද පසුවිපරම් කරන ලදි. මධ්‍යම පරිසර අධිකාරිය වෙත 2020 වසර තුළදී මහජන පැමිණිලි 2,634ක් ලැබී ඇත. එම පැමිණිලි අතුරින් පැමිණිලි 2,054ක් මධ්‍යම පරිසර අධිකාරියේ විෂය පථයට සෘජුවම අදාල වන අතර 2020 වසර තුළදී පැමිණිලි 1,338ක් මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල සහ ඒකක මඟින් විසඳා අවසන් කර ඇත.

කාර්මික අපද්‍රව්‍ය මුදා හැරීම මඟින් කැලණි ගඟ ආරක්ෂා කිරීම සඳහා කැලණි ගංගා ද්‍රෝනියේ සංවේදී ප්‍රදේශ වල මහා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථානගත කිරීම සීමා කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඊට සමගාමීව මධ්‍යම පරිසර අධිකාරිය විසින් තාක්ෂණික විශේෂඥ කමිටුවක් ස්ථාපිත කර ඇති අතර එමඟින් නව කර්මාන්ත ස්ථානගත කිරීමට අදාලව නිර්දේශ නිකුත් කරනු ලබයි. 2020 වර්ෂයේදී තාක්ෂණික ඇගයීම් කමිටු 6 ක් පවත්වා ව්‍යාපෘති 36 ක් සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ ලබාදී ප්‍රධාන වශයෙන් කැලණි ගඟ සහ බාහිර පරිසරය වෙත අපද්‍රව්‍ය බැහැර කිරීම් පාලනය කර ඇත. එමෙන්ම කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන් හි කැලණි ගංගා ද්‍රෝණිය අවට ක්ෂණික කර්මාන්ත පසුවිපරම් වැඩසටහනක් ඔක්තෝම්බර් මස 19 සිට 22 යන දිනයන් හිදී පවත්වන ලද අතර එහිදී පවත්නා පරිසර දූෂණ පාලන ක්‍රම වැඩිදියුණු කිරීම සහ කැලණි ගඟ වෙත පිටකරන අපද්‍රව්‍ය ප්‍රමාණය ගණනය කිරීම අරමුණු ඇතිව කර්මාන්ත 1,266ක් පසුවිපරම් කරන ලදි. කැළණි ගඟ අවට සංවේදී ප්‍රදේශ පරීක්ෂා කිරීමේදී කර්මාන්තකරුවන් විසින් දුර්වල රොන්මඩ කළමනාකරණයක් පවත්වාගෙන යනු ලබන බව හඳුනාගන්නා ලදි. එබැවින් වාහන සේවා ස්ථානවලින් ජනනය වන රොන්මඩ කළමනාකරණය සඳහා මාර්ගෝපදේශමාලාවක් කෙටුම්පත් කරන ලදි.

2020 වසර තුළදී කැළණි ගංගාවේ හා අතු ගංගාවන්හි ස්ථාන 17කින් ද, මා ඔයෙහි ස්ථාන 08කින් ද හා දියවන්නා ඔයෙහි ස්ථාන 08කින් ද මාසිකව ජල සාම්පල එකතු කරගන්නා ලද අතර පරාමිතීන් 14 – 23 අතර ප්‍රමාණයක් සඳහා එම සාම්පල මධ්‍යම රසායනාගාරය මඟින් විශ්ලේෂණය කරන ලදි. මධ්‍යම රසායනාගාරයට අනුබද්ධව පළාත් රසායනාගාර 08ක් සහ එක් දිස්ත්‍රික් රසායනාගාරයක් ක්‍රියාකාරිව ක්‍රියාත්මක වේ. කාර්මික අපසන්දන හා මතුපිට ජල තත්ව පසුවිපරම් කිරීම, කර්මාන්තවල අනුකූලතා පසුවිපරම් කිරීම සහ ජල දූෂණය හා සම්බන්ධව පැනනැගෙන ගැටළු අදාල පළාත්/දිස්ත්‍රික් රසායනාගාර විසින් විමර්ෂණය කරනු ලැබේ.

රජය විසින් සුරකිමු ගංගා ජාතික වැඩසටහන සඳහා වෘත්තිකයන්ගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් හා ජනාධිපති කාර්යසාධක බලකායක් පිහිටුවා ඇත . මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල ජාලයේ සම්පූර්ණ සහයෝගීතාවය හා සහභාගීත්වය ඇතිව දිවයිනේ ගංගා 103 හි පවතින දූෂක ප්‍රභව හඳුනා ගැනීම නීති විරෝධී ක්‍රියාකාරකම් හඳුනා ගැනීම පිළිබඳව දීප ව්‍යාප්ත සමීක්ෂණයක් සිදු කරන ලදි .ඒ සම්බන්ධයෙන් භූගෝලීය දත්ත ,පින්තූර හා වීඩියෝ වලින් සමන්විත වාර්තාවක් ඉහත විශේෂඥ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

2020 වර්ෂයේදී රසායනාගාර ප්‍රතීතනය අළුත් කිරීම සඳහා නිරීක්ෂණ විගණනයක් පවත්වන ලද අතර එහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ නව ප්‍රමිතකරණය සඳහා නැවත ඇගයීම කෙරෙහිය. නිරීක්ෂණ විගණනය සාර්ථකව නිම කිරීමෙන් පසුව මධ්‍යම රසායනාගාරය ISO/IEC/17025:2017 යන ප්‍රතීතන සහතිකය ලබාගන්නා ලදි.

පරිසර දූෂණය පාලනය කිරීම සම්බන්ධව සේවා සපයන උපදේශකවරුන්ට සහ පරීක්ෂණාගාර වලට පිළිගැනීමක් ලබා දීම සඳහා රසායනාගාර 23ක් හා උපදේශකවරුන් 59ක් මධ්‍යම පරිසර අධිකාරිය පිළිගත් උපදේශකවරුන් හා පරීක්ෂණාගාර ලෙස ලියාපදිංචි කරගන්නා ලදි. මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි රසායනාගාර වලින් ලබාදෙන සේවාව වඩාත් කාර්යක්ෂම හා සමානාත්වයෙන් පවත්වාගෙන යාම සඳහා 2020 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින්

ශ්‍රී ලංකා රසායනාගාර පරීක්ෂණ සංගමය (Sri Lanka Association of Testing Laboratories) සමඟ එක්ව ජල තත්වය පරීක්ෂාකරන පුද්ගලික රසායනාගාර 29 ක් සහ මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් රසායනාගාර 09 ක් සඳහා ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මෙම ප්‍රවීනතා පරීක්ෂණ වැඩසටහන මගින් pH, ජීව රසායනික ඔක්සිජන් ඉල්ලුම රසායනික ඔක්සිජන් ඉල්ලුම ඝණ අවලම්භිත ප්‍රමාණය සහ ජලයේ දියවන පොස්පේට් වැනි ප්‍රධාන පරාමිතීන් පහක් සඳහා පරීක්ෂණ පවත්වන ලදි.

අඛණ්ඩව වායු තත්වය පසුවිපරම් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් කොළඹ කොටුවේ වායුතත්ව පසුවිපරම් මධ්‍යස්ථානයක් ද බත්තරමුල්ල සහ මහනුවරයන නගරවල ස්වයංක්‍රීය තත්කාල වායු තත්ව පසුවිපරම් මධ්‍යස්ථාන 02ක් ද පවත්වාගෙන යනු ලබයි. වායු තත්ව පසුවිපරම් මධ්‍යස්ථාන 03 මඟින් මිනුම් කරන ලද නියාමන දූෂ්‍ය කාරකයන් සඳහා වූ වාර්ෂික මධ්‍ය සාන්ද්‍රණ අගයන් පහත වගුවේ දැක්වේ.

බලපෑම් ඇගයීමට ලක්කිරීම මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදු කරනු ලබයි. 2020 වසර තුළදී පාරිසරික බලපෑම් ඇගයීම් අනුමැතීන් 02ක් ද මූලික පාරිසරික පරීක්ෂණ අනුමැතීන් 98ක් ද නව ව්‍යාපෘතීන් සඳහා ලබාදෙන ලද අතර පාරිසරික බලපෑම් ඇගයීම් අනුමැතීන් දීර්ඝ කිරීම් 04ක් ද මූලික පාරිසරික පරීක්ෂණ අනුමැතීන් දීර්ඝ කිරීම් 05ක් ද ව්‍යාපෘති කායීයන් අවසන් කර නොමැති ව්‍යාපෘතීන් සඳහා ලබාදෙන ලදි. අනුමැතීන් මඟින් සඳහන් කරන ලද තත්ව වලට අනුකූලව ව්‍යාපෘති සිදු කරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘති 57ක් මෙම වසර තුළදී පසුවිපරම් කරන ලදි. එමෙන්ම අනෙකුත් බලයලත් ආයතනයන්ට ව්‍යාපෘතීන් 44ක් සඳහා මූලික පාරිසරික පරීක්ෂණ හා පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පිණිස මධ්‍යම පරිසර අධිකාරිය විසින් තාක්ෂණික සහාය ලබාදෙන ලදි.

ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන සංවර්ධන කටයුතුවලට අදාල ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් වැනි උපායමාර්ගික තීරණ ගැනීමේ අවස්ථාවන් වලදී පාරිසරික ඇගයම් සිදු කිරීම සඳහා ක්‍රියාරාමුවක් මෙම

| දූෂකය | වාර්ෂික මධ්‍ය සාන්ද්‍රණ අගය | | |
|---|---|---|---|
| | බත්තරමුල්ල වායු තත්ව පසුවිපරම් මධ්‍යස්ථානය | මහනුවර වායු තත්ව පසුවිපරම් මධ්‍යස්ථානය | කොළඹ කොටුව වායු තත්ව පසුවිපරම් මධ්‍යස්ථානය |
| $PM_{10}$ | 35.73 µg/m$^3$ | 38.73 µg/m$^3$ | 57 µg/m$^3$ |
| $PM_{2.5}$ | 21.35 µg/m$^3$ | 15.17 µg/m$^3$ | - |
| $NO_2$ | 11.12 ppb | 8.64 ppb | 8.53×10$^{-09}$ ppm |
| $SO_2$ | 6.93 ppb | 1.13 ppb | 4.84×10$^{-09}$ ppm |
| $O_3$ | 15.62 ppb | 15.72 ppb | - |
| CO | 640 ppb | 604 ppb | - |

මීට අමතරව, ගලි බවුසර් සේවාව විධිමත් කිරීම අරමුණු ඇතිව ගලි සේවා සපයන්නන් ලියාපදිංචි කරගැනීම සඳහා ක්‍රමවේදයක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද අතර 2020 වර්ෂයේදී ගලි බවුසර් සේවා සපයන ආයතන 24 ක් ලියාපදිංචි කරන ලදි. කුඩා පරිමාණ දූෂ්‍යකාරක කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති මාර්ගෝපදේශ සංග්‍රහය නිලධාරීන්ගේ පහසු පරිශීලනය සඳහා නැවත සකස් කර ඇත. එමෙන්ම, "COVID-19 වසංගතය තුළ කර්මාන්ත නැවත ආරම්භ කිරීමට පෙර පරිසර දූෂණය පාලනය කිරීම සහ ආරක්ෂාව පිළිබඳ මාර්ගෝපදේශ" සකස් කර මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය මඟින් ප්‍රකාශයට පත් කරන ලදි.

## පරිසර කළමනාකරණය හා ඇගයීම

ව්‍යාපෘතීන් සඳහා මූලික පාරිසරික පරීක්ෂණ (IEE) හා පාරිසරික බලපෑම් ඇගයීම් (EIA) සහතික ලබාදීම තුළින් එම ව්‍යාපෘති මඟින් සිදුවිය හැකි පාරිසරික

අධිකාරිය විසින් කෙටුම්පත් කරන ලද අතර උපායමාර්ගික පාරිසරික ඇගයීම් සිදු කිරීම සඳහා යෝජනාවක් ද පරිසර අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. තවද, උපායමාර්ගික පාරිසරික ඇගයීම ශ්‍රී ලංකාවට හඳුන්වා දීමේදීත් එය ක්‍රියාවට නැංවීමේදී මධ්‍යම පරිසර අධිකාරියට උපදෙස් දීම සඳහා ප්‍රධාන පාර්ශවකාර ආයතන වල නියෝජිතයින්ට අමතරව පරිසර කළමනාකරණය හා පරිසර නීතිය පිළිබඳ විශේෂඥයින්ගෙන් සැදුම්ලත් උපදේශක කමිටුවක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් පිහිටුවන ලදි.

මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටි නිල්ගල වනාන්තර ප්‍රදේශය සංරක්ෂණය කිරීම සහ කළුතර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පාරිසරික සංවේදී ප්‍රදේශ සම්බන්ධයෙන් වූ ගැටලු විසඳීම සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණය සඳහා වූ අන්තර් නියෝජිත සම්බන්ධීකරණ කමිටු රැස්වීම් දෙකක් අදාළ පාර්ශවකාර ආයතන වල නියෝජිතයින් සමඟ පවත්වන ලදි.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2020 වර්ෂය අවසාන වන විට ප්‍රදේශ 10ක් පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර හාලිඇල ජල මූලාශ්‍රය පරිසර ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. එමෙන්ම හන්තාන, වරාතැන්න-හක්කින්ද, පන්සලාතැන්න, බොල්ගොඩ, තලංගම, මුතුරාජවෙල හා මරගල කන්ද යන පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ පසුවිපරම් කිරීම සිදු කරන ලදි. මීට අමතරව, බොල්ගොඩ ජලාශය තුළ සිදුවන නීති විරෝධී කටයුතු පසුවිපරම් කිරීම සඳහා විශේෂ පසුවිපරම් ක්ෂේත්‍ර චාරිකා දෙකක් ගරු පරිසර අමාත්‍යතුමාගේ හා ගරු හිටපු රාජ්‍ය පරිසර අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් සහ පාර්ශවකාර ආයතන වල නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදි.



ලෝක තෙත්බිම් දිනය 2020 - සැමරීමේ ජාතික වැඩසටහන "තෙත්බිම් සහ ජෛව විවිධත්වය" යන තේමාව යටතේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහභාගිත්වය යටතේ 2020 පෙබරවාරි 3 වන දින අපේගම පරිශ්‍රයේදී පැවැත්විණි. මෙයට සමගාමීව, තෙත්බිම් ශාක විශේෂ ඇතුලත් සමරු මුද්දර 10 ක් නිකුත් කරන ලද අතර දිවයින පුරා "තෙත්බිම් සිතුවම් - 2020" කලා තරඟය සහ ජාතික තෙත්බිම් කඳවුර පවත්වන ලදි. එමෙන්ම ලෝක තෙත්බිම් දිනය සැමරීම සඳහා සියලු පළාත් සහ දිස්ත්‍රික් ආවරණය වන පරිදි වැඩසටහන්24 ක් පවත්වන ලදි.

## අපද්‍රව්‍ය කළමනාකරණය

උපද්‍රවකාරි අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ එක් අදියරක් ලෙස උපලේඛණ ගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර 201ක් 2020 වසර තුළදී නිකුත් කරන ලදි.

බාසල් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස, බාසල් සම්මුතියේ "B" ලැයිස්තුවේ ලැයිස්තුගත කර ඇති උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය ආනයන නිශ්කාශන අනුමැතීන් 258ක් ද උපද්‍රවකාරී අපද්‍රව්‍ය ආනයනය සඳහා අනුමැතීන් 46ක් ද 2020 වසර තුළදී ලබාදෙන ලදි. එමෙන්ම බාසල් ලැයිස්තුවේ "A" හා "B" ලැයිස්තුවේ ලැයිස්තුගත අපද්‍රව්‍ය මෙරට දේශසීමා හරහා ප්‍රවාහනයට අනුමැතීන් 50ක් ද දේශසීමා හරහා මෙරටින් අපනයනය සඳහා අනුමැතීන් 19ක් ද 2020 වසර තුළදී ලබාදී ඇත. රසායනික ද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ එක් අදියරක් ලෙස, රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පාරිසරික නිර්දේශ 40 ක් ද රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා අනුමැතීන් 365 ක් ද නිකුත් කරන ලදි.

රොටර්ඩෑම් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස, රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ තාක්ෂණික උපදේශක කමිටු (TACMIC) රැස්වීම්වලදී ගත් තීරණයන්ට අනුව සුදු ඇස්බැස්ටස් ආනයනය සඳහා ආනයන අනුමැතීන් 88ක් 2020 වසර තුළදී ලබාදෙන ලදි.

ඔක්තෝම්බර් මස 05 දා සිට 10 වන දින දක්වා සතියක කාලයක් ගෘහස්තව ජනනය වන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ වැඩසටහන - 2020 මධ්‍යම පරිසර අධිකාරිය විසින් තැපැල් දෙපාර්තමේන්තුව හා එක්ව ක්‍රියාත්මක කරන ලදි. මෙහිදී ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ටොන්77.5 ක පමණ ප්‍රමාණයක් එකතු වූ අතර ඒවා ලැයිස්තුගත උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමණාකරන බලපත්‍රලාභී ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කරන්නන් වෙත භාරදෙන ලදි.



දිවයින පුරා විහිදී සිටින ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතු කරන්නන්ගේ දත්ත පද්ධතිය යාවත්කාලීන සිදුකරන ලද අතර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතු කරන්නන් 286දෙනෙක් 2020 දෙසැම්බර් දක්වා ලියාපදිංචි කර ඇත. මෙම ලියාපදිංචි අපද්‍රව්‍ය එකතු කරන්නන්ගෙන් ලබාගත් දත්ත අනුව කඩදාසි අපද්‍රව්‍ය ටොන් 4, 447ක්, ප්ලාස්ටික් අපද්‍රව්‍ය ටොන් 3,324ක්, වීදුරු අපද්‍රව්‍ය ටොන් 2,867ක් ප්‍රතිචක්‍රීකරණය සඳහා මාසිකව එකතුකර ඇත. ප්‍රතිචක්‍රීකරණය කල හැකි අපද්‍රව්‍ය පහත පරිදි ක්‍රම තුනකින් පරීක්ෂා කර ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන ලදි.

මාතර මහ නගර සභා බලප්‍රදේශය තුළ දිරාපත් විය හැකි ඝණ අපද්‍රව්‍ය සඳහා තිරසාර විසඳුමක් ලබාදීම උදෙසා මාතර කොටවිල අපද්‍රව්‍ය මඟින් බලශක්තිය නිපදවීමේ ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන ලදි.

| එකතුකරන ආකාරය | 2020 වසර තුළදී එකතුකරන ලද ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය (Kg) |
|---|---|
| අපද්‍රව්‍ය එකතු කරන්නන්ගේ දත්ත පද්ධතිය | 18,609,553.16 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත | 234,923 |
| නාවික අපද්‍රව්‍ය එකතු කිරීම | 40,292 |

පොලිතින් කළමණාකරණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම යටතේ, තනි භාවිත ප්ලාස්ටික් අයිතම හතරක් පාලනය කිරීමට සහ ප්ලාස්ටික් නිෂ්පාදන සඳහා හඳුන්වාදුන් කේතනය අනිවාර්ය කිරීමට කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදි. එමෙන්ම, කොවිඩ් 19 පැතිරීම හේතුවෙන් කුටුම්භ හා ස්වයං නිරෝධායන මධ්‍යස්ථාන වලින් ජනනය කරනු ලබන ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා වූ මාර්ගෝපදේශය, අදාළ පාර්ශවකරුවන්ගේ උපදෙස් ඇතිව සංශෝධනය කර සිංහල හා දෙමළ භාෂා වලට පරිවර්තනය කර ඇත.

පොලිතින් තහනම පිළිබඳ රෙගුලාසි බලගැන්වීම උදෙසා මධ්‍යම පරිසර අධිකාරිය විසින් දිවයින පුරා වැටලීම් 2,264 ක් සිදු කර ඇති අතර පොලිතින් ආහාර දවටන වාණිජ්‍යමය වශයෙන් භාවිතය පිළිබඳ රෙගුලාසි උල්ලංඝනය කිරීම් 156 ක් වාර්ථා වී ඇත. රෙගුලාසි උල්ලංඝනය කිරීම් වැඩිපුරම වාර්ථා වී ඇත්තේ බස්නාහිර, නැගෙනහිර සහ දකුණු පළාත් වලිනි. කොළඹ සහ තදාසන්න ප්‍රදේශ වල වෙළෙන්දන් සහ නිශ්පාදකයන් පිළිබඳ වැටලීම් වැඩසටහන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ශ්‍රී ලංකා පොලීසියේ සහ පාරිභෝගික කටයුතු අධිකාරියේ අනුග්‍රහයෙන් සිදු කරන ලදි. වැඩසටහන අතරතුර පොලිතින් ආහාර දවටන ටොන් 3.5ක් අත්අඩංගුවට ගෙන තිබේ.

## පරිසර අධ්‍යාපනය හා දැනුවත් කිරීම

ජාතික පරිසර නියමු වැඩසටහන (EPP), පරිසර ආරක්ෂාව හා සංරක්ෂණය පිළිබඳව ප්‍රධාන පණිවිඩකරුවන් ලෙස පාසල් ළමුන් පුහුණු කිරීම හා භාවිතා කිරීම අරමුණු කරගෙන ආරම්භ කරන ලදි. පරිසර ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා අවශ්‍ය ආකල්ප වැඩි දියුණු කිරීම හා පරිසර කළමනාකරණය සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය කිරීමට පරිසර දැනුම ලබාදීම මෙම වැඩසටහන මඟින් සිදුකරනු ලබයි.

"ජෛව විවිධත්වය - සොබාදහමට ඉඩක්" යන තේමාව යටතේ 2020 ලෝක පරිසර දින වැඩසටහන සැමරීම සඳහා මාර්ගගත ක්‍රමයට (online based) ඡායාරූප හා පද රචනා තරඟයක් සංවිධානය කර පවත්වන ලදි. මෙහි සම්මාන ප්‍රදානෝත්සවය 2020 සැප්තැම්බර්25 වන දින බස්නාහිර පළාත් සෞන්දර්‍ය නිකේතනයේ දී ගරු පරිසර අමාත්‍යවරයා සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි. මෙහිදී, ජයග්‍රාහී පළමු සිංහල පද රචනා 3 සඳහා තනු නිර්මාණය කිරීම සහ ඡායාරූප තරඟයෙන් තෝරාගත් හොඳම ඡායාරූප 100 ඇතුලත් ඡායාරූප පොතක් මුද්‍රණය කිරීම සිදුකරන ලදි.

2020 ලෝක පරිසර දින වැඩසටහනට සමගාමීව අනුරාධපුරය, කෑගල්ල. බදුල්ල සහ මාතර යන ප්‍රදේශවල පැල සිටුවීමේ වැඩසටහන් 4 ක් ක්‍රියාත්මක කරන ලදි.




"සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව රටේ වනාන්තර ආවරණය 30%කින් ඉහළ නැංවීම සඳහා "හුස්ම දෙන තුරු" සංකල්පය ගරු පරිසර අමාත්‍යවරයා විසින් හඳුන්වා දෙන ලදි. මෙම වැඩසටහන අනාගතයේදී ද මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ඇත. මෙහි සමාරම්භක වැඩසටහන මධ්‍යම පරිසර අධිකාරි පරිශ්‍රය ඉදිරියේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ගරු පරිසර අමාත්‍යවරයා සහ අනෙකුත් ආරාධිතයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.

ඉතා සීමිත පහසුකම් යටතේ පරිසර නියමු වැඩසටහනේ ක්‍රියාකාරකම් සිදුකරනු ලැබූ පාසල් 5ක් හඳුනාගෙන එම පාසල් 5 සඳහා පුස්තකාල ද්‍රව්‍ය හා ගෘහභාණ්ඩ ලබාදෙන ලදි.

| අනු අංක | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | පරිසර නියමු හා ළමාසමාජ වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය | 2.322 | 2.322 | 100 |
| 2 | ජාතික පරිසර නියමු කඳවුර පැවැත්වීම | 2.75 | 2.75 | 100 |
| | **මුළු එකතුව** | **5.072** | **5.072** | **100** |

## පර්යේෂණ හා සංවර්ධනය

සංවර්ධන ව්‍යාපෘති සහ නාගරිකරණ ක්‍රියාවලිය හේතුවෙන් තෙත්බිම් සඳහා මතුවන තර්ජනය ඉහළ යාම සැලකිල්ලට ගනිමින් බස්නාහිර පළාත සඳහා අන්තර්ජාලගත තෙත්බිම් නාමාවලියක් සකස් කරන ලද අතර එම තෙත්බිම් හි ජල විද්‍යාත්මක වැදගත් කම මත තෙත්බිම් ප්‍රමුඛකරණය සඳහා වු අධ්‍යයනයේ අවසාන වාර්තාව සහ අන්තර්ජාලගත ප්‍රදර්ශන පුවරුව සකස්කරන ලදි.

කැළණි, නිල්වලා, මහඔය හා දියවන්නාව යන ප්‍රධාන ගංගා ද්‍රෝණි වල ජල තත්ත්වය හඳුනාගැනීම සඳහා වු අන්තර්ජාලගත ප්‍රදර්ශන පුවරුව සැකසීම හා යාවත්කාලීන කිරීම සිදුකරන ලදි. කැළණි ගංගා ද්‍රෝණියේ ජල තත්ත්ව දර්ශකය ද ඇතුළත් කරන ලදි.

2020 වර්ෂය තුල “ශ්‍රී ලංකාවේ පාරිසරික සම්පත් කළමනාකරණය සඳහා මාර්ගගත අවකාශීය දත්ත පද්ධතිය” වනසංරක්ෂණ කලාප හා වනජීවී සංරක්ෂණ කලාප ඇතුලත් කර යාවත්කාලීන කිරීම සිදුකරන ලදි. මීට අමතරව, මඩකලපුව හා කිලිනොච්චි දිස්ත්‍රික් සඳහා දිස්ත්‍රික් සම්පත් පැතිකඩයන් සකස් කර මුද්‍රණය කරන ලදි.

## පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන

2020 වසරේ දී පහත වගුවේ දක්වා ඇති වැඩසටහන් සඳහා මුල්‍යමය දායකත්වය **“පුනරුදය”** ජාතික පරිසර සංරක්ෂණ වැඩසටහන මඟින් ලබාදෙන ලද අතර මධ්‍යම පරිසර අධිකාරිය විසින් 100%ක විශිෂ්ය මුල්‍යමය ප්‍රගතියක් ලබාගන්නා ලදි.

## විශේෂ ව්‍යාපෘති

### ශ්‍රී ලංකාව තුළ ඝන අපද්‍රව්‍ය බැහැරකිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘති (EDCF ව්‍යාපෘතිය)

අනුරාධපුරයේ කිරික්කුලම, හික්කඩුව මොන්රෝවියාවත්ත, මැදිරිගිරියේ මීගස්වැව සහ යාපනය කීරිමලෙයි යන ප්‍රදේශයන්හි සනීපාරක්ෂක කසළ රඳවන ස්ථාපනය කිරීමට සැලසුම් සකස් කරන ලදි. මෙම ව්‍යාපෘතිය අදාළ පළාත් පාලන ආයතනවල ජනනය වන **අපද්‍රව්‍ය** බැහැර කිරීම සඳහා පොකුරු පදනම් කරගත් පොදු අවසාන බැහැර කිරීමේ පහසුකම ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණි. නමුත්, එක්සිම්බැන්ක් එකත් සමඟ ඇතිවූ ගැටළු හේතුවෙන් ණය ගිවිසුම අවලංගු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2020.07.01 දින තීරණය කරන ලද අතර ව්‍යාපෘති ස්ථාන හතර මධ්‍යම පරිසර අධිකාරියට භාර දෙන ලදි. ව්‍යාපෘති ස්ථාන හතරෙහි යටිතල පහසුකම් සම්පූර්ණ කර ඇති අතර ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ආරම්භකිරීමට හැකියාව ඇත.

### ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන

ගම්පහ දිස්ත්‍රික්කයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය සඳහා සම්පූර්ණ විසඳුමක් ලබාදීම පිණිස ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. පළාත් පාලන ආයතන 9කගේ නාගරික හා කාර්මික කසළ කළමනාකරණය සඳහා පහසුකම් සැපයීම උදෙසා මෙට්‍රික් ටොන් 20ක ධාරිතාවයකින් යුත් කොම්පෝස්ට් අංගනයක්, පැයට කිලෝග්‍රෑම් 100ක ධාරිතාවයකින් යුත් ප්ලාස්ටික් අපද්‍රව්‍ය තාපවිච්ඡේදන උපකරණයක්, ප්‍රතිචක්‍රිකරණය කළ හැකි අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් හා සනීපාරක්ෂක කසළ රඳවනයක් මෙම ව්‍යාපෘතිය තුළ අන්තර්ගත වේ. 2020 වසරේ දී ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා අඩි 20 ක් පමණ වන බහාලුම් 5ක් ආයතන පහක් වෙත ලබා දෙන ලදි.

### ග්‍රීන්පාර්ක් කසළ කළමනාකරණ මධ්‍යස්ථානය

දොම්පේ ප්‍රාදේශිය සභාවේ ජනනය වන ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය සහ එම ප්‍රාදේශිය සභාව තුළ පවතින ඇතැම් තෝරාගත් කර්මාන්ත විසින් ජනනය කරනු ලබන උපද්‍රවකාරි නොවන අපද්‍රව්‍ය වල අවසාන බැහැරලීම ලෙස සනීපාරක්ෂක කසල රඳවනය භාවිතාකිරීමට ග්‍රීන් පාර්ක් ඒකාබද්ධ කසළ කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අවසර දෙනු ලබයි. මෙම සනීපාරක්ෂක කසල රඳවනයේ කසල රැදවුම් ධාරිතාව දිනකට ටොන් **90** ක් පමණ වේ.

## ඉදිරි අභිමතාර්ථ

තනි භාවිත පොලිතින් සහ ප්ලාස්ටික් නිෂ්පාදන තහනම් කිරීම සහ පාලනය කිරීම සඳහා 2021 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

තනි භාවිත ප්ලාස්ටික් පාලනය කිරීම පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුවක් පිහිටුවීම

මධ්‍යම පරිසර අධිකාරිය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත “ගෘහස්ථ වායු තත්වය ඉහල නැංවීම” ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති අතර ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 සිට 2023 දක්වා මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය සැලසුම් කර ඇත.

පරිසර අමාත්‍යාංශයේ සහ අදාළ පාර්ශවකාර ආයතනවල සහයෝගයෙන් මධ්‍යම පරිසර අධිකාරිය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත “සුරකිමු ගංගා” ජාතික පාරිසරික වැඩසටහන සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. 2021 වර්ෂයේදී සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් “සුරකිමු ගංගා” ජාතික පාරිසරික වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය අපේක්ෂා කෙරේ.

# 2.3.2 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

භූ විද්‍යා අංශයෙහි ප්‍රගතිය කාණ්ඩ 3 ක් යටතේ විස්තර කරනු ලැබේ.

1. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රතිපාදන වලින් මූල්‍ය සම්පාදනය කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් කටයුතු
2. සේවාදායකයන්ගේ ඉල්ලීම මත ක්‍රියාත්මක කරනු ලබන සේවාදායක ප්‍රතිචාර ව්‍යාපෘති
3. කෙටි ක්ෂේත්‍ර සංචාර, රැස්වීම්, පුහුණු වැඩසටහන් සහ ප්‍රකාශන පළකිරීම ඇතුළත් අනෙකුත් කටයුතු

## ක්‍රියාකාරී සැලසුම් කටයුතු (භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රතිපාදන)

2020 වර්ෂය සඳහා භූ විද්‍යා අංශයෙහි ක්‍රියාකාරී සැලසුම් කටයුතු ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍ර හතරකට වඩා අඩු සංඛ්‍යාවක් තුළ ක්‍රියාත්මක කරන ලදී.

1 වන ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රය: සිතියම් ගත කිරීම, භූ විද්‍යාත්මක තොරතුරු සකස් කිරීම (භූ විද්‍යා දත්ත) සහ දත්ත බෙදා හැරීම

2 වන ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රය : ඛනිජ ගවේෂණයන්, භූභෞතික පරීක්ෂණ සහ සම්පත් ඇගයීම

3 වන ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රය : පර්යේෂණ හා සංවර්ධන කටයුතු, පෘථිවි ලක්ෂණ හා භූ කම්පන කටයුතු අධීක්ෂණය කිරීම

4 වන ප්‍රධාන භූවිද්‍යා ක්ෂේත්‍රය : යටිතල පහසුකම්, විද්‍යාගාර සේවා සහ විදුම් ධාරිතාවය සංවර්ධනය කිරීම

## 1 වන ප්‍රධාන භූවිද්‍යා ක්ෂේත්‍රය: සිතියම් ගත කිරීම, භූ විද්‍යාත්මක තොරතුරු (භූ විද්‍යා දත්ත) නිර්මාණය කිරීම සහ දත්ත බෙදාහැරීම

### (අ) භූ විද්‍යා සිතියම් මුද්‍රණය කිරීම

සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය කරමින් භූ විද්‍යා සිතියම් පළකිරීම කාර්යාංශයෙහි ප්‍රධාන කටයුතුවලින් එකක් වේ. ඛනිජ හා භූගත ජලය ගවේෂණය, ප්‍රධාන ඉදිකිරීම් හා සිවිල් ඉංජිනේරු කටයුතු සහ නායයාමේ උවදුරු පිළිබඳ සිතියම් සකස් කිරීම ආදිය ඇතුළත් කාර්යයන් ගණනාවක් සඳහා භූමිය පිළිබඳ භූ විද්‍යා තොරතුරු අඩංගු භූ විද්‍යා සිතියම් භාවිතා කරනු ලැබේ. 2014 වර්ෂය තුළදී සමස්ත රටම ආවරණය කරමින් (1:100,000 පරිමාණයේ) භූ විද්‍යා සිතියම් 21 මුද්‍රණය කිරීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිම කරන ලදී

### (ආ) චාතුර්ථික සිතියම් (වෙරළ බඩ කලාපය) සැකසීමේ වැඩසටහන

භූ විද්‍යාත්මක කාල පරාසයෙහි චාතුර්ථික කාලපරිච්ඡේදය මීට අවුරුදු මිලියන දෙකකට පෙර අතීතයේ සිට දිව එයි. ශ්‍රී ලංකාවෙහි චාතුර්ථික සැකසීම ප්‍රධාන වශයෙන්ම වෙරළබඩ අවසාදිතය, ජල ගැලීම් සිදුවන තැනිතලා ප්‍රදේශවල දියලුමය අවසාදිත සඳහා පමණක් සීමාවී ඇති අතර පස් සැකසීම් මීට ඇතුළත් වේ. මෙම සැකසීම් තුළට ආර්ථිකමය වශයෙන් වැදගත් මැටි සහ වැලි නිධි, කොරල් නිධි, සශ්‍රීක පස් ආවරණය සහ භූගත ජල ප්‍රභව ඇතුලත් වන හෙයින් ඒවා අතිශයින්ම සුවිශේෂී වේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2008 වර්ෂයේදී "චාතුර්ථික භූ විද්‍යා සිතියම් සැකසීම" නම් වූ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

#### චාතුර්ථික සිතියම් මුද්‍රණය කිරීමේ වැඩසටහන

සිලාවතුර සහ තිස්සමහාරාමය යන සිතියම් සකස් කිරීමේ කටයුතු 95% ක් නිම කරනු ලැබ ඇති අතර 2021 වර්ෂයේ පළමු කාර්තුවේ දී ඒවා මුද්‍රණය කිරීම සඳහා සූදානම් කරනු ඇත

#### චාතුර්ථික සිතියම් සැකසීමේ වැඩසටහන

කල්පිටිය සහ යාල යන කලාපවල සිතියම් සැකසීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදී. දළ වශයෙන් මෙහි කටයුතු වලින් 30% ක් නිම කරනු ලැබ ලැබ ඇති අතර 2021 වර්ෂයේ දී එය සම්පූර්ණයෙන්ම නිම කිරීමට නියමිත වේ.



**(ඇ) පාංශු භූ රසායනික සිතියම් සැකසීමේ වැඩසටහන**

පසෙහි භූ රසායනික ලක්ෂණ අධ්‍යනය කිරීම සඳහා 2008 වර්ෂයේදී පාංශු භූ රසායනික සිතියම් සැකසීමේ වැඩසටහන ආරම්භ කරන ලදි. ඛනිජ ගවේෂණය, පාරිසරික අධික්ෂණ කටයුතු සහ කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු වල දී සහ භූ සෞඛ්‍ය උවදුරු අධ්‍යයන කටයුතු වල දී මෙම සිතියම් ප්‍රයෝජනවත් වේ. 1:50000 පරිමාණයේ ආධාරක සිතියම් මත පදනම්ව පාංශු භූ රසායනික සිතියම් සැකසීමේ කටයුතු සිදු කරනු ලැබේ.

**පාංශු භූ රසායනික සිතියම් වැඩසටහනෙහි ක්ෂේත්‍ර කටයුතු**

කලාප අංක 19 (අලුත්ගම-ගාල්ල) හි ක්ෂේත්‍ර කටයුතු සම්පූර්ණ කරනු ලැබ ඇත. ප්‍රසිද්ධ කරන ලද සිතියම්වල නිශ්චිත ප්‍රදේශ අධ්‍යයනය කිරීම සඳහා සවිස්තරාත්මක භූ රසායනික සිතියම් වැඩසටහන හඳුන්වා දෙන ලදි. මෙම වැඩසටහන යටතේ හම්බන්තොට කාර්මික කලාපයෙහි සවිස්තරාත්මක සිතියම් සැකසීමේ කටයුතු සම්පූර්ණ කරනු ලැබ ඇත.

**(ඈ) වාර්ෂික ඛණිජ ග්‍රන්ථය**

2019 සහ 2020 යන වර්ෂයන්හි වාර්ෂික ඛනිජ ග්‍රන්ථවල මුද්‍රණ කටයුතු සඳහා අවසාන පිටපත සූදානම් කර ඇත.

**(ඉ) පළාත් ඛනිජ පරීක්ෂණ සහ පළාත් ඛනිජ සිතියම්**

උතුරු මැද පළාතෙහි සහ සබරගමුව පළාතෙහි පළාත් ඛනිජ සිතියම් මුද්‍රණය කිරීමේ කටයුතු නිම කරන ලද අතර 2019 වර්ෂය අවසානයේදී මුද්‍රනය සඳහා නියමිත අවසන් පිටපත් ලබා දෙන ලදි. ඌව පළාතෙහි මුද්‍රණය සඳහා සූදානම් අවසන් පිටපත 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී ඉදිරිපත් කරන ලදි. කෙසේ වුවද, මෙම සිතියම් චීනයෙහි මුද්‍රණය කරනු ලබන හෙයින් කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන්, මුද්‍රණය කරන ලද සිතියම් තවමත් ලැබී නැත.

**(ඊ) ඛනිජ සුවිශේෂී සිතියම් /වාර්තා පිළියෙල කිරීම**

තිරිවානා ඉල්ලම් සහ ඛනිජ වැලි පිළිබඳ ඛනිජ සුවිශේෂී වාර්තාවන්හි අවසාන පිටපත් පිළියෙල කරනු ලබමින් පවතී.

## 2 වන ප්‍රධාන කාර්ය සාධන ක්ෂේත්‍රය ඛනිජ පරීක්ෂණ, භූභෞතික පරීක්ෂණ සහ සම්පත් ඇගයීම

(අ) ගංගාද්‍රෝණි වල ජලධාරා අවසාදිත පරීක්ෂණයන්

**වලවේ ගඟ**

රත්නපුර මැණික් ඉල්ලම් ප්‍රදේශවලින් දකුණු පසට පිහිටා ඇති වළවේ ගංගා ද්‍රෝණිය ශ්‍රී ලංකාවේ වැදගත්ම ගංගා පද්ධතිවලින් එකක් වේ. ජලාපවහන ද්‍රෝණිය තුල පිහිටා ඇති බොහෝ වර්ග වලට අයත් මැණික් ගල්, දියළුමය රත්තරන්, සර්කෝන් පවතින සයනයිට් ද්‍රව්‍ය සහ ලෝහමය ෆෙරස් සර්පන්ටයින් මගින් ගංගා ද්‍රෝණියෙහි භූ විද්‍යාත්මක සහ ආර්ථික වැදගත්කම ඉහළ නංවනු ලැබේ.

**කිරිඳි ඔය**

2020 වර්ෂයේ දී කිරිඳි ඔය ද්‍රෝනිය ඔස්සේ ජලධාරා අවසාදිත පරික්ෂා කිරීම සිදු කරන ලදී. 2019 වර්ෂයේ දී ක්ෂේත්‍ර කටයුතු නිම කරන ලද අතර විද්‍යාගාර විශ්ලේෂණ කටයුතු 2020 වර්ෂයේ දී නිම කරන ලදී .අවසාන වාර්තාව සැකසීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී.

**(ආ) ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයෙහි සහාය ඇතිව සිදු කරනු ලබන න්‍යෂ්ටික අමු ද්‍රව්‍ය පරීක්ෂණ කටයුතු සහ ආනුශාංගික කටයුතු කාර් රථයක සිට ක්‍රියාත්මක කරනු ලබන ගැමා කිරණ වර්ණනාවලීමාන පරික්ෂණය**

රක්වාන තංගල්ල සිතියම් ප්‍රදේශය තුළ කාර් රථයක සිට ක්‍රියාත්මක කරනු ලබන ගැමා කිරණ වර්ණාවලීමාන පරීක්ෂනය සිදුකිරීමට සැලසුම් කරන ලදී. ආරම්භක ක්ෂේත්‍ර පරීක්ෂණය සහ සවිස්තරාත්මක ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු නිම කරන ලදී . විද්‍යාගාර කටයුතුද නිම කරනු ලැබ ඇත .

ආරම්භක පරීක්ෂණයෙහි සිතියම් කටයුතු නිම කරනු ලැබ ඇති අතර සවිස්තරාත්මක පරීක්ෂණය සඳහා අවසාන සිතියම් පිළියෙල කිරීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී.

**කොළඹ සිට කිරින්ද දක්වා වෙරළ තීරුව ඔස්සේ න්‍යෂ්ටික අමුද්‍රව්‍ය පරීක්ෂණය**

කොළඹ සිට කිරින්ද දක්වා වෙරළ තීරුව ඔස්සේ න්‍යෂ්ටික අමුද්‍රව්‍ය පරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර කටයුතු නිම කරන ලදි. මෙම පරීක්ෂණයෙහි අවසාන වාර්තාව සකසනු ලබමින් පවතී.

**න්‍යෂ්ටික අමුද්‍රව්‍ය පරීක්ෂණ දත්ත සැකසීම**

විකිරණ දත්ත සැකසීම, ඛනිජ විද්‍යාත්මක විශ්ලේෂණය සහ භූ රසායනික දත්ත විශ්ලේෂණය නිම කරනු ලැබ ඇත. අවසන් වාර්තාව සැකසීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී.

| ක්‍රියාකාරකම් | ඇස්තමේන්තු ගත ඉලක්කය (අංක) | ඉලක්කය සපුරා ඇත (අංක) | ප්‍රගතිය (%) | සටහන |
|---|---|---|---|---|
| 2.1 ඉංජිනේරු සැලසුම් / පරීක්ෂණ පිපිරීම අනුමත කිරීම | 60 | 178 | 297 | |
| 2.2 පුනරුත්ථාපනය හා පතල් වැසීම | 500 | 394 | 79 | |
| 2.3 පාරිසරික බලපෑම් තක්සේරුව | 55 | 24 | 44 | |
| 2.4 පිපිරුම් පාඨමාලාව | 2 | 0 | 0 | කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් |
| 2.5 ඛනිජ වෙළඳපොළ සමීක්ෂණය | 100% | - | - | සියළුම ඛනිජ වර්ග සඳහා වෙළඳපල සමීක්ෂණයක් සිදු කිරීම දුෂ්කර බැවින්, එය මූලික අදියර ලෙස වැලි සඳහා පවත්වනු ලැබේ. මේ සඳහා කමිටුවක් පත් කර ඇත. ඔවුන් දත්ත එක්රැස් කර සාකච්ඡා කිහිපයක් ද පැවැත්වීය. කෙසේ වෙතත්, අවසානයේ කමිටුව විසුරුවා හරින ලදි. |
| 2.6 තාක්ෂණික වාර්තා තක්සේරු කිරීම | 1350 | 811 | 60 | |
| 2.7 සැකසුම් බලපත්‍රය හඳුන්වා දීම | 100% | 0 | 0 | කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් |
| 3.1 නව ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම | - | - | - | |
| 3.2 ප්‍රාදේශීය කාර්යාල සඳහා ඉඩම් අත්පත් කර ගැනීම | 2 | | 10 | මාතර සහ හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාල සඳහා ඉඩම් ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 3.3 ප්‍රාදේශීය කාර්යාල සඳහා ගොඩනැගිලි ඉදිකිරීම | 1 | | 20 | පොලොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කර තිබේ. |
| 4.3 ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | 6 | 0 | 0 | |
| 5.1 ඛනිජ හා පතල් කලාප හඳුනා ගැනීම | 1 | | | පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් අවශ්‍ය ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීමේ දුෂ්කරතාවය හේතුවෙන් මෙම ක්‍රියාවලිය සිදු කිරීමට නොහැකි විය. |
| 5.2 පතල් කලාප ප්‍රකාශනය | - | | | |
| 6.1 රජයේ ක්‍රියාවලි ප්‍රතිව්‍යුහගතකරණය | 50% | | 25 | මෙම ක්‍රියාවලිය සඳහා උනන්දුව ප්‍රකාශ කිරීම ලබා දී ඇත. |

| ක්‍රියාකාරකම් | ඇස්තමේන්තුගත ඉලක්කය | ඉලක්කය සපුරා ඇත | ප්‍රගතිය (%) | සටහන |
|---|---|---|---|---|
| 6.2 ක්ෂේත්‍ර විමර්ශන ලුහුබැඳීමේ පද්ධතිය | 100% | | | ක්ෂේත්‍ර විමර්ශන ලුහුබැඳීමේ පද්ධතිය සක්‍රිය කර ඇතත්, එහි අඩුපාඩු නිසා එය භාවිතා කිරීමට නොහැකි වී තිබේ. |
| 6.3 ස්ථාවර කිරීමේ ක්‍රියාවලිය (5S) | 40% | | | පොලොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය ක්‍රියාවලිය ආරම්භ කර ඇත 5S. |
| 7.1 පුපුරන ද්‍රව්‍ය මත පදනම්ව නිෂ්පාදන ගණනය නැවත විශ්ලේෂණය කිරීම | 100% | | | සමස්ථ සඳහා නව ක්‍රමයක් හඳුන්වා දී ඇත. |
| 7.2 පිපිරුම් අධීක්ෂණ පරාමිතීන් සංශෝධනය කිරීම | 20% | | | |

## පතල් අංශය කාර්ය සාධන සාරාංශය (මූල්‍ය හා භෞතික) - 2020 වර්ෂය

| සංරචක /ක්‍රියාකාරකම් | වාර්ෂික වෙන් කිරීම සහ ඉලක්ක | | මූල්‍ය හා භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | භෞතික ඉලක්කය | මූල්‍ය ඉලක්කය (රු. 000 ') | භෞතික ප්‍රගතිය | මූල්‍ය ඉලක්කය සපුරා ඇත (රු. 000 ') | ප්‍රගතිය (%) |
| **1.1** බලපත්‍ර නිකුත් කිරීම | | | | | |
| 1.1.1 ගවේෂණ බලපත්‍ර | 40 | 3,000 | 29 | 4,643 | 73 |
| 1.1.2 කාර්මික කැනීම් බලපත්‍ර ඒ | 150 | 22,000 | 113 | 15,000 | 75 |
| 1.1.3 කාර්මික කැනීම් බලපත්‍ර බී | 1,200 | 36,000 | 278 | 6,084 | 23 |
| 1.1.4 කාර්මික කැනීම් බලපත්‍ර සී | 2,000 | 20,000 | 1,822 | 19,024 | 91 |
| 1.1.5 කාර්මික කැනීම් බලපත්‍ර ඩී | 1,200 | 6,000 | 537 | 2,685 | 45 |
| 1.1.6 ශිල්පීය කැනීම් බලපත්‍ර ඒ | 1,100 | 5,500 | 2,627 | 12,906 | 239 |
| 1.1.7 ශිල්පීය කැනීම් බලපත්‍ර බී | 4,000 | 8,000 | 2,037 | 3,922 | 51 |
| 1.1.8 වෙළඳ බලපත්‍ර ඒ | 30 | 230 | 12 | 90 | 40 |
| 1.1.9 වෙළඳ බලපත්‍ර බී | 5,000 | 25,000 | 3,318 | 16,590 | 66 |
| 1.1.10 වෙළඳ බලපත්‍ර සී | 10 | 10 | 5 | 5 | 50 |
| 1.1.11 ප්‍රවාහන බලපත්‍ර | 1,500,000 | 135,000 | 726,748 | 65,407 | 48 |
| 1.1.12 අපනයන බලපත්‍ර | 750 | 3,700 | 573 | 2,865 | 76 |
| 1.2 රාජ්‍ය භාග ආදායම | | 2,790,000 | | 1,594,367 | 57 |
| 1.3 පරීක්ෂණ ගාස්තු | | 600,000 | | 250,835 | 42 |
| 1.4 අනෙකුත් ආදායම් | | 180,000 | | 35,962 | 20 |
| 2.1 පරීක්ෂන පිපිරවීම් සිදු කිරීම | 60 | | 263 | 10,720 | 297 |

# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - මූල්‍ය කාර්යසාධනය 2020

| | විස්තරය | 2020 වර්ෂයෙහි ඉලක්කගත ආදායම (රු. මිලියන ) | 2020.12.31 දිනට ප්‍රගතිය (රු. මිලියන) | වාර්ෂික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | රාජ්‍ය භාග ආදායම | 1,312 | 1,602 | 122% |
| 2 | බලපත්‍ර ආදායම | 81 | 143 | 177% |
| 3 | පරීක්ෂා කිරීම් ආදායම | 209 | 252 | 121% |
| 4 | ව්‍යාපෘති සහ විද්‍යාගාර සේවා | 80 | 28 | 35% |
| 5 | අනෙකුත් | 243 | 221 | 91% |
| | **මුළු එකතුව** | **1,925** | **2,246** | **117%** |

## ආදායම් විශ්ලේෂණය – 2020 වර්ෂය

| 2020 වර්ෂයෙහි ඉලක්කගත ආදායම (රු. මිලියන) | 2020.12.31 දිනට ප්‍රගතිය (රු. මිලියන) | වාර්ෂිග ප්‍රගතිය % | ප්‍රතිපාදන (ස්ථිර තැන්පතු හෝ අනිකුත් ආයෝජන) | මහා භාණ්ඩාගාරයට දායකත්වය |
|---|---|---|---|---|
| **1925** | **2246** | **117%** | **1,168** | **0** |



## 2.3.3 සිමාසහිත ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම

### කැණීම් අංශය

**පිපිරුම් අධීක්ෂණය**

පිපිරුම් අධීක්ෂණය යනු කැනීම් භූමි තුල රජයේ සම්මත නීති රීති හා රෙගුලාසි මාලාවකට අනුකූලව පිපිරීම සිදු කරන බව සනාථ කිරීම සහ සිදුවිය හැකි ව්‍යුහාත්මක හානි වළක්වා ගැනීම සඳහා පිපිරුම් ක්‍රියාකාරකම් පාලනය කිරීම සහ භූ කම්පනය සහ වායු පීඩනය හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා සිදු කරනු ලබන අනුකූලතා කාර්යයකි.

**පිපුරුම් සමීක්ෂණය**

කිසියම් ඉදිකිරීම් කටුත්තක බලපෑම හේතුවෙන් සිදුවිය හැකි ව්‍යුහාත්මක හානි හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම සඳහා ඉරිතැලීම් සමීක්ෂණ සිදු කරනු ලැබේ. සම්පූර්ණ ක්‍රියා පටිපාටියෙන් පසු හානිය සඳහා මූල්‍යමය වටිනාකමකින් තක්සේරු කෙරේ.

**GPS සමීක්ෂණ වාර්තා**

මෙය ඉදිකිරීම්/ කැණීම් භූමියක අවට වාසස්ථානය හඳුනා ගැනීම සඳහා සාමාන්‍යයෙන් භාවිතා වන ස්ථාන සිතියම්කරණ ක්‍රියාවලියකි. ඉදිකිරීම් / කැණීම් කටයුතු සඳහා වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීම වැනි තීරණ ගැනීමේදී මෙම ජීපීඑස් සිතියම ඉතා වැදගත් වේ.

**ශබ්ද මට්ටම් පරීක්ෂණ**

වැඩබිම අවට පරිසරයට ඇති ප්‍රධාන පරිසර හානියක් වන ශබ්ද දූෂණය වැලැක්වීම සඳහා අවම ශබ්ද දූෂණය සහතික කිරීම සඳහා මෙම ක්‍රමය යොදාගෙන ඇත.

**ධූලි අධීක්ෂණය**

ඉදිකිරීම් කටයුතු වල බලපෑම හේතුවෙන් පරිසරයට මුදා හරින දූවිලි ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා මෙය සිදු කෙරේ.

**දෙදරීම් අධීක්ෂණය**

මෙය ඉදිකිරීම් ස්ථානයක් වටා ඇති ව්‍යුහයන්ට කම්පන බලපෑම් පාලනය කිරීම සඳහා සිදු කරන තවත් අනුකූලතා කාර්යයකි.

**ආර්ථික ශක්‍යතා වාර්තා සකස් කිරීම**

මෙම ක්‍රියාවලිය මඟින් ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම සහ එහි ප්‍රතිලාභ ලබා ගත හැකිය.

**ව්‍යාපෘති සැලසුම් වාර්තා**

මෙම වාර්තාව සමස්ත ව්‍යාපෘතියේ සවිස්තරාත්මක විස්තරයක් වන අතර එහි ප්‍රතිලාභ සහ අවසාන ව්‍යාපෘතියේ පැති පිළිබිඹු වේ.

### භූ විද්‍යා අංශය

**ඩ්‍රෝන සමීක්ෂණය.**

තෝරාගත් භූ දර්ශනයේ වඩාත් නිවැරදි හා නවතම තත්වය තක්සේරු කිරීමට මෙම ක්‍රමය භාවිතා කරයි. ගංගා තුල පවතින වැලි නිධි හඳුනා ගැනීම හා පොළවෙන් මතුපිටට පැමිණ ඇති ඛණිජ නිධි වල ප්‍රමාණ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට ඩ්‍රෝන තාක්ෂණය බෙහෙවින් ඉවහල් වේ. ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර මූලික සහ ඉක්මන් තක්සේරු ක්‍රමයක් ලෙසද ඩ්‍රෝන් සමීක්ෂණය භාවිතා කරනු ලැබේ. මෙය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව බෙහෙවින් වැඩි කරයි.

**භූ භෞතික විමර්ශනය.**

භූ අභ්‍යන්තර නිරීක්ෂණ රේඩාර් සමීක්ෂණ.

භූ කම්පන තරංග සමීක්ෂණ.

භූ අභ්‍යන්තරක විද්‍යුත් සන්නායක සමීක්ෂණ.

**භූ ලක්ෂණාත්මක සමීක්ෂණය.**

ඛණිජ කැණීම් ව්‍යාපෘති පරිශ්‍රයක් තෝරා ගැනීමෙන් පසු එහි භූ රුචිතාවය හඳුනා ගැනීම සඳහා සිදු කරන මිනුම් කටයුක්තක් වේ. මේ මගින් එම භූමිය තුල කැණීම් කටයුතු සිදු කල යුතු ආකාරයත් සහ එය පුනරුත්ථාපනය කල යුතු ආකාරයත් පිළිබඳව අධ්‍යනය කල හැකි වේ.

**බෑවුම් ස්ථායිකරණය සහ බිම් වැඩි දියුණු කිරීම.**

අස්ථාවර පාංශු තට්ටු වානේ දඬු සහ දැල් යොදා ස්ථාවර කිරීමේ ව්‍යාපෘතිය.

අස්ථාවර පාංශු සහ පාෂාණ වල භූස්තරයන්ට අධිපීඩනයෙන් සිමෙන්ති එන්නත් කිරීම.

රේඛියන් ආවරණ සහ කොන්ක්‍රීට් බැමි මගින් අස්ථාවර ආනත භූමි ස්ථාවර කිරීම.

අස්ථාවර වූ පාෂාණ ස්තර යකඩ ඇණ යොදා බැඳ තැබීම.

අස්ථාවර පාංශුමය ආනත තල වල මුහුණත අධිපිඩනයෙන් සිමෙන්ති ආලේපනය.

**භූ තාක්ෂණික පරීක්ෂණ.**

භූ විදුම් පරීක්ෂණ.

ඉංජිනේරු භූ විද්‍යාගාර සේවා.

**පාරිසරික අධ්‍යයන.**

පාරිසරික බලපෑම් ඇගයීම්.

මූලික පරිසර සමීක්ෂණ.

**ඛණිජ ගවේෂණය.**

ඛණිජ නිධියක කැණීම් කටයුතු ආරම්භ කිරීමට පෙර එම ඛණිජ නිධිය භූ අභ්‍යන්තරය තුල විහිදී ඇති ආකාරය හඳුනා ගැනීම සඳහ ඛණිජ ගවේශන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලැබේ.

අවගාර මඟින් පස් සාම්පල් ලබා ගැනීම.

විස්තරාත්මක භූ විද්‍යාත්මක සිතියම් සැකසීම.

ඛණිජ නිධි ප්‍රමාණ සමීක්ෂණය.

භූ භෞතික විද්‍යාත්මක සමීක්ෂණය.

**වැලි කැණීමේ ව්‍යාපෘති**

ජී එස් එම් බී ටී එස් - යක්කුරේ හන්දිය, මනම්පිටිය
ජී එස් එම් බී ටී එස් - වඩමුන හන්දිය, වැලිකන්ද
ජී එස් එම් බී ටී එස් - 503, හංසයා පාළම, අරලගන්විල
ජී එස් එම් බී ටී එස් - නිදන්වල
ජී එස් එම් බී ටී එස් - ලංකාපුර
ජී එස් එම් බී ටී එස් - බෝඅත්ත

**වැලි තොග අංගන**

ජී එස් එම් බී ටී එස් - යක්කල වැලි තොග අංගනය
ජී එස් එම් බී ටී එස් - හිඟුරක්ගොඩ
ජී එස් එම් බී ටී එස් - මිණිහිරිගම, මින්නේරිය
ජී එස් එම් බී ටී එස් - මන්ඩලගිරියගම, මැදිරිගිරිය
ජී එස් එම් බී ටී එස් - බකමූණ

## ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගමේ 2020.04.01 සිට 2020.12.31 දක්වා ප්‍රගතිය වැලි ව්‍යාපෘතීන්හී ප්‍රගතිය

| සංරචකය | අයිතමය | ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය 2020 රු. මිලියන | ඒකකය (කියුබ්) | මූලා / භෞතික | 2020.04.01 සිට 2020.12.31 දක්වා අයවැයගත මුදල | 2020.04.01 සිට 2020.12.31 දක්වා ලඟා කර ගත් මුදල | % |
|---|---|---|---|---|---|---|---|---|
| වැලි කැණීම් ව්‍යාපෘති | 1.1 | මනම්පිටිය | 938.37 | කියුබ් 308400 | මූ | 703.78 | 285.33 | 41% |
| | | | | | භෞ | 231300 | 94218 | 41% |
| | 1.2 | මනම්පිටිය II | 91.9 | කියුබ් 25200 | මූ | 68.93 | - | 0% |
| | | | | | භෞ | 18900 | 0 | 0% |
| | 1.3 | අරලගංවිල | 98.1 | කියුබ් 25200 | මූ | 73.58 | - | 0% |
| | | | | | භෞ | 18900 | 0 | 0% |
| | 1.4 | බෝ අත්ත | 126.84 | කියුබ් 23520 | මූ | 95.13 | - | 0% |
| | | | | | භෞ | 17640 | 0 | 0% |
| | 1.5 | ලංකාපුර | 5.18 | කියුබ් 2100 | මූ | 3.88 | 0.45 | 12% |
| | | | | | භෞ | 1330 | 184 | 14% |
| | 1.6 | නිදන්වල | 29.75 | කියුබ් 7800 | මූ | 22.31 | - | 0% |
| | | | | | භෞ | 5850 | 0 | 0% |
| | 1.7 | වැලිකන්ද | 62.05 | කියුබ් 22800 | මූ | 46.53 | | 0% |
| | | | | | භෞ | 17100 | 0 | 0% |
| | 1.8 | මුත්තූර් | 0 | | මූ | | 1.63 | |
| | | | | | භෞ | | 251 | |
| | 1.9 | කන්තලේ | 289.66 | කියුබ් 72000 | මූ | 217.25 | 89.64 | 41% |
| | | | | | භෞ | 54000 | 22523 | 42% |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වැලි තොග අංගන | 1.10 | 28 කණුව | 30.05 | කියුබ 5400 | මූ | 22.54 | - | 0% |
| | | | | | භෞ | 4050 | 0 | 0% |
| | 1.11 | බකමූණ | 7.76 | කියුබ 960 | මූ | 5.82 | 1.86 | 32% |
| | | | | | භෞ | 720 | 223 | 31% |
| | 1.12 | හිඟුරක්ගොඩ | 9.84 | කියුබ 2160 | මූ | 7.38 | 8.60 | 117% |
| | | | | | භෞ | 1620 | 1787.3 | 110% |
| | 1.13 | මැදිරිගිරිය | 13.12 | කියුබ 1800 | මූ | 9.84 | 8.58 | 87% |
| | | | | | භෞ | 1350 | 1139 | 84% |
| | 1.14 | මින්නේරිය | 17.27 | කියුබ 2520 | මූ | 12.95 | 7.96 | 61% |
| | | | | | භෞ | 1890 | 1013 | 54% |
| | 1.15 | යක්කල | 41.49 | කියුබ 9000 | මූ | 31.12 | 3.29 | 11% |
| | | | | | භෞ | 6750 | 676 | 10% |
| | 1.16 | නව නගරය | 0 | | මූ | | 9.95 | |
| | | | | | භෞ | | 1515 | |
| වැලි බෑග් විකිණුම් | 1.17 | යක්කල | 2.7 | 10800 50kg Bags | මූ | 2.03 | - | 0% |
| | | | | | භෞ | 8100 | 0 | 0% |
| එකතුව | | | | | මූ | **1,323.05** | **417.31** | 32% |
| | | | | | භෞ | **389500** | **123528** | 32% |

2020 අප්‍රේල් මස 01 වන දින සිට 2020 දෙසැම්බර් මස 31 වන දින දක්වා ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් ආයතනයේ වැලි ව්‍යාපෘතිය තුලින් රුපියල් මිලියන 1,323.00 ක ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කල අතර එම ව්‍යාපෘතිය තුලින් ලබා ගත හැකි වූයේ රුපියල් මිලියන 417.00 ක ආදායමක් පමණි.

## භූ විද්‍යා අංශයේ ප්‍රගතිය

| සංරචකය | අයිතමය | ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය 2020 රු. මිලියන | ඒකකය | මූල්‍ය | භෞතික | 2020.04.01 සිට 2020.12.31 දක්වා අයවැයගත මුදල | 2020.04.01 සිට 2020.12.31 දක්වා ලබා කර ගත් මුදල | % |
|---|---|---|---|---|---|---|---|---|---|
| භූ විද්‍යාත්මක ව්‍යාපෘති | 2.1 | වැලි සමීක්ෂණ | 3.93 | වාර්තා 19 | මූ | | 2.65 | 2.05 | 78% |
| | | | | | භෞ | | 13 | 20 | 154% |
| | 2.2 | පාරිසරික අධ්‍යන (EIA/ IEE) | 13 | වාර්තා 7 | මූ | | 9.75 | | 0% |
| | | | | | භෞ | | 4 | 0 | 0% |
| | 2.3 | ඛණිජ ගවේෂණ | 5 | වාර්තා 2 | මූ | | 3.75 | 0.23 | 6% |
| | | | | | භෞ | | 1 | 4 | 400% |
| | 2.4 | භූ තාක්‍ෂණික විමර්ශණ | 40 | වාර්තා 15 | මූ | | 32.00 | 2.8 | 9% |
| | | | | | භෞ | | 10 | 0 | 0% |
| | 2.5 | භූ භෞතික අධ්‍යයන | 2.5 | වාර්තා 5 | මූ | | 2.25 | | 0% |
| | | | | | භෞ | | 3 | 1 | 33% |
| | 2.6 | වෙනත් භූ විද්‍යාත්මක ව්‍යාපෘති | 1.5 | වාර්තා 8 | මූ | | 1.13 | 0.17 | 15% |
| | | | | | භෞ | | 6 | 4 | 67% |
| එකතුව | | | | | මූ | | **51.52** | **5.29** | **10%** |
| | | | | | භෞ | | **37** | **29** | **78%** |

අදාල කාල සීමාවට අනුව ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් ආයතනයේ භූ විද්‍යා අංශයෙන් රුපියල් මිලියන 52 ක ආදායමක් බලාපොරොත්තු වූ අතර එම අංශයට ලබා ගත හැකි වූයේ රුපියල් මිලියන 05 ක ආදායමකි.

# කැණීම් අංශයේ ප්‍රගතිය

| සංරචකය | අයිතමය | ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය 2020 රු. මිලියන | ඒකකය | මූ ල්‍ය | භෞ තික | 2020.04.01 සිට 2020.12.31 දක්වා අයවැයගත මුදල | 2020.04.01 සිට 2020.12.31 දක්වා ලබා කර ගත් මුදල | % |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිපිරුම් අධීක්ෂණ | **3.1** | පිපිරුම් අධීක්ෂණ | 17.4 | 960 | මූ | | 13.05 | 15.46 | 118% |
| | | | | දින | භෞ | | 36 | 38 | 106% |
| පාරිසරික බලපෑම් අධ්‍යනය සහ අධීක්ෂණ නිළධාරී සේවාවන් | **3.2** | දූලි අධීක්ෂණ | 28.09 | වාර්තා 60 | මූ | | 2.84 | 0.91 | 32% |
| | | | | | භෞ | | 45 | 6 | 13% |
| | **3.3** | ශබ්ධ පරීක්ශණ | | වාර්තා 72 | භෞ | | 54 | 36 | 67% |
| | **3.4** | කම්පන අධීක්ෂණ | | වාර්තා 48 | භෞ | | 36 | 5 | 14% |
| | **3.5** | ආර්ථික ශක්‍යතා වාර්තා | | වාර්තා 36 | මූ | | 1.94 | 0.61 | 31% |
| | | | | | භෞ | | 27 | 17 | 63% |
| | **3.6** | පිපිරුම් සමීක්ෂණ | | 2000 | මූ | | 1.58 | 5.65 | 359% |
| | | | | රැකියා | භෞ | | 450 | 1,980.00 | 440% |
| | **3.7** | GPS වාර්තා | | වාර්තා 36 | මූ | | 0.09 | - | |
| | | | | | භෞ | | 27 | 7 | 26% |
| | **3.8** | තාක්ෂණික නිළධාරී උපදේශන | | 2880 | මූ | | 13.55 | 6.78 | 50% |
| | | | | දින | භෞ | | 3,870.00 | 1,715.00 | 44% |
| | **3.9** | වෙනත් කැණීම් වාර්තා | | | භෞ | | | 0.76 | |
| **එකතුව** | | | | | භෞ | | **33.04** | **30.17** | **91%** |

2020 අප්‍රේල් මස 01 වන දින සිට 2020 දෙසැම්බර් 31 වන දින දක්වා ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් ආයතනයේ කැණීම් අංශය මගින් රුපියල් මිලියන 33 ක ආදායමක් ලබා ගැනීමට අපේක්‍ෂා කල අතර එම අංශය තුලින් ලබා ගත හැකි වූයේ රුපියල් මිලියන 30 ක ආදායමක් පමණි.



# 2.3.4 ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ්

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල 2008 අප්‍රේල් 09 වන දින සමාගම් අංක පී වී 63781 යටතේ 2007 අංක 07 දරණ සමාගම් පනතින් පිහිටුවන ලද රජය සතු සමාගමකි. පරිසර අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අප ආයතනය මගින් රාජ්‍ය හා පෞද්ගලික යන අංශයන් සඳහා තිරසර පාරිසරික ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක කරණු ලබයි. ආරම්භයේ දී ශ්‍රී ලංකා කාබන් අරමුදල යනුවෙන් ආරම්භ වුවද විවිධ පාරිසරික ව්‍යාපෘතීන් සිදු කිරමින් වඩාත් පුළුල් ආයතනයක් ලෙස 2016 ජනවාරි 29 දින සිට ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස නම් කරණ ලදී.

**නිෂ්පාදන හා සේවා**

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් තිරසාර පරිසරයක් උදෙසා වූ ව්‍යාපෘතීන් හා උපදේශන සේවාවන් ක්‍රියාත්මක කරයි.

**හරිතාගාර වායු සත්‍යාපනය**

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් ISO 14064–1 ;2018 හා ISO 14067 ; 2018 යනාදී අනුකූලතා සහතිකපත් රාජ්‍ය හා පෞද්ගලික අයතන සඳහා පිරිනමනු ලබයි. එසේ පිරිනමනු ලබන්නේ එම ආයතන විසින් ගණනය කරන ලද හරිතාගාර වායු විමෝචනය අප ආයතනය විසින් සත්‍යාපනය කිරීමෙන් අනතුරුවයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් අප ආයතනයට ඉහත සඳහන් සත්‍යාපනය ක්‍රියාවලිය සඳහා අවසර ලබා දී තිබේ. එය දේශිය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන්ද පිළිගැනීමට ලක් වේ.

**ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය (SLCCS)**

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යනු, ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස අංශයේ ඍජු අධීක්ෂණය යටතේ පරිපාලනය කරනු ලබන ජාතික හරිතාගාර වායු වැඩසටහනයි.මෙම යෝජනා ක්‍රමය මගින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුදුසුකම් ලත් කාබන් කළමණාකරන ව්‍යාපෘති ලියාපදිංචි කරන අතර අපේක්ෂිත පාර්ශ්ව සඳහා ගුණාත්මක බව තහවුරු කළ ශ්‍රී ලාංකීය සහතික කරන ලද විමෝචන අඩු කිරීම් (SCER) නිකුත් කරනු ලබයි.

**පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය (CDM)**

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය භාවිතා කිරීමට ආයෝජකයින් දිරි ගැන්වීම හා පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.

තවද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් ව්‍යාපෘති සැලසුම් ලේඛනය (PDD)" අධීක්ෂණ වාර්තාව සකස් (MR), කිරීම සහ එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය(CDM) යටතේ ව්‍යාපෘති ලියාපදිංචි කිරීම සහ සහතික කරන ලද විමෝචන අඩු කිරීම් (CER) නිකුත් කිරීම සඳහා වලංගු කිරීම හා සත්‍යාපන ක්‍රියාවලියට පහසුකම් සපයයි.

**බලශක්ති විගණනය**

මෙ යටතේ ක්ෂේත්‍රයේ විශේෂඥයින් හා තාක්ෂණික උපකරණ මගින් බලශක්ති විගණනයක් සිදු කර එය පරිසර හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කර ඒ සඳහා එම ආයතන ගත යුතු ක්‍රියාමාර්ග යෝජනා කර ඒ සඳහා දිරි ගන්වයි.

**උපදේශන සේවාවන්**

කාබන් අවම ආර්ථිකයක් ගොඩනැගීම සඳහා තීරණ ගැනීමට අවශ්‍ය මගපෙන්වීම හා නායකත්වය සපයයි. තවද ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය සඳහා උපදේශන සේවාවන් සපයයි.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් විවිධ පාරිසරික හා දේශගුණික විපර්යාසය සම්බන්ධ ව්‍යාපෘතීන් හා අරමුදල් කළමණාකරණය සිදු කරයි.

1. ගෝලීය පරිසර පහසුකම් අරමුදලෙන් ක්‍රියාත්මක කරන ලද නූතන ජෛව බලශක්ති තාක්ෂණ ව්‍යාපෘතීන්
2. හරිත ලංකා
3. ජාතික අනුහුරුවීමේ සැලසුම
4. අපේක්ෂිත ජාතික නිර්ණය කළ දායකත්වය

# ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ්

| අංකය | ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|---|
| හරිතාගාර වායු විමොචන ප්‍රකාශනයේ සත්‍යාපනය- ආයතනික මට්ටම | | |
| 01 | සිටිසන්ස් ඩිවලොප්මන්ට් මූල්‍ය ආයතනය | සම්පූර්ණ කර ඇත |
| 02 | පීපල්ස් ඉන්සුවරන්ස් පීඑල්සී | සම්පූර්ණ කර ඇත |
| 03 | තලවකැලේඑස්ටේට් පීඑල්සී | සම්පූර්ණ කර ඇත |
| හරිතාගාර වායු විමොචන ප්‍රකාශනයේ සත්‍යාපනය—නිෂ්පිදන මට්ටම | | |
| 04 | ඇමේසන් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් | 80% සම්පූර්ණ කර ඇත |
| ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය | | |
| 05 | අෂ්රොෆ් අනුස්මරණ රෝහල—කල්මුනේ | සම්පූර්ණ කර ඇත |
| ශක්‍යතා අධ්‍යන වාර්තා | | |
| 07 | වතු සමාගම් මගින පවතිවා ගෙන යනු ලබන ඉන්ධන දැව වගාවන් ශ්‍රී ලංකාවේ කාබන් ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීම සඳහා කරණු ලබන ශක්‍යතා අධ්‍යනය | 40% සම්පූර්ණ කර ඇත |
| පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය | | |
| 08 | ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය යටතේ ලියාපදිංචි කිරීම | |
| | (a) කාබන් බැර කිරීමේ කාලය අලුත් කිරීම | සම්පූර්ණ කර ඇත |
| | (b) සහතික කරන ලද විමොචන අඩු කිරීම (මුළු ගණන 74147tCO2 E) නිකුත් කිරීම සඳහා අධීක්ෂණය | |
| | බගවන්තලාව කුඩා පරිමාණ ජලවිදුලි බලාගාරය | එක්සත් ජාතින්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) වෙත අධික්ෂණ වාර්තා ඉදිරිපත් කර ඇත. |
| | මස්කෙලිය ඔය කුඩා පරිමාණ ජලවිදුලි බලාගාරය | |
| | අඹල ඔය කුඩා පරිමාණ ජලවිදුලි බලාගාරය | |
| | මොරගම ඔය කුඩා පරිමාණ ජලවිදුලි බලාගාරය | |
| | ගෝමලේ ඔය කුඩා පරිමාණ ජලවිදුලි බලාගාරය | |

## 03 පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ -එෆ්

**2020 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන**

**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

රු.

| අයවැය (වර්තමාන වර්ෂය) | | සටහන | තත්‍ය වර්තමාන වර්ෂය | තත්‍ය ඉකුත් වර්ෂය | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදාම් බදු | 1 | - | - | ඒසීඒ -1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ -1 |
| - | අන්තර්ජාතික වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ -1 |
| - | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | - | - | ඒසීඒ -1 |
| - | **මුළු ආදයම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදයම් නොවන ලැබීම්** | | - | - | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 444,774,162 | 14,967,467,841 | ඒසීඒ -3 |
| | තැන්පතු | | 37,367,360 | 126,909,499 | ඒසීඒ -4 |
| | අත්තිකාරම් ගිණුම් | | 28,869,905 | 23,060,886 | ඒසීඒ -5 |
| | වෙනත් ලැබීම් | | 22,968,019 | 47,089,098 | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **533,979,447** | **15,164,527,323** | |
| | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **533,979,447** | **15,164,527,323** | |
| | **අඩු කළා: වියදම** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | **-** | **-** | ඒසීඒ - 2(II) |
| 184,321,413 | වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 179,686,824 | 211,370,298 | ඒසීඒ - 2(II) |
| 88,433,760 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 77,767,535 | 122,277,559 | ඒසීඒ - 2(II) |
| 688,594,827 | සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 688,140,874 | 3,210,481,658 | ඒසීඒ - 2(II) |
| | පොළී ගෙවීම් | 8 | | | |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **961,350,000** | මුළු පුනරාවර්තන වියදම් (ඈ) | | **945,595,233** | **3,544,129,514** | |
| | **මූලධන වියදම්** | | | | |
| 6,357,434 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | **10** | 4,009,416 | 9,453,938 | ඒසීඒ - 2(II) |
| 3,599,566 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | **11** | 1,014,269 | 2,296,685 | ඒසීඒ - 2(II) |
| 69,183,000 | ප්‍රාග්ධන පැවරීම් | **12** | 69,182,745 | 1,963,675,859 | ඒසීඒ - 2(II) |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | | | ඒසීඒ - 2(II) |
| 723,000 | හැකියා වර්ධනය | **14** | 580,768 | 6,762,031 | |
| 241,851,105 | වෙනත් මූලධන වියදම් | **15** | 157,235,997 | 20,188,204,386 | |
| **321,714,105** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **232,023,196** | **22,170,392,899** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **50,097,581** | **174,569,345** | |
| | **තැන්පතු ගෙවීම්** | | 37,636,565 | 150,452,024 | **ඒසීඒ -4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 12,461,016 | 24,117,321 | **ඒසීඒ -5** |
| | **මුළු වියදම උ = (ඈ+ඉ+ඊ)** | | **1,227,716,010** | **25,889,091,758** | |
| **1,283,064,105** | **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **(693,736,563)** | **(10,724,564,435)** | |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ -පී

**2020 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය<br>වර්තමාන වර්ෂය<br>රු. | ඉකුත් වර්ෂය<br>රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | **ඒසීඒ -6** | 21,055,970,423 | 21,045,890,902 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | **ඒසීඒ -5/5(අ)** | 31,985,589 | 48,394,479 |
| මුදල් හා මුදල් සමාන දෑ | **ඒසීඒ -3** | 260,361 | 1,418,652 |
| **මුළු වත්කම්** | | **21,088,216,373** | **21,095,704,033** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | (1,543,874) | 14,595,811 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 21,055,970,423 | 21,045,890,902 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ -5(ආ)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | **ඒසීඒ -4** | 33,529,463 | 33,798,668 |
| අග්‍රිම ශේෂය | **ඒසීඒ -3** | 260,361 | 1,418,652 |
| **මුළු වගකීම්** | | **21,088,216,373** | **21,095,704,033** |

පිටු අංක 05 සිට 44 දැක්වෙන ඉහත ඒසීඒ 2 සිට ඒසීඒ 6 දක්වා වූ අකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 45 සිට 66 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම්කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

..............................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය : 2021/2/24
වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
පරිසර අමාත්‍යාංශය

..............................
ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :

..............................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/~~ප්‍රධාන ගණකාධිකාරී~~
නම :
දිනය : 2021/2/23
එම්. එස්. පතිරත්න
ප්‍රධාන මූල්‍ය නිලධාරී
පරිසර අමාත්‍යාංශය

## 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ඒසීඒ-සී

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | තත්‍ය | |
|---|---|---|
| | වර්තමාන වර්ෂය<br>රු. | ඉකුත් වර්ෂය<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | - |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | | |
| ලාභ | | |
| ආදයම් නොවන ලැබීම් | 9,793749 | 36,387,890 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම් | | |
| අග්‍රිම ලැබීම් | 376,822,000 | 14,089,650,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | **386,615,749** | **14,126,037,890** |
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම්:**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 314,005,345 | 344,746,100 |
| සහනාධාර සහ මාරු කිරීම් වියදම් | | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 9,428,280 | 72,696,157 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 12,400,463 | 26,776,520 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **335,834,087** | **444,218,777** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-( ආ)** | **50,781,662** | **13,681,819,113** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | | |
| ලාභාංශ | | |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | |
| උපණය අය කර ගැනීම | | |
| අත්තිකාරම් අය කර ගැනීම | 838,946 | 998,937 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **838,946** | **998,937** |
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම්:**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 140,076,871 | 14,517,730,336 |
| අත්තිකාරම් ගෙවීම් | 5,490,057 | 12,652,910 |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **145,586,928** | **14,530,383,246** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | **(144,747,982)** | **(14,529,384,309)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඈ) + (ඊ)** | **(93,966,320)** | **(847,565,196)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | | |
| ප්‍රදානයන් ලැබීම් | 67,952,162 | 877,817,841 |
| තැන්පතු ලැබීම් | 47,810,433 | 120,119,074 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **115,762,595** | **997,936,915** |
| ***<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>*** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| තැන්පතු ගෙවීම් | 11,454,177 | 149,213,428 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **11,454,177** | **149,213,428** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **104,308,418** | **848,723,486** |
| **මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)** | **10,342,099** | **1,158,291** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **1,418,652** | **260,361** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **11,760,751** | **1,418,652** |

**3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්**

**3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තු ව | අවසන් ඇස්තමේන්තු ව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
| | | | | | |

**3.7** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 961,350,000 | 961,350,000 | 945,595,233 | 98 % |
| ප්‍රාග්ධන | 320,120,000 | 321,714,105 | 232,023,196 | 72 % |

**3.8** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | | | | | |

**3.9** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 650,897,621 | 650,897,621 | | |
| 9153 | ඉඩම් | 19,391,706,213 | 19,391,706,213 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | 1,013,366,589 | 1,013,366,589 | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලොකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IEN/E/ME/01/20/21 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 මැයි 21 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
පරිසර අමාත්‍යාංශය

**පරිසර අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පරිසර අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය  මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය  ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

#### 1.6.1.1 අග්‍රිම ගිණුමේ ශේෂය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යංශයේ කළමනාකරණ සේවයේ නිලධාරියකු විසින් සිදු කර තිබූ වංචාවක් සම්බන්ධයෙන් කරන ලද විනය පරීක්ෂණයකදී ඔහුගෙන් අයවිය යුතුව තිබූ රු.260,361 ක මුදලක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් මොරගහකන්ද කළු ගඟ ජලාශ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වන, 7003-0-0-091-0-20-0 දරන අග්‍රිම ගිණුමේ වටිනාකම වූ රු.387,000 ක් 2020 දෙසැම්බර් වන විටත් භාණ්ඩාගාර ගිණුම් අනුව පරිසර අමාත්‍යාංශය යටතේම දක්වා තිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ගොඩනැංවීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දී තිබූ භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් රු.2,478,373 ක් උපයෝජනය නොකර නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය සහ පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය (ESA) සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් රු.5,850,165 ක් උපයෝජනය කර නොතිබුණි.

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 891(i) සඳහන් තොරතුරු ඇතුලත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

ප්‍රතිපාදන ඉතිරිවීම් වල මුළු වටිනාකම රු.105,445,677 ක් වී තිබූ අතර ඉන් රු.86,690,909 ක් හෙවත් සියයට 82.21 ක්ම මූලධන ප්‍රතිපාදන ඉතිරිවීම් විය. මූලධන ප්‍රතිපාදන ඉතිරිවීම් වලින් වැය විෂයයන් 02 ක් වෙනුවෙන් සලසා තිබුණු රු.2,499,566 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි. මූලධන ප්‍රතිපාදන ඉතිරිවීම්වලින් වැය විෂයන් 06 ක් වෙනුවෙන් සලසා තිබූ ප්‍රතිපාදන වලින් සියයට 50 කට වඩා වැඩියෙන් ඉතිරි වී තිබුණු අතර එහි වටිනාකම රු.63,487,596 ක් විය. අවශ්‍යතාවය හෝ ප්‍රමුඛතාවය නිවැරදිව තක්සේරු කිරීමකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් මෙසේ සියයට 50 කට වඩා වැඩි ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2020 දෙසැම්බර් 31 දිනට පරිසර අමාත්‍යාංශය විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුමේ සටහන (III) හි බැඳීම් හා බැරකම් ප්‍රකාශයට අනුව ශීර්ෂ අංක 1002 සහ 1101 යටතේ නිලධාරීන් 03 දෙනෙකු වෙත ගෙවිය යුතු අතිකාල හා නිවාඩු දින වැටුප් සහ ගමන් වියදම් (දේශීය) සඳහා ගෙවිය යුතු රු. 21,620 ක බැරකම් සටහන් කර නොතිබුණි.

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 (1) | අලාභහානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සිදු කල යුතු වුවත් 2020 නොවැම්බර් 16 දින සිදුවූ වාහන අනතුරකට අදාලව විගණිත දිනය වන 2021 අප්‍රේල් 05 වන දින වන විටත් අලාභය ගණනය කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104 (1) (4) | හානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2021 අප්‍රේල් 05 වන දින වන විටත් අමාත්‍යාංශය සතු වාහනයක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2017 දෙසැම්බර් 31 දිනැති අංක 2/2017 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2018 ජූනි 30 දිනට පෙර රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කළ යුතු බව අවධාරණය කර තිබුණද පරිසර අමාත්‍යාංශය භාවිතා කරන වාහන 03 ක් අමාත්‍යාංශය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාවට බලපානු ලබන දේශගුණික විපර්යාසයන් අවම කිරීමේ එක් උපාය මාර්ගයක් ලෙස දේශගුණික සුහුරු ගම්මාන පිහිට වීමේ සැලැසුම් සකස් කිරීමේ නියමු ව්‍යාපෘතියක් කොරියන් පරිසර ආයතනයේ තාක්ෂණික සහාය ඇතිව පරිසර අමාත්‍යාංශයේ මගින් ආරම්භ කර තිබුණි. කාලගුණික විපර්යාස මගින් සිදුවන බලපෑම පිළිබඳව එක් එක් පලාත් පාලන ආයතන මගින් ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු විශ්ලේෂණය කිරීම මගින් දේශගුණික සුහුරු ගම්මාන ව්‍යාපෘතිය සඳහා කුරුණෑගල නගරය ආශ්‍රිත වර්ග කිලෝමීටර් 11ක ප්‍රදේශය තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් විය.

(i) 2019 වර්ෂයේදී සුහුරු දේශගුණික විපර්යාස නගර ව්‍යාපෘතිය සඳහා සුදුසු සුහුරු නගර තෝරා ගැනීමේදී පරිසර අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේදී නිකුත් කර තිබූ කාලගුණික විපර්යාස සඳහා වූ අවදානම් දත්ත පොත (climate change vulnerability data book) භාවිතා කර තිබූ අතර අන්තර්ගත දත්ත වර්ෂ 08 ට වඩා පැරණි බව නිරීක්ෂණය විය. මේ අනුව වඩා සුදුසු සුහුරු නගරය තෝරා ගැනීමේදී යාවත්කාලීන වූ දත්තයන් භාවිතා කර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය මූලික වශයෙන් තාක්ෂණික සහාය ලබාදෙනු ලබන ව්‍යාපෘතියක් වන අතර කොරියානු රජයේ සහාය ඇතිව Climate Technology Centre and Network (CTCN) ආයතනය මගින් මේ සඳහා තාක්ෂණික සහාය ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය අනුගත වීමේ (Adaptation) හා අවම කිරීමේ (mitigation) යන අධියර 02 කින් සමන්විත විය. මෙම අධියර යටතේ හරිතාගාර වායු දූෂණය අවම කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම සිදු කරනු ලබයි. මාස 12 ක් සඳහා වූ මෙම ව්‍යාපෘතියේ කටයුතු ඇරඹීම සඳහා 2020 ජූලි 14 හා 2020 ජූනි 30 යන දිනයන්හි අමාත්‍යාංශය හා අදාල පාර්ශවයන් අතර ගිවිසුමක් අත්සන් කර තිබුණ ද පැවැති වසංගත තත්ත්වය නිසා ගිවිසගත් කාලසීමාව ඇතුලත අදාල කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.

### 3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශබ්ද දූෂණය පාලනය සම්බන්ධයෙන් දැනට පවතින රෙගුලාසි සංශෝධනය කර නව රෙගුලාසි හඳුන්වාදීමටත් බහුවිධ වාහන නලා මෙරටට ගෙන්වීම තහනම් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග විගණිත දින විටත් ගෙන නොතිබුණි.

(ආ) දේශගුණික විපර්යාසය මගින් මෙරටට ඇතිවීමට ඇති අහිතකර බලපෑම් අවම කිරීම සඳහා දේශගුණික විපර්යාස බලපෑම් සඳහා අනුහුරුවීමේ ජාතික සැලැස්ම 2016 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමටත් ඒ සඳහා ජාතික අනුවර්තික අරමුදලක් පිහිටුවීම සැලසුම් කර තිබුණත් රුපියල් මිලියන 3,335 ක ඇස්තමේන්තුවක් සහිත ඉහත සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට යෝජිත ජාතික අනුවර්තිත අරමුදල විගණිත දින වන විටත් පිහිටුවා නොතිබුණි.

### 3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

හානිකර ආක්‍රමණශීලී ශාක හා සත්ව විශේෂ මෙරටට පැමිණීම වැලැක්වීම හා එම ශාක හා සතුන් විනාශ කිරීම සඳහා නව පනතක් කෙටුම්පත් කිරීමේ යෝජනාව 2009 වර්ෂයේදී පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබුණි. එම යෝජනාව 2009 ජනවාරි 22 දින අමප/09/0047/359/001 මගින් අනුමත කර තිබුණද විගණිත දිනය දක්වා නව පනතක් ස්ථාපිත වී නොතිබුණි.

### 3.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල ණය ගිවිසුම් අංක SRI – 21 යටතේ ක්‍රියාත්මක වූ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය වෙනුවෙන් විගණිත දිනය වන විට දරා ඇති වියදම රු.මිලියන 466 ක් වූ අතර එම ව්‍යාපෘතිය 2020 ඔක්තෝබර් 31 දින සිට අතර මැද නවතා දැමීම සිදුකර තිබුණි.

### 3.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

මව් කිරිවල ශරීරයට අහිතකර වන "dioxin – like" (DL) ප්‍රමාණයක් අඩංගු වී තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා 2019 අගෝස්තු 07 වන දින මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ ශ්‍රී ලාංකිය මව්වරුන්ගේ මව්කිරිවල Polychlorinated Biphenyls (PCBS), Polychlorinated dibenzo – P dioxins (PCDDS) සහ Dibenzofurans (PCDFS) යන සියල්ල එකට ගත් විට dioxins අඩංගු වී තිබේද යන්න පරීක්ෂා කිරීම වේ. මෙම ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක මුදලක් වැය කිරීමට එකඟ වී ඇතත්, 2021 අප්‍රේල් 09 දින වන විට අවස්ථා දෙකකදී රු.600,000 මුදලක් පමණක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

i. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 45 (xv) වගන්තිය හා 34 (3) වගන්තිය ප්‍රකාරව විශ්ව විද්‍යාලය වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීට පාලක සභාවේ අනුමැතිය මත උප කුලපතිවරයාට පමණක් බලය ලබාදී ඇතත්, එම නියමන්ට අනුගත නොවී මෙම ව්‍යාපෘතිය සම්බන්ධ ගිවිසුමට පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් අත්සන් තබා තිබුණි.

ii 2019 දෙසැම්බර් 19 දින පැවැත්වූ 15 වන මෙහෙයුම් කමිටු රැස්වීමේදී (Steering Committee) මව්කිරි ලබාගත යුත්තේ පැස්සුම් ආයතනවල (Welding plait) වල සේවයේ නියුතු නිලධාරීන්ගේ පවුල්වලින් සහ ප්‍රථම දරු උපතින් සති දෙකක් ඇතුළත ලබාගත් මව්කිරි සාම්පල් භාවිතයෙහි වුවද, 2020 මාර්තු වන විට නියැදි ලබාගත යුතු බවට දක්වා තිබුණද 2021 අප්‍රේල් 09 දින වන විටත් මේ සම්බන්ධව කටයුතු කර නොතිබුණි.

iii. මව්කිරි නියැදි එකතු කිරීමේ සැලැස්ම, රටේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි තෝරාගත් ප්‍රදේශ වලින් නියැදි ලබා ගැනීම, නියැදි සැකසීම, පරීක්ෂා කිරීම සඳහා සාම්පල් චීනයට යැවීම පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් ගිවිසුම අත්සන් කළ අවස්ථාවේ සිට ක්‍රියාත්මක කළ යුතු වේ. මේ අනුව 2020 ජුනි 30 දින වන විට මෙම ව්‍යාපෘතිය අවසන් විය යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කර තිබුණද විගණිත දින වන විටත් මේ සම්බන්ධයෙන් ක්‍රියා කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පරිගණක උපාංග අයිතම 63 ක් හා ෆැක්ස් යන්ත්‍ර 03ක අතිරික්තයක් පවතින බවට හඳුනාගෙන වාර්තා කර තිබුණද ඊට අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ මට්ටමේ තනතුරු වල පුරප්පාඩු සංඛ්‍යාව 18 ක් විය. තනතුරු මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට 62 ක් ඉහළ කළමනාකරණයේ ලෙස නිරූපණය වීම තුලින් අමාත්‍යාංශයේ මෙහෙයුම් කාර්යසාධනය සඳහා සෘජුවම බලපා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 02 හා එම සේවයේම II හා III ශ්‍රේණි සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව 03 වශයෙන් මුළු අනුමත ප්‍රමාණය තනතුරු 05 ක් වූ අතර එම තනතුරු 05 ම පුරප්පාඩුව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශයේ ද්විතීක මට්ටමේ තනතුරක් වූ සංවර්ධන නිලධාරී තනතුරු අතිරික්ත සංඛ්‍යාව 05 ක් බව නිරීක්ෂණය විය.

(ඈ) 2019 වර්ෂය තුලදී මෙන්ම සමාලෝචිත වර්ෂය තුලදීද කාර්මික නිලධාරී (විදුලි) හා කාර්මික නිලධාරි (ජල හා ගොඩනැගිලි) යන අනුමත තනතුරු දෙකද පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය.

ඩී.වී.චන්ද්‍රලතා
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## 04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| දේශගුණික විපර්යාස බලපෑම් අවම කිරීම | | ✓ | |
| පරිසර පද්ධතිය සහ ජෛව විවිධත්ව තිරසාර සංරක්ෂණය | | ✓ | |
| තිරසාර පරිසර දූෂණය පාලනය හා අපද්‍රව්‍ය කළමනාකරණය | | ✓ | |

## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්ක /අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50-74% | 75% - 100% |
| 12 | 12.1 12.5 | තිරසර නිෂ්පාදනය සහ පාරිභෝජනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය සහ එම ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම. | | | **100** |
| | 12.4 | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය හා ඒ සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබාගැනීම | | | **100** |
| | 12.5 | රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු ආරම්භ කිරීම. | | **60** | |
| | 12.5 | ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම ආරම්භ කිරීම. | | | **80 pl 100 et** |
| | 12.6 | හරිත වාර්තාකරණය පිළිබඳව සමාගම් දැනුවත් කිරීමේ වැඩසටහන් ඇරඹීම | | **70** | |
| | 12.7 | හරිත ප්‍රසම්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම. | | | **80** |
| | 12.8 | හරිත ගම්මාන ස්ථාපිත කිරිමට අදාළ මාර්ගොපදේශ පද්ධතිය සකස්කිරීම. | | | **100** |
| 13 | 13.2 | දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික අනුහුරුවීමේ සැලසුම සකස්කිරිම. | | | * |
| | 13.2 | දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික අනුහුරුවීමේ සැලසුම ක්‍රියාත්මක කිරිම | * | | |
| | 13.2 | දේශගුණික අනුහුරුවීම් සඳහා හරිත දේශගුණ අරමුදලට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම. | | | * |
| | 13.2 | දේශගුණ අනුහුරුවීම් සදහා හරිත දේශගුණ අරමුදලට ඉදිරිපත් කල ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම. | | * | |
| | 13.2 | හරිතාගාර වායු විමෝචනයන් ගණනය කිරීම සදහා දත්ත හුවමාරු පද්ධතියක් ස්ථාපනය කිරීම. | | * | |
| | 13.3 | පළාත් 09යේ අදාළ ආයතන දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික අනුහුරුවීමේ සැලසුම පිළිබඳ දැනුවත් කිරිම | | | * |
| | 13.3 | දේශගුණික විපර්යාස පිළිබඳ පළාත් අනුහරුවීමේ සැලසුම් සකස්කිරීම ආරම්භ කිරීම | * | | |
| | 13.3 | දේශගුණික විපර්යාස පිළිබඳ පළාත් ඒකක ස්ථාපිත කිරීම ආරම්භ කිරීම | * | | |
| | 13.3 | ජාතික අනුහුරුවීමේ සැලසුම ක්‍රියාත්මක කිරීම සදහා අදාළ ආයතන සුදානම් කිරීමේ ව්‍යාපෘතියට හරිත දේශගුණ අරමුදලෙන් අනුමැතිය ලබා ගැනිම. | | | * |
| | 13.3 | ජාතික අනුහුරුවීමේ සැලසුම ක්‍රියාත්මක කිරීම සදහා අදාළ ආයතන සුදානම් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. | * | | |
| 14 | 14.5 /15.5 | කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබද වූ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම | | | * |
| 15 | 15.3 | භූමි හායනය වැලැක්වීමට අදාළ ක්‍රයාකාරි සැලසුම සකස්කරීම | | | * |
| | 15.3 | ශ්‍රී ලංකාවට අදාළව භූමි හායනය උදාසීන කිරීමේ ඉලක්ක සකස්කිරීම | | | * |
| | 15.3 | තිරසාර භූමි කළමනාකරන වැඩසටහන් ආරම්භකිරීම | | * | |
| | 15.5 | විශේෂ පිළිබද රතුදත්ත ලේඛණය යාවත්කාලීන කිරීම | | * | |
| | 15.6 | ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදා ගැනීම පිළිබද ජාතික ප්‍රතිපත්තිය සැකසීම හා ක්‍රියාත්මක යාන්ත්‍රණය සැකසීම. | | | * |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.**

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 68 | 51 | 17 |
| තෘතීයික | 11 | 11 | - |
| ද්විතියික | 115 | 111 | 04 |
| ප්‍රාථමික | 61 | 53 | 08 |
| වෙනත් (තාවකාලික) | 03 | 02 | 01 |

### 06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

යම් ආයතනයක් සතු සම්පත්වලින් ආයතනයේ කාර්ය සාධනය උදෙසා වඩාත්ම වැදගත් සාධකය වනුයේ මානව සම්පත වේ. ඒ අනුව පරිසර අමාත්‍යාංශයේ සමස්ත මානව සම්පත එක් එක් අංශවල මානව සම්පත් අවශ්‍යතාවය පරිදි ස්ථානගත කර ඇත.

මානව සම්පත අංශවලට බෙදා වෙන් කර ඇති ආකාරය අනුව එම නිලධාරීන්ගේ කාර්ය සාධනය අමාත්‍යාංශයේ සමස්ත කාර්යසාධනයට බලපානු ලබයි. එක් එක් අංශවල මාණ්ඩලික නිලධාරීන් මගින් අදාළ අනෙකුත් නිලධාරීන්ගේ කාර්ය සාධනය මැන බලන අතර ඒ අනුව නිලධාරීන්ට ලබා දී ඇති රාජකාරී ලැයිස්තු හා වැඩ පියවර ලිඛිතව ලබා දී ඇත.ඒ අනුව පවත්නා සීමිත මානව සම්පත හැකි උපරිමයෙන් ආයතනයේ කාර්ය සාධනය උදෙසා ලබා ගෙන ඇත.

2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ නිලධාරීන් සේවා මුර ක්‍රමයට කැඳවීමට සිදු වූ අතර එහිදී නිවසේ සිට රාජකාරී කිරීමේ ක්‍රමවේදය වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම මගින් පරිසර අමාත්‍යාංශයේ අරමුණු ලගා කර ගැනීමට උපරිම උත්සාහයක් දරණ ලදී.

අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා නිරන්තරයෙන් ඔවුන්ගේ පුහුණු අවශ්‍යතාවය හඳුනා ගනු ලබන අතර ඒ අනුව ලබා දෙන පුහුණුව තුළින් සමස්ත කාර්ය සාධනය ඉහළ යනු ඇත. තවද කාර්ය සාධනය මැන බැලීම තුළින්, නිලධාරීන් ඇගැයීම, ප්‍රශංසා කිරීම වැනි කටයුතු හරහා අනෙකුත් නිලධාරීන් අභිප්‍රේරණය වීම සිදු වන අතර එමගින් ආයතනයේ ඉලක්කයන් නියමිත කාල රාමුව තුළ හැකි උපරිමයට ලගා කර ගැනීමට පිටුබලයක් ලැබුණි. නිලධාරීන්ට යම්කිසි කාලයකට පසුව වෙනත් අංශවල රාජකාරී කටයුතු කිරීමට අවස්ථාව ලබා දීම තුළින් ඔවුන්ට විවිධ විෂයයන් ඉගෙන ගැනීමට හැකියාව ලැබී ඇත.

ඉහත පරිදි පරිසර අමාත්‍යාංශයේ මානව සම්පත විධිමත් පරිදි කළමණාකරනය කර ගැනීම තුළින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට හැකි වී ඇත.

**06.3** මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 2nd Meeting of the Open - Ended Working Group on the Post - 2020 Global Biodiversity Framework | 1 | 2020.02.24 -2020.03.04 | | 139787.54 | විදේශීය | |
| Asian Training of Trainers Workshop for Biosafety Clearing House National Focal Points (BCH NFPs) | 1 | 2020.02.05-2020.02.07 | | 29978.40 | විදේශීය | |
| Invitation for the JCM All-Partner Country Workshop | 2 | 2020.02.25-2020.02.26 | | 74655.20 | විදේශීය | |
| Workshop on Climate Finance Mobilization and Access Strategy for the Island States in the Indian Ocean | 1 | 2020.03.04-2020.03.05 | | 22644.56 | විදේශීය | |
| WEBINAR on "Waste Management in post COVID - 19 scenario in SACEP member countries" | 2 | 2020.07.02 | | | Webinar | |
| The 13th Regional EST Forum in Asia | 3 | 2020.09.10 – 2020.09.11 | | | Virtual Meeting | |
| The Online course on understanding sea Level: Data Analysis and Applications | 1 | 2020.10.12 -2020.10.14 | | | Online Course | |
| The combined twelfth meeting of the Conference of the Parties to the Vienna Convention (Part I) and the Thirty-Second Meeting of the Parties to the Montreal Protocol | 5 | 2020.11.23-2020.11.27 | | | Online Meeting | |
| Consultation on Circular Economy (Online) | 1 | 2020 November | | | Online Meeting | |
| UN Virtual Workshop on the Handbook on Carbon Taxation | 2 | 2020.11.30-2020.12.01 | | | Virtual Workshop | |
| World Island Networks Virtual Meeting (Asia/Pacific) | 3 | 1st December 2020 | | | Virtual Meeting | |
| The Second Extraordinary meeting of the conference of the parties to the convention on biological diversity | 3 | 2020.11.16-2020.11.19 | | | Online | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Invitation to the virtual training on the existing MRV arrangements and the enhanced transparency framework | 2 | 2020.10.13-2020.10.15 | | | Virtual Training | |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

1. ආයතනයේ නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් / ධාරිතා වර්ධන වැඩසටහන් හරහා දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමෙන් ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
2. නව තාක්‍ෂණික ක්‍රමවේදයන් මානව සම්පත හරහා ආයතනයට අවශෝෂණය කර ගැනීම තුළින් ආයතනික ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කරගැනීමට හැකිවීම හා වඩා ඵලදායි සේවාවක් ලබාදීමට හැකිවීම.
3. ආයතනයේ විධායක හා කළමණාකරණ මට්ටම හා පහළ ශ්‍රේණිවල නිලධාරීන් අතර මනා සන්නිවේදන ක්‍රමවේදයක් ඇතිකිරීම මඟින් ඔවුන් අතර සුහදතාවය වර්ධනය වන නිසා, ඇතිවන ගැටළුකාරී තත්ත්ව සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට හැකිවීමෙන් ආයතනයේ ඵලදායීතාව ඉහළ නැංවීම.
4. ආයතනික දැක්ම, මෙහෙවර සහ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය නිපුණතා වලින් හෙබි මානව සම්පත වර්ධනය කර ගත හැකිවීම.

## 07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නැත. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නැත. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නැත. | | |
| 1.6 | වෙනත් | අදාල නැත. | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල නොවේ. | භාණ්ඩාගාරය ප්‍රසම්පාදනයන් සීමා කර තිබීම. | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | I. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලින් ප්‍රමාද වී ඇති අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා ගැනීමට සිහිකැඳවීම් ලිපි යොමු කිරීම.<br>ii. සෑම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමකදීම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමේ ප්‍රගතිය පසුවිපරම් කිරීම | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | Covid -19 තත්ත්වය මත කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පවත්වා ඇත. | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| | වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ. | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ. | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාල නොවේ. | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අදාල නොවේ. | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ. | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | මානව සම්පත් සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කරගැනීමට අපේක්ෂා කෙරේ |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ. | | |

**අවසානය.**